# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## දූෂණ විරෝධී

**දූෂණයට එරෙහි සහ වෙනත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මතයන්, ප්‍රමිති සහ ප්‍රශස්ත පරිචයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ නිශ්චිත විධිවිධාන බලාත්මක කිරීම සඳහා ද; වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ අල්ලස්, දූෂණ සහ වැරදි පිළිබඳ චෝදනා සහ ආශ්‍රිත වැරදි අනාවරණය සහ විමර්ශනය කිරීමට, සහ වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ අල්ලස්, දූෂණ වැරදි සහ ආශ්‍රිත වැරදි සඳහා නඩු පැවරීමට විධාන කිරීමට සහ නඩු පැවරීමට ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; දූෂණ ක්‍රියා වැළැක්වීම ප්‍රවර්ධනය ඉහළ නැංවීම සඳහා ද; දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීම සහ මහජනතාව අතර දැනුවත් බව ඉහළ නැංවීම සඳහා ද; (26 වන අධිකාරය වූ) අල්ලස් පනත, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත පරිච්ඡින්න කිරීමට සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2023 අප්‍රේල් මස 27 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 අප්‍රේල් මස 03 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[175 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 260.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# දූෂණ විරෝධී

එල්.ඩී.–ඕ. 61/2018

**දූෂණයට එරෙහි සහ වෙනත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මතයන්, ප්‍රමිති සහ ප්‍රශස්ත පරිචයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ නිශ්චිත විධිවිධාන බලාත්මක කිරීම සඳහා ද; වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ අල්ලස්, දූෂණ සහ වැරදි පිළිබඳ චෝදනා සහ ආශ්‍රිත වැරදි අනාවරණය සහ විමර්ශනය කිරීමට, සහ වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළ අල්ලස්, දූෂණ වැරදි සහ ආශ්‍රිත වැරදි සඳහා නඩු පැවරීමට විධාන කිරීමට සහ නඩු පැවරීමට ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; දූෂණ ක්‍රියා වැළැක්වීම ප්‍රවර්ධනය ඉහළ නැංවීම සඳහා ද; දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීම සහ මහජනතාව අතර දැනුවත් බව ඉහළ නැංවීම සඳහා ද; (26 වන අධිකාරය වූ) අල්ලස් පනත, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත පරිච්ඡින්න කිරීමට සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. (1) මේ පනත 2023 අංක දරන දූෂණ විරෝධී පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තිය හැර මේ පනතේ සෙසු විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් නම් කරනු ලැබිය හැකි දිනයක හෝ දිනවල සිට ක්‍රියාත්මකභාවයට පත් විය යුතු ය.

(3) මේ පනතේ විවිධ කොටස් හෝ මේ පනතේ විවිධ කොටස්වල විවිධ වගන්ති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් විවිධ දින නම් කරනු ලැබිය හැකි ය:

කෙසේ වුව ද, මේ පනතේ සියලු විධිවිධාන, මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට වසරකට නොවැඩි කාලයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාර මේ පනතට අදාළව කථානායකවරයාගේ සහතිකය සටහන් කරන ලද දිනයේ සිට මේ වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය.

මේ පනතේ පරමාර්ථ

**2.** (1) මේ පනතේ පරමාර්ථ වනුයේ:-

(අ) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුබසාධනයේ සාධාරණ අවශ්‍යතා සපුරාලීම පිණිස අල්ලස් හා දූෂණ වැළැක්වීම සහ තුරන් කිරීම;

(ආ) පාලනයේ විනිවිදභාවය වර්ධනය කිරීම;

(ඇ) පාලනයේ අවංකභාවය ශක්තිමත් කිරීම සහ වගකිව යුතු බව වැඩි කිරීම;

(ඈ) ආණ්ඩුව පිළිබඳ මහජන විශ්වාසය වර්ධනය කිරීම සහ දූෂණය තුරන් කිරීම සඳහා වන මහජන සහභාගීත්වය ශක්තිමත් කිරීම;

(ඉ) මේ පනත යටතේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීමට හා ඉටු කිරීමට සහ මේ පනත යටතේ එය මත පනවා ඇති වගකීම් ඉටු කිරීම සඳහා ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවීම;

(ඊ) අල්ලස්, දූෂණ, වත්කම් සහ බැරකම් ප්‍රකාශවලට අදාළව වැරදි සහ ආශ්‍රිත වැරදි පිළිබඳ මූලික පරීක්ෂණ සහ විමර්ශන කටයුතු සිදු කිරීමට සහ ඒවාට එරෙහිව නඩු පැවරීමට ඉහත කී කොමිෂන් සභාවට නියෝග කිරීම;

(උ) අල්ලස් හා දූෂණ වැළැක්වීම පිළිබඳ අධ්‍යාපනික ක්‍රියාකාරකම් පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම;

(ඌ) රාජ්‍ය නිලධරයන් අයථා ආකාරයට ධනවත් වීම වැළැක්වීම පිණිස වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම සඳහා සඵලදායී කාර්ය ක්‍රමයක් හඳුන්වා දීම;

(එ) අල්ලස් හා දූෂණ වැළැක්වීමේ අන්තර්-නියෝජිත සහයෝගීතාව සහ ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම; සහ

(ඒ) දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වන, දූෂණය වැළැක්වීමට අදාළ වෙනත් යම් ජාත්‍යන්තර සම්මුතියක් යටතේ වගකීම් බලාත්මක කිරීම සහ ශ්‍රී ලංකාව තුළ අවංකභාවයෙන් යුත් සංස්කෘතියක් ස්ථාපිත කිරීම පිණිස ජාත්‍යන්තර ප්‍රමිති සහ යහපත්ම වූ පරිචයන් හඳුනාගැනීම.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා, "පාලනය" යන්නට, රාජ්‍ය පාලනයේ දී වගකිව යුතු බව, විනිවිදභාවය, ප්‍රතිචාරශීලීත්වය, නීතියේ ආධිපත්‍ය, ස්ථාවරත්වය සහ සිවිල් සමාජ සහභාගීත්වය තහවුරු කිරීම සඳහා සැලසුම් කරන ලද පද්ධති සහ ක්‍රියාවලි ඇතුළත් වේ.

I වන කොටස

**I වන පරිච්ඡේදය**

*කොමිෂන් සභාව පිහිටුවීම*

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව පිහිටුවීම

**3.** (1) මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යනුවෙන් කියනු ලබන සහ හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය මගින් ඒ වෙත පවරා තිබෙන නමින් සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද, එයට එරෙහිව ද නඩු පැවරීමට හා පවරනු ලැබීමට හැකියාව ඇත්තේ ය.

(3) මේ පනතේ පරමාර්ථ ඉටු කරගැනීම සඳහා සහ බලතල ක්‍රියාත්මක කිරීම ද කාර්යයන් කිරීම ද, මේ පනත යටතේ ඒ වෙත පවරා ඇති වගකීම් ඉටු කිරීම ද සඳහා මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති බලතල කොමිෂන් සභාව වෙත තිබිය යුතු ය.

කොමිෂන් සභාවේ සංයුතිය

**4.** (1) කොමිෂන් සභාව විශිෂ්ට, කීර්තිමත් සහ පහත සඳහන් ක්ෂේත්‍ර අතරින් එකක් හෝ කිහිපයක් පිළිබඳ අවම වශයෙන් වසර විස්සක පළපුරුද්දක් සහිත තැනැත්තන් අතරින් ව්‍යවස්ථාදායක මණ්ඩලයේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු යː-

(අ) නීතිය; සහ

(ආ) පහත සඳහන් ක්ෂේත්‍රයන් එකක් හෝ කිහිපයක්,

එනම්ː-

(i) වෝහාරික විගණනය;

(ii) වෝහාරික ගිණුම්කරණය;

(iii) ඉංජිනේරු විද්‍යාව;

(iv) ජාත්‍යන්තර සම්බන්ධතා සහ රාජ්‍යතාන්ත්‍රික සේවා;

(v) මහජන කටයුතු කළමනාකරණය; හෝ

(vi) රාජ්‍ය පරිපාලනය.

(2) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු මː-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;

(ආ) කොමිෂන් සභාවට පත් කරනු ලබන දිනය වන විට වයස අවුරුදු හැට දෙකට වඩා නොවැඩි විය යුතු ය;

(ඇ) ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය;

(ඈ) දක්ෂ, අවංක, ඉහළ ආධ්‍යාත්මික ගුණයක් සහ කීර්ති නාමයක් සහිත විය යුතු ය;

(ඉ) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට පෙර වෙනත් සියලු පාරිශ්‍රමික ලබන ධුරයන් අත්හරිනු ලැබ තිබිය යුතු යः

කෙසේ වුව ද, යම් පාරිශ්‍රමිකයක් ලබන ධුරයක් දරන තැනැත්තකු, කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් ධුරය භාරගැනීමට පෙරාතුව එකී තැනැත්තා විසින් පාරිශ්‍රමික ලබන සියලු ධුර අත්හරිනු ලබන්නේ නම්, එවැනි තැනැත්තකු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කිරීම සඳහා සලකා බලනු ලැබිය හැකි ය.

(ඊ) කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටින අතරතුර දී යම් ව්‍යාපාර කටයුත්තක නිරත වීම හෝ යම් වෘත්තියක නියැලීම සිදු නොකළ යුතු ය; සහ

(උ) එවැනි සාමාජිකයකු වශයෙන් ධුරය භාර ගැනීමට පෙරාතුව පවත්නා ලිඛිත නීතියට අනුව ස්වකීය වත්කම් හා බැරකම් ප්‍රකාශය ව්‍යවස්ථාදායක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින්, කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන් එක් අයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයකු වීම සඳහා වූ නුසුදුසුකම්

5. යම් තැනැත්තකු-

(අ) දඩ මුදලකින් පමණක් දඬුවම් ලබන වරදකට හැර වෙනත් යම් අපරාධ වරදකට වරදකරු වී ඇත්නම්;

(ආ) නිසි අධිකරණ බලය සහිත අධිකරණයක් විසින් බුන්වත් තැනැත්තකු බවට තීන්දු කර ඇත්නම්;

(ඇ) මානසික වශයෙන් දුබල නම් හෝ එසේ මානසික වශයෙන් දුබල බවට පත් වේ නම් හෝ මේ පනත යටතේ වූ ස්වකීය කාර්ය ඉටු කිරීමට නොහැකිව සිටියි නම්;

(ඇ) එකී තැනැත්තාගේ රාජකාරීන්ට අදාළ ව බරපතළ විෂමාචාරයකට වරදකරුවකුව ඇත්නම්;

(ඉ) මේ පනතේ විධිවිධාන යටතේ ස්වකීය වගකීම්වලට අනුකූලව ක්‍රියාකිරීමට අසමත් වන්නේ නම්;

(ඊ) යම් දේශපාලන ධුරයක් දරන නියෝජිතයකු හෝ ඒ සඳහා තෝරාගත් නියෝජිතයකු වේ නම්; හෝ

(උ) අදාළ තත්කාලීන නීති යටතේ පවත්වනු ලබන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ මැතිවරණ, පාර්ලිමේන්තු මහමැතිවරණ, පළාත් සභා ඡන්ද විමසීම් හෝ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වල කාර්ය සඳහා පිළිගනු ලැබ ඇති යම් දේශපාලන පක්ෂයක යම් තනතුරක් හෝ සාමාජිකත්වයක් දරන හෝ දරනු ලැබ ඇත්නම්,

එවැනි තැනැත්තකු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කිරීම සඳහා හෝ එසේ සාමාජිකයකු ලෙස අඛණ්ඩව ක්‍රියා කිරීම සඳහා නුසුදුසු විය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම

**6.** (1) ඔප්පු කළ විෂමාචාරය හෝ ස්ථිර ස්වභාවයේ ශාරීරික, මානසික හෝ වෙනත් නොහැකියාවක් යන හේතු පිළිබඳව පාර්ලිමේන්තුව වෙත යොමු කිරීමෙන් පසුව (නොපැමිණි මන්ත්‍රීන් ද ඇතුළු) පාර්ලිමේන්තුවේ සමස්ත මන්ත්‍රීවරුන්ගෙන් බහුතරයක් විසින් සභාය දක්වන ලද යෝජනා සම්මතයක් මත පාර්ලිමේන්තුව අමතා ජනාධිපතිවරයා විසින් කරනු ලබන නියෝගයක් මගින් හැර, කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුතු යː

එසේ වුව ද, එවැනි යෝජනා සම්මතයක් පිළිබඳ නිවේදනය පාර්ලිමේන්තුවේ සමස්ත මන්ත්‍රීවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් අත්සන් කර ඇත්නම් මිස සහ චෝදිත විෂමාචාරය හෝ අශක්නුතාවය පිළිබඳ සම්පූර්ණ විස්තරය එහි නිශ්චිතව දක්වා ඇත්නම් මිස, එවැනි ඇමතීමක් ඉදිරිපත් කිරීම සඳහා වන යෝජනා සම්මතයක් කථානායකවරයා විසින් භාරගැනීම හෝ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට යොමු කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාවේ (3) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති, ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවරයකු ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සහ සම්මත කර ගැනීම සඳහා වන කාර්ය පටිපාටිය අවශ්‍ය වෙනස් කිරීම් සහිතව කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සහ සම්මත කර ගැනීම සඳහා සියලු ආකාරයෙන් අදාළ කරගත යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයකු ධුරයෙන් ඉල්ලා අස්වීම

**7.** (1) තත්කාර්ය සඳහා ජනාධිපතිවරයා වෙත යොමු කරන ලද ලිපියක් මගින් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක දී, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගැනීමෙන් පසුව බලාත්මක විය යුතු ය.

(2) එවැනි සාමාජිකයකුගේ ඉල්ලා අස්වීමෙන් සති දෙකක කාලසීමාවක් ඇතුළත එසේ ඉල්ලා අස් වූ සාමාජිකයා වෙනුවට ව්‍යවස්ථාදායක මණ්ඩලයේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් අලුත් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය

**8.** (1) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් කලින් ධුරය අතහරින්නේ නම් මිස වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, නැවත පත් කරනු ලැබීම සඳහා යෝග්‍ය නොවිය යුතු යඃ

කෙසේ වුව ද, මේ පනතේ විධිවිධාන යටතේ පළමු කොමිෂන් සභාවට පත් කරනු ලබන සාමාජිකයන් පත්වීම ලද දිනයේ සිට පහත ආකාරයට ධූර දරනු ලැබිය යුතු යඃ-

(අ) සභාපතිවරයා විසින් වසර පහක කාලසීමාවක් සඳහා ධුරය දරනු ලැබිය යුතු ය;

(ආ) සභාපතිවරයා හැර වෙනත් එක් කොමසාරිස්වරයකු වසර හතරක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු ය; සහ

(ඇ) ඉතිරි කොමසාරිස්වරයා වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු ය.

(2) ධුර කාලය සම්පූර්ණ වීමේ දී ධුරය අත්හරිනු ලබන කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, තමා වෙනුවට අලුත් සාමාජිකයකු පත් කරනු ලබන තෙක් අඛණ්ඩව තමන්ගේ එකී සාමාජික තත්ත්වයෙන් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**9.** කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකඃ-

(අ) පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර සාමාජිකයන්ගේ ධුර කාලය තුළ දී අඩු කරනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් යම් සම්බන්ධතා හෙළිදරව් කළ යුතු බව

**10.** (1) කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින්, එලෙස සාමාජිකයකු වශයෙන් ධුරය භාරගැනීමට පෙරාතුව එකී පත්වීම් දිනය වන විට ස්වකීය සම්බන්ධතා පිළිබඳව පොදු හෙළිදරව් කිරීමක් ව්‍යවස්ථාදායක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) කොමිෂන් සභාව ඉදිරියේ විභාග කිරීමට ගෙන ඇති යම් කාරණාවක් සමඟ ඍජුව හෝ වක්‍රව යම් සම්බන්ධතාවක් දක්වනු ලබන කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු විසින් එම සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳ කොමිෂන් සභාව වෙත හෙළිදරව් කරනු ලැබිය යුතු අතර එකී කාරණාව සම්බන්ධ කොමිෂන් සභාවේ විචාරය හෝ තීරණය ලබාදීමේ දී එකී සාමාජිකයා එයට සහභාගී නොවිය යුතු ය.

පුරප්පාඩුවක් ඇති වීම හේතුවෙන් කිසිදු ක්‍රියාවක් බලරහිත නොවිය යුතු බව

11. සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීම හේතුවෙන් පමණක් කොමිෂන් සභාවේ කිසිදු ක්‍රියාවක්, තීරණයක් හෝ නඩු කටයුත්තක් බලරහිත නොවිය යුතු ය.

කොමිෂන් සභාවේ මුද්‍රාව

**12.** (1) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ භාරයේ තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු සහ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපිට දී හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා පැමිණ නොසිටීමේ දී, කොමිෂන් සභාවේ යම් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට කොමිෂන් සභාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර ඔවුන් තමන් පැමිණ සිටින බවට සාධකයක් වශයෙන් එම සාධන පත්‍රය අත්සන් කරනු ලැබිය යුතු ය.

**කොමිෂන් සභාව පාර්ලිමේන්තුව වෙත පිළිතුරු ලබා දීමට බැඳි සිටිය යුතු බව**

**13.** කොමිෂන් සභාව විසින්, 158 වන වගන්තියේ විධිවිධාන යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත වගකිව යුතු සහ පිළිතුරු ලබා දීමට බැඳී සිටිය යුතු අතර, මේ පනතේ 159 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, එක් එක් ලිත් වර්ෂයේ ස්වකීය කටයුතුවලට අදාළ වාර්තා එකී වර්ෂය තුළ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**කොමිෂන් සභාවේ ගණපූරණය**

**14.** (1) 41 වන වගන්තිය සහ 65 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමට සහ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය ගණපූරණය සාමාජිකයන් දෙදෙනකු විය යුතු ය.

(2) 41 වන වගන්තිය සහ 65 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති බලතල සහ කර්තව්‍ය හැර, මේ පනත යටතේ යම් බලතලයක් ක්‍රියාත්මක කිරීමට හෝ යම් කර්තව්‍යයක් ඉටු කිරීමට කොමිෂන් සභාවට අවශ්‍ය ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

**චර්යා සංග්‍රහය**

**15.** (1) කොමිෂන් සභාවේ සාමාජිකයන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය කොමිෂන් සභාවේ චර්යා සංග්‍රහයට යටත් විය යුතු ය. චර්යා සංග්‍රහය නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(2) එකී සංග්‍රහයේ යම් විධිවිධානයක් හෝ විධිවිධාන කඩකරනු ලැබ ඇති බවට අනාවරණය වූ, කොමිෂන් සභාවේ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ 27 වන වගන්තිය යටතේ සේවා නියුක්තව සිටින වෙනත් යම් තැනැත්තකු මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලබන කාර්ය පටිපාටියට යටත් විය යුතු ය.

**කොමිෂන් සභාවේ වගකීම්**

**16.** (1) රීති අවධාරණය කරමින් සහ ඒ සම්බන්ධයෙන් උචිත අධ්‍යාපනයක් හෝ පුහුණුව ලබාදීම මගින් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ ධුරයන්ට අදාළව එම කාර්ය මණ්ඩලය විසින් දූෂණ ක්‍රියා සිදු කිරීම වැළැක්වීම සඳහා කොමිෂන් සභාව විසින් සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් අනිසි පරිපාලන කටයුතුවලට මැදිහත් වීමට හෝ චර්යා සංග්‍රහයට අනන්‍යාකාරයකින් අනනුකූල වන නීති විරෝධී, අයෝග්‍ය හෝ සදාචාර විරෝධී ආකාරයට ක්‍රියා කිරීමට ඍජුව හෝ වක්‍රව බලපෑම් කරනු ලබන කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ සේවකයකු හෝ පනතේ 27 වන වගන්තිය යටතේ සේවා නියුක්තව සිටින වෙනත් යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටියට අනුව ඒ සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලබන කිසිදු තැනැත්තකු වෙත කිසිදු අගතියක් සිදු නොවන බවට කොමිෂන් සභාව විසින් සහතික විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, දූෂණය වැළැක්වීමේ දී සහ දූෂණයට එරෙහිව සටන් කිරීමේ දී දූෂණයේ පැවැත්ම, ඊට හේතු සහ එහි බැරෑරුම් බව සහ දූෂණය මගින් එල්ල වන තර්ජන සම්බන්ධයෙන් වන මහජන දැනුවත්භාවය ඉහළ නැංවීමට සිවිල් සමාජය, රාජ්‍ය නොවන සහ ප්‍රජා පාදක සංවිධානවල ක්‍රියාකාරී සහභාගීත්වය ප්‍රවර්ධනය කළ යුතු ය.

## II වන පරිච්ඡේදය

## කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය

**අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම**

**17.** (1) ජනාධිපතිවරයා විසින්, ව්‍යවස්ථාදායක මණ්ඩලයේ නිර්දේශය මත, මේ පනත යටතේ පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සහ කර්තව්‍ය කිරීම සඳහා කොමිෂන් සභාව වෙත (මේ පනතේ මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එකී පත්වීම් දිනය වන විට ස්වකීය සම්බන්ධතා පිළිබඳ පොදු හෙළිදරව් කිරීමක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ධුරය භාරගැනීමට පෙරාතුව, එකී පත්වීම් දිනය වන විට ව්‍යවස්ථාදායක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව ඉදිරියේ ගනු ලැබීම සඳහා වන යම් කාරණයක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාට යම් ඍජු හෝ වක්‍ර සම්බන්ධතාවක් ඇති විටෙක, ඔහු විසින් එකී සම්බන්ධතාවයේ ස්වභාවය කොමිෂන් සභාවට හෙළිදරව් කරනු ලැබිය යුතු අතර කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයෙන් තීරණය කරනු ලබන්නේ නම් මිස, ඒ කාරණය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගනු ලබන විධාරණයකට හෝ තීරණයකට ඔහු සහභාගී නොවිය යුතු ය:

එසේ වුව ද, කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ විධානය මත අධිචෝදනා පත්‍ර අත්සන් කිරීම සඳහා වූ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වගකීම සඳහා මෙය බාධාවක් නොවිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල සහ කාර්ය

**18.** අධ්‍යක්ෂ ජනරාල්වරයා-

(අ) කොමිෂන් සභාවේ විධානය මත අධිචෝදනා පත්‍රයක් හෝ චෝදනා පත්‍රයක් මත අපරාධ නඩු කටයුතු පැවරිය යුතු ය;

(ආ) කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා වන්නේ ය;

(ඇ) කොමිෂන් සභාවේ ප්‍රධාන ගිණුම් නිලධරයා වන්නේ ය; සහ

(ඈ) මේ පනතේ සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කාර්ය සහ කර්තව්‍ය කිරීම සහ ඉටුකිරීම කරනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබීම සඳහා වන සුදුසුකම් සහ නුසුදුසුකම්

**19.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලබන යම් තැනැත්තකු:-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;

(ආ) ශාරීරික වශයෙන් සහ මානසික වශයෙන් යෝග්‍ය තැනැත්තකු විය යුතු ය;

(ඇ) අපරාධ නඩු කටයුතු පැවැත්වීමේ අවම වශයෙන් වසර විස්සක පළපුරුද්ද සහිත නීතිඥවරයකු විය යුතු ය;

(ඈ) පත්වීමේ දිනය වන විට වයස අවුරුදු පනස් පහකට වැඩි නොවිය යුතු ය;

(ඉ) දක්ෂ, ඉහළ අධ්‍යාත්මික තත්ත්වයක් ඇති කීර්තිමත් තැනැත්තකු විය යුතු ය;

(ඊ) අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ධුරය භාරගැනීමට පෙරාතුව පාරිශ්‍රමික ලබන වෙනත් සියලු ධුරවලින් ඉවත් විය යුතු යඃ

කෙසේ වුව ද, පාරිශ්‍රමික ලබන ධුරයක් දරන යම් තැනැත්තකු අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ධුරය භාරගැනීමට පෙරාතුව පාරිශ්‍රමික ලබන සියලු ධුරවලින් ඉවත් වන්නේ නම්, එවැනි තැනැත්තකු අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබීම සඳහා සලකා බලනු ලැබිය හැකි ය; සහ

(උ) අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබීමට පෙරාතුව තත්කාලයේ බලපවත්නා නීතිය යටතේ ස්වකීය වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශ කරනු ලැබ තිබිය යුතු යඃ

කෙසේ වුව ද, (ඊ) ඡේදයේ සඳහන් විධිවිධාන මගින්, ද්විතීයනය මත රාජ්‍ය සේවයේ නියුතු යම් රාජ්‍ය සේවකයකු අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබීම වළක්වනු නොලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු-

(අ) දඩ මුදලකින් පමණක් දඬුවම් ලබන වරදක් හැර, යම් අපරාධ වරදක් සඳහා වරදකරු වී ඇත්නම්;

(ආ) නිසි අධිකරණ බලය සහිත අධිකරණයක් විසින් බුන්වත් තැනැත්තකු වශයෙන් තීන්දු කරනු ලැබ ඇත්නම්;

(ඇ) මානසික වශයෙන් දුබල නම් හෝ එසේ මානසික වශයෙන් දුබල බවට පත් වේ නම් හෝ මේ පනත යටතේ වූ ස්වකීය කාර්ය ඉටු කිරීමට නොහැකිව සිටියි නම්;

(ඈ) එම තැනැත්තාගේ කාර්ය සම්බන්ධයෙන් බරපතළ විෂමාචාරය සඳහා වරදකරුවකු වේ නම්;

(ඉ) මේ පනතේ විධිවිධාන යටතේ වූ ස්වකීය බැඳීම් සමඟ අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරී නම්;

(ඊ) යම් දේශපාලන ධුරයක් දරන නියෝජිතයකු හෝ ඒ සඳහා තෝරාගත් නියෝජිතයකු වේ නම්; හෝ

(උ) ඒ සඳහා අදාළ වන්නා වූ නීතිවල විධිවිධාන යටතේ පවත්වනු ලබන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ මැතිවරණ, පාර්ලිමේන්තු මහමැතිවරණ, පළාත් සභා ඡන්ද විමසීම් හෝ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වල කාර්ය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක යම් තනතුරක් හෝ සාමාජිකත්වයක් දරන හෝ දරනු ලැබ ඇත්නම්,

එවැනි යම් තැනැත්තකු අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබීම සඳහා හෝ එසේ අඛණ්ඩව ක්‍රියා කිරීම සඳහා නුසුදුස්සකු විය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉල්ලා අස්වීම

**20.** තත්කාර්ය සඳහා ජනාධිපතිවරයා අමතන ලිපියක් මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉවත් කිරීම

**21.** අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබාදීමෙන් පසුව හෝ නියෝජිතයකු මගින් තමා වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීමෙන් පසුව, ජනාධිපතිවරයා විසින් තත්කාර්ය සම්බන්ධයෙන් හේතු දක්වමින් සහ ව්‍යවස්ථාදායක මණ්ඩලයේ අනුමතය සහිතව අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා මිය යෑම, ධුරයෙන් ඉවත් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම

**22.** අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂ ජනරාල්වරයා මිය යෑම, ධුරයෙන් ඉවත් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් අධ්‍යක්ෂ ජනරාල් ධුරය පුරප්පාඩු වන අවස්ථාවක දී, පනතේ 17 වන වගන්තියේ සඳහන් විධිවිධාන පිළිබඳ සැලකිල්ලට ගෙන, එලෙස පුරප්පාඩු වී මාස තුනක කාලසීමාවක් ඇතුළත ජනාධිපතිවරයා විසින් අලුත් අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුර කාලය

**23.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා මිය යෑම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් කලින් ස්වකීය ධුරය අත්හරිනු ලබන්නේ නම් මිස, අවුරුදු පහක කාලසීමාවක් සඳහා ධුර දරනු ලැබිය යුතු අතර නැවත පත් කරනු ලැබීම සඳහා යෝග්‍ය නොවන්නේ ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුර කාලය අවසන් වීමෙන් පසුව ධුරය අත්හැරීමේ දී, අලුත් අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලබන තෙක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ස්වකීය තත්ත්වයෙන් අඛණ්ඩව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමික

**24.** අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමිකය පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර කොමිෂන් සභාව වෙත පවතින ඔහුගේ සේවා කාලය තුළ දී එම පාරිශ්‍රමික අඩු කරනු නොලැබිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලතල පවරා දෙනු ලැබිය හැකි බව

**25.** (1) මේ වගන්තිය මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරන ලද පැවරීමේ බලතලය සහ 18 වන වගන්තියේ (අ) සහ (ඇ) ඡේද යටතේ වන බලතල සහ කාර්යය හැර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ යම් බලතලක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් මේ පනතේ විධිවිධාන යටතේ කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද වෙනත් යම් නිසි බලධරයකු වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවරනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාලනය සහ අධීක්ෂණයට යටත්ව, එවැනි යම් නිලධරයකු විසින් එම බලතල ක්‍රියාත්මක කිරීම හෝ එවැනි කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මිය යෑම, ධුරයෙන් ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුරයෙන් පහ කිරීම හේතුවෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, පනතේ 22 වන වගන්තිය යටතේ එම පුරප්පාඩුව ඇති වී මාස තුනක කාලයක් ඇතුළත අලුත් පත් කිරීමක් සිදු කරනු ලබන තෙක් කොමිෂන්

සභාව විමසා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවට සහාය දැක්වීම පිණිස පත් කරනු ලබන වෙනත් යම් නිසි නිලධරයකු වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරා දෙනු ලැබිය යුතු ය.

**කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවානියුක්තයන්**

**26.** (1) කොමිෂන් සභාවේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය බවට සලකන යම් නිලධරයන් සහ සේවානියුක්තයන් මේ පනත යටතේ සාදන ලද රීතින්ට යටත් ව, කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) මුදල් විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයා විමසා පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන යම් ආකාරයට සහ යම් අනුප්‍රමාණ යටතේ, (1) වන වගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන් සහ සේවානියුක්තයන් සඳහා පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු මෙන්ම ඔවුන් එසේ අනුමත කරනු ලබන යම් සේවා කොන්දේසිවලට යටත් විය යුතු අතර එම පාරිශ්‍රමික ඒකාබද්ධ අරමුදලින් අයකර ගනු ලැබිය යුතු ය.

(3) 27 වන වගන්තිය යටතේ සේවා නියුක්තව සිටින තැනැත්තන් සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි එවැනි ආකාරයට, එවැනි අනුප්‍රමාණ යටතේ සහ එවැනි සේවා කොන්දේසිවලට යටත්ව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, පාරිශ්‍රමිකය කොමිෂන් සභාවේ අරමුදලින් අයකර ගත යුතු ය.

(4) කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ සංස්ථාපනය කරන ලද පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් නිලධරයකු හෝ එම සාමාජිකයාගේ හෝ නිලධරයාගේ සහ අවස්ථාවෝචිත පරිදි, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 3 වන වගන්තිය මගින් පිහිටුවන ලද පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ, එකඟත්වය ඇතිව සහ කොමිෂන් සභාවේ එවැනිම එකඟත්වය ඇතිව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් සහ

පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ එම පළාත් පාලන ආයතනය විසින් එකඟ විය හැකි විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් ඇතුළු යම් නියම හා කොන්දේසි මත කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු විසින් එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මෙන්ම එවැනි නිලධරයකු පත් කිරීමේ අධිකාරියේ එකඟත්වය ඇතිව සහ කොමිෂන් සභාවේ එවැනිම එකඟත්වය ඇතිව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, එම නිලධරයා සඳහා සහ ඔහු සම්බන්ධයෙන් 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභාව පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කර ගනු ලැබිය යුතු ය.

(7) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී, එම නිලධරයා සඳහා සහ ඔහු සම්බන්ධයෙන් 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභාව පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(8) කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු එම නිලධරයාගේ හෝ සේවානියුක්තයාගේ මෙන්ම එම සංස්ථාවේ පාලන මණ්ඩලයේ එකඟත්වය ඇතිව සහ කොමිෂන් සභාවේ එවැනිම එකඟත්වය ඇතිව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් කොමිෂන් සභාව විසින් සහ එම සංස්ථාවේ පාලන මණ්ඩලය විසින් එකඟ

විය හැකි විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් ඇතුළු යම් නියම හා කොන්දේසි මත කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(9) කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 30 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් සාමාජිකයකු එම සාමාජිකයාගේ එකඟත්වය ඇතිව සහ කොමිෂන් සභාවේ එවැනිම කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් කොමිෂන් සභාව විසින් සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 29 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික විගණන කාර්යාලය විසින් එකඟ විය හැකි විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ඇතුළු යම් නියම හා කොන්දේසි මත කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාව වෙත වෙනත් තැනැත්තන්ගේ සේවය ලබාගත හැකි බව

**27.** කොමිෂන් සභාව විසින්, එහි බලතල සහ කර්තව්‍ය නිසි හා කාර්යක්ෂම ලෙස කාර්යසාධනය කිරීම සඳහා අවශ්‍ය යැයි සැලකෙන අවස්ථාවල දී ස්ථාවර කාලීන ගිවිසුම් මත එවැනි නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ සේවාව ලබා ගනු ලැබිය හැකි වේ.

කාර්යසාධනය සඳහා ඇතුළත් වීමට පෙරාතුව ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු බව

**28.** (1) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ යම් සේවානියුක්තයකු හෝ 27 වන වගන්තිය යටතේ සේවා ලබා ගනු ලැබ සිටින වෙනත් යම් තැනැත්තකු විසින්, මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා හෝ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා මේ පනත යටතේ යම් විධිවිධානයක් සාදනු ලැබ ඇති අවස්ථාවක දී මිස, මේ පනත යටතේ වූ ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී තමාට ලැබුණු හෝ තමා විසින් දැනුවත් වූ යම් තොරතුරු හෙළිදරව් කරනු නොලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ සෑම නිලධරයකු හෝ සේවානියුක්තයකු ම හෝ 27 වන වගන්තිය යටතේ සේවා ලබා ගනු ලැබ සිටින වෙනත් යම්

තැනැත්තකු ම, තමා ස්වකීය ධුරයේ කාර්ය සඳහා ඇතුළත් වීමට පෙරාතුව, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා හැර, මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී තමා වෙත ලැබුණු හෝ තමා විසින් දැනුවත් වූ කිසිදු තොරතුරක් හෙළිදරව් නොකරන බවට ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ 5 වන වගන්තියේ (1) උපවගන්තියේ විධිවිධානවලට යටත් ව සහ කොමිෂන් සභාවේ අවසරය ඇතිව, පොදු මහජන යහපත වෙනුවෙන් අවශ්‍ය බවට කොමිෂන් සභාව විසින් සලකන යම් තොරතුරු, මහජනතාව කෙරෙහි වූ කොමිෂන් සභාවේ වූ විනිවිදභාවය සහ වගකීම පිළිබඳ කාර්ය සඳහා මුද්‍රණාලයක, මාධ්‍යයේ හෝ සමාජ මාධ්‍යයේ පළ කිරීමේ කාර්ය සඳහා හෙළිදරව් කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් ආදීන් රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**29.** (1) කොමිෂන් සභාවේ සාමාජිකයන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා, නිලධරයන් සහ සේවානියුක්තයන් සහ 27 වන වගන්තිය යටතේ සේවා ලබා ගනු ලැබ සිටින වෙනත් යම් තැනැත්තකු (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනත යටතේ පවත්වනු ලබන සෑම විමර්ශනයක් ම (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය පනතේ අර්ථානුකූලව අධිකරණ කටයුත්තක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ සෑම නිලධරයකු ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු කටයුතුවලින් ආරක්ෂාව

**30.** (1) කොමිෂන් සභාවේ සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා, යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ 27 වන වගන්තිය යටතේ සේවා ලබා ගනු ලැබ සිටින වෙනත් යම් තැනැත්තකු හෝ යම් ආකාරයකින් කොමිෂන් සභාවට සහාය දක්වන වෙනත් යම් තැනැත්තකු තම කාර්ය ඉටු කිරීමේ දී සද්භාවයෙන් සිදු කරන ලද හෝ සිදු නොකරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අපහාසයක්

හැර, කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ වෙනත් යම් නිලධරයකුට හෝ සේවානියුක්තයකුට හෝ 27 වන වගන්තිය යටතේ සේවා ලබා ගනු ලැබ සිටින වෙනත් යම් තැනැත්තකු හෝ යම් ආකාරයකින් කොමිෂන් සභාවට සහාය දක්වන වෙනත් යම් තැනැත්තකුට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අපහාස කිරීම හෝ මේ පනත යටතේ වූ යම් වරදක් හෝ (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය යටතේ වූ යම් වරදක් පිළිබඳ යම් අධිකරණයක් ඉදිරියේ පවතින නඩු කටයුතුවල කාර්ය සඳහා අවශ්‍ය වන ආකාරයට හැර, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පවත්වන ලද යම් විමර්ශනයක් සිදු කිරීමේ දී කොමිෂන් සභාව වෙත ලැබුණු යම් ලේඛනයක් අධිකරණයක දී ඉදිරිපත් කරන ලෙස හෝ එසේ කොමිෂන් සභාව වෙත නිවේදනය වූ යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයක් වෙත හෙළිදරව් කරන ලෙස කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ වෙනත් යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු වෙත හෝ 27 වන වගන්තිය යටතේ සේවා නියුක්තව සිටින වෙනත් යම් තැනැත්තකු වෙත නියම කරනු නොලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් වාර්තාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට එරෙහිව හෝ එම වාර්තාවේ සාරානුකූල සත්‍ය කරුණු පිළිබඳ යම් තැනැත්තකු විසින් සිදු කළ යම් පළ කිරීමක් සම්බන්ධයෙන් වෙනත් යම් තැනැත්තකුට එරෙහිව කිසිම අධිකරණයක කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

## III වන පරිච්ඡේදය

## මුදල්

ජාතික අයවැයෙහි ඇතුළත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් වාර්ෂික අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කරනු ලැබිය යුතු බව

**31.** (1) (අ) මුදල් විෂයය පවරනු ලැබ ඇත්තා වූ අමාත්‍යවරයා විසින්, නිශ්චිතව දක්වනු ලබන යම් කාලසීමාවක් ඇතුළත කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කරනු ලැබිය යුතු ය.

(ආ) එකී මුදල් විෂයය පවරනු ලැබ ඇත්තා වූ අමාත්‍යවරයා සහ කොමිෂන් සභාව විමසා එකී ඇස්තමේන්තු, කථානායකවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් දිනයක කථානායකවරයා

වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. මුදල් විෂයය පවරනු ලැබ ඇත්තා වූ අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සමඟ සමාලෝචනය සඳහා කථානායකවරයා විසින් එම ඇස්තමේන්තු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර කථානායකවරයාගෙන් එම වාර්ෂික අයවැය ඇස්තමේන්තු ලැබීමේ දින සිට වැඩ කරන දින දහයක් ඇතුළත එකී අමාත්‍යවරයා විසින් කථානායකවරයා වෙත ස්වකීය නිරීක්ෂණ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු සමාලෝචනය කිරීමෙන් පසුව, පාර්ලිමේන්තුව විසින් යෝග්‍ය බවට තීරණය කරන යම් වෙනස් කිරීම් ඇත්නම් එම වෙනස් කිරීම් ද සමඟ ජාතික අයවැය ලේඛනයේ අන්තර්ගත කිරීම සඳහා එම ඇස්තමේන්තු මුදල් විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව සහ (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ජාතික හෝ මහජන අභිවෘද්ධියට අහිතකර බලපෑමක් එල්ල කරනු ලබන යම් වරදක් පිළිබඳ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන පරීක්ෂණ සහ විමර්ශන සඳහා අරමුදල් පවතින බව පාර්ලිමේන්තුව විසින් සහතික කළ යුතු ය.

කෙසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන යටතේ පාර්ලිමේන්තුව වෙත සිදු කරන යම් හෙළිදරව් කිරීමක් 28 වන වගන්තියේ සඳහන් විධිවිධානවලට අගති විරහිතව විය යුතු ය.

(3) කොමිෂන් සභාවට එහිම අරමුදලක් තිබිය යුත්තේ ය.

(4) පහත සඳහන් මුදල් අරමුදල වෙත ගෙවනු ලැබිය යුතු ය-

(අ) කොමිෂන් සභාවේ භාවිතය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ;

(ආ) මුදල් විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි යම් මූලාශ්‍රයකින් පරිත්‍යාග, ත්‍යාග, රික්තවරණ හෝ ප්‍රදාන වශයෙන් කොමිෂන් සභාව වෙත ලැබෙන සියලු මුදල් ප්‍රමාණ;

(ඇ) මේ පනතේ 90 වන වගන්තිය යටතේ පරිපාලනමය දඩ මුදල් වශයෙන් ගෙවිය යුතු බවට නියම කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ;

(ඈ) මේ පනතේ 131 වන වගන්තියේ විධිවිධාන යටතේ අරමුදල වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු බවට නියම කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ; සහ

(ඉ) මේ පනත ප්‍රකාරව කොමිෂන් සභාව වෙත ලැබෙන හෝ කොමිෂන් සභාව විසින් සතු කරගනු ලබන දේපළ විකිණීම් මගින් ලැබෙන සියලු මුදල් ප්‍රමාණ.

(5) කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී කොමිෂන් සභාවට උපචිත වන්නා වූ වියදම් පියවා ගැනීමට අවශ්‍ය වන සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

## IV වන පරිච්ඡේදය

### කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය

කොමිෂන් සභාවේ නිලධරයන් ආදීන්ගේ පත්වීම්, උසස්වීම් ආදිය

**32.** (1) කොමිෂන් සභාවේ නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ පත්වීම්, උසස් වීම් සහ ඔවුන් විෂයෙහි විනය පාලනය කොමිෂන් සභාව සතු විය යුතු මෙන්ම තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින්, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන ආකාරයට කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් සම්බන්ධයෙන්, ඔවුන්ගේ පත්වීම්, උසස් වීම්, පාරිශ්‍රමික, විනය පාලනය, චර්යාව සහ නිවාඩු ප්‍රදානය කිරීම ඇතුළුව ඔවුන් සම්බන්ධයෙන් කරමින් රීති සාදනු ලැබිය යුතු ය.

(3) යුක්තිය පසිඳලීම සඳහා කොමිෂන් සභාව විසින් යෝග්‍ය යැයි සලකන අවස්ථාවක දී, කොමිෂන් සභාවේ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු සම්බන්ධ විනය පරීක්ෂණයක්, තත්කාර්ය සඳහා පවත්වන ලද පරීක්ෂණයකින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සඳහා එය වෙත යොමු කරනු ලැබිය හැකි ය.

වත්කම් හා බැරකම් ප්‍රකාශ පිළිබඳ මධ්‍යම අධිකාරිය

**33.** මේ පනතේ II වන කොටස යටතේ වූ වත්කම් හා බැරකම් ප්‍රකාශ පිළිබඳ මධ්‍යම අධිකාරිය වශයෙන් කොමිෂන් සභාව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

ජාත්‍යන්තර සම්මුති, ගිවිසුම්, බැඳීම් ආදිය ක්‍රියාත්මක කිරීම

**34.** (1) ශ්‍රී ලංකාව විසින් දූෂණය වැළැක්වීම සඳහා භාරගනු ලැබ ඇත්තා වූ දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ වෙනත් ජාත්‍යන්තර බැඳීම් බලාත්මක කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වන දූෂණය වැළැක්වීම සම්බන්ධ වෙනත් යම් ජාත්‍යන්තර සම්මුතියක් බලාත්මක කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ නිසි බලධරයා විය යුතු ය.

කොමිෂන් සභාව විසින් දූෂිත චර්යා පිළිබඳ මහජන දැනුවත්භාවය ඉහළ නැංවිය යුතු බව

**35.** කොමිෂන් සභාව විසින් දූෂිත චර්යාවල අහිතකර බලපෑම් පිළිබඳ මහජනතාව දැනුවත් කර එම තොරතුරු මහජනතාව වෙත ප්‍රචාරණය කර එවැනි දූෂිත චර්යාවලට එරෙහිව සටන් කිරීමේ දී මහජන සහාය ලබා ගැනීම සහ පිළිගැනීම සඳහා අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය.

දූෂණ විරෝධී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම

**36.** කොමිෂන් සභාව වෙත ආණ්ඩුවේ එලදායී, දූෂණ විරෝධී ප්‍රතිපත්ති සහ පරිචයන් ක්‍රියාත්මක වීම පිළිබඳව නියාමනය සහ සම්බන්ධීකරණය කිරීම සඳහා බලතල හිමිවිය යුතු ය.

දූෂණ ක්‍රියා අනාවරණය කර ගැනීම සඳහා නීති ආදිය පරීක්ෂා කිරීම

**37.** කොමිෂන් සභාව විසින් ස්වකීය අදහස අනුව දූෂණයට ආනුෂංගික විය හැකි යම් දූෂණ ක්‍රියා සහ ක්‍රමවේද හෝ කාර්ය පටිපාටි අනාවරණය කර ගැනීමේ අරමුණින් යුතුව යම් රාජ්‍ය ආයතනයක නීති, පරිචයන් සහ කාර්ය පටිපාටි පරීක්ෂා කර බලනු ලැබිය යුතු ය.

රාජ්‍ය ආයතන වෙත උපදෙස් ලබා දීම සහ සහාය ලබා දීම

**38.** කොමිෂන් සභාවට දූෂණ ක්‍රියා මුලිනුපුටා දැමීම සිදු කරනු ලැබිය හැකි ක්‍රම සහ ආකාර පිළිබඳව මෙන්ම රාජ්‍ය පරිපාලනයේ ඉහළ තත්ත්වය සහ කීර්ති නාමය ප්‍රවර්ධනය කරනු ලැබිය හැකි ආකාරය පිළිබඳව යම් රාජ්‍ය ආයතනයක් වෙත උපදෙස් ලබා දීම සහ සහාය දැක්වීම සඳහා බලය තිබිය යුතු ය.

දූෂණය ආදී ක්‍රියා අවම කිරීම සඳහා නීති ප්‍රතිශෝධනය කිරීමට රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම

**39.** කොමිෂන් සභාව විසින් දූෂණය අවම කිරීම සඳහා අවශ්‍ය බවට එය විසින් සලකනු ලබන අනාගත නීති ප්‍රතිසංස්කරණ පිළිබඳව සහ ජාත්‍යන්තර දූෂණ විරෝධී සාධන පත්‍ර අනුගමනය කිරීම සහ ඒවා පිළිගැනීම ද සඳහා රජය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

දූෂණය වැළැක්වීමේ පියවර සහ එහි කර්තව්‍ය විධිමත් ලෙස සිදු කිරීම ආදිය

**40.** කොමිෂන් සභාව විසින් මේ පනතේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහාඃ-

(අ) නීතියේ ආධිපත්‍ය පිළිබඳ මූලිකාංග, රාජ්‍ය කටයුතු සහ පොදු දේපළ නිසි ලෙස කළමනාකරණය කිරීම, අවංකභාවය, විනිවිදභාවය සහ වගකීම පිළිබඳ මූලිකාංග ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සැලැස්වීම සඳහා යම් රාජ්‍ය අධිකාරීන් සමඟ සහයෝගීව ක්‍රියා කිරීම;

(ආ) තාර්කික සහ සම්බන්ධීකාරක දූෂණ විරෝධී ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම පිණිස අදාළ ආයතනික, නෛතික සහ පරිපාටිය විධිවිධාන අධීක්ෂණය කිරීම සඳහා රජය සමඟ සහයෝගීව ක්‍රියා කිරීම;

(ඇ) දූෂණ ක්‍රියා සිදුවීමේ ප්‍රවනතාවය අඩුකිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය බවට සලකන යම් දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය ආයතනවල කාර්ය ඵලදායී ලෙස ඉටුකිරීම සමඟ අනුරූප වන පරිචයන් හෝ කාර්ය පටිපාටි වෙනස් කිරීමෙහි ලා රජයේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය ආයතන ප්‍රධානීන්ට උපදෙස් ලබා දීම ;

(ඈ) රාජ්‍ය ආයතන විසින් එවැනි දූෂණ විරෝධී පියවර ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම සහ එවැනි රාජ්‍ය ආයතන විසින් එකී පියවර ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය එයට වාර්තා කරන ලෙස ඉල්ලා සිටිනු ලැබීම;

(ඉ) දූෂණය මුලිනුපුටා දැමීම සඳහා, වැළැක්වීමේ ක්‍රමෝපාය හෝ පියවර පිළිබඳ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන වෙත උපදෙස්, මාර්ගෝපදේශ සහ අදහස් ලබා දීම;

(ඊ) යම් තැනැත්තකු විසින් දූෂණය තුරන් කරනු ලැබිය හැකි මාර්ග පිළිබඳ එවැනි යම් තැනැත්තකු වෙත උපදෙස් ලබා දීම, අදහස් ලබා දීම සහ සහාය ලබා දීම;

(ඌ) යහපත් වාණිජ පරිචයන් ප්‍රවර්ධනය කිරීම පිණිස යහපත් ව්‍යාපාරික හැසිරීම් පැවැත්වීම සඳහා පෞද්ගලික අංශය විසින් තදින් අනුගමනය කළ යුතු චර්යා සංග්‍රහයක් හඳුන්වා දීම;

(ඍ) රජයේ සහ පෞද්ගලික ආස්ථිත්‍යයන් අතර ගිවිසුම් සබඳතාවල දී දූෂණය වැළැක්වීමට පියවර ගැනීම; සහ

(එ) දූෂණයට එරෙහිව මහජනතාවගේ සහාය ලබා ගැනීම සහ වර්ධනය කර ගැනීම සඳහා පියවර ගැනීම,

කරනු ලැබිය හැකි ය.

විමර්ශන

**41.** කොමිෂන් සභාව විසින්, මේ පනතේ විධිවිධාන යටතේ එයට දෙන ලද යම් තොරතුරක් හෝ පැමිණිල්ලක ඇතුළත් යම් චෝදනාවක් හෝ 42 වන වගන්තිය යටතේ එයට ලැබුණු යම් දෙයක් සම්බන්ධයෙන්, එකී චෝදනාව හෝ දෙය පහත සඳහන් කිසිවක් සිදු කිරීම, එනම්:-

(අ) මේ පනතේ 'අ' උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් වරදක් හැර, මේ පනත යටතේ වූ යම් වරදක්;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ වූ වරදක් සමඟින් 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණ පනතේ අර්ථානුකූලව ඒ තුළට ගැනෙන නීති විරෝධි ක්‍රියාවක් එම ගනුදෙනුවේදී ම සිදුවන අවස්ථාවක දී, එම පනත යටතේ වූ යම් වරදක්;

(ඇ) මේ පනතේ 'අ' උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් වරදක් මේ පනත ප්‍රකාර වරදක් සංයුක්ත වන්නා වූ ක්‍රියාවක් සමඟ එකම ගනුදෙනුවක දී සිදු කොට ඇති විටෙක, එවැනි යම් වරදක්;

(ඈ) මේ පනත ද ඇතුළුව යම් නීති දෙකක් හෝ ඊට වැඩි ගණනක් යටතේ වරදක් ලෙස නිශ්චිතව සඳහන් යම් ක්‍රියාවක්; හෝ

(ඉ) එම වරද මේ පනත ප්‍රකාරව වූ වරදක් සම්බන්ධයෙන් සිදු කර ඇති අවස්ථාවක දී, මේ පනතේ 'ආ' උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් වරදක්,

අනාවරණය වන විට කොමිෂන් සභාව විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව, එකී යම් තොරතුර හෝ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ යම් පැමිණිල්ලක හෝ ලිපිලේඛනවල අන්තර්ගත චෝදනා සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි, මූලික විමර්ශනයක් හෝ විමර්ශනයන් පවත්වා උචිත අධිකරණයේ එම වරද සම්බන්ධයෙන් එම තැනැත්තාට එරෙහිව නීති කෘත්‍ය පැනවීම සඳහා විධාන කරනු ලැබිය යුතු ය.

මූලික පරීක්ෂණය, විමර්ශනය සහ වෙනත් පියවර

**42.** (1) කොමිෂන් සභාව විසින්, 41 වන වගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීම අනාවරණය කර ගනු ලැබිය හැකි යම් ක්‍රියාවක් සිදු කිරීම සම්බන්ධයෙන්-

(අ) යම් තොරතුරක් ලැබීමෙන් පසුව;

(ආ) පැමිණිල්ලක් ලැබීමෙන් පසුව;

(ඇ) කොමිෂන් සභාවේ ම අවශ්‍යතාවය අනුව; හෝ

(ඈ) කොමිෂන් සභාව වෙත ලැබෙන වෙනත් යම් වැදගත් දෙයක් මත පදනම් ව,

මූලික පරීක්ෂණයක් පැවැත්වීම ආරම්භ කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ විධිවිධාන යටතේ යම් වරදක් සිදු කොට ඇත්තේ ද යන්න හෝ 41 වන වගන්තිය යටතේ සඳහන් යම් වරදක් සිදු කිරීම සඳහා යම් සූදානමක්, උත්සාහයක් හෝ අනුබල දීමක් සිදුව ඇත්තේ ද යන්න විශ්වාස කිරීම සඳහා සාධාරණ හේතු පවතී ද යන්න නිශ්චය කිරීම මූලික විමර්ශනයක් පැවැත්වීමේ අදහස වන්නේ ය.

(3) මූලික විමර්ශනයක් සිදු කිරීමෙන් පසුව, 41 වන වගන්තිය යටතේ සඳහන් වරදක් සිදු කොට ඇති බව හෝ 41 වන වගන්තිය යටතේ සඳහන් වරදක් සිදු කිරීම සඳහා කුමන්ත්‍රණයක්, සූදානමක්, උත්සාහයක් හෝ අනුබල දීමක් සිදුව ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන්නේ නම්, විමර්ශනයක් පවත්වන ලෙස කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට විධාන කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, 41 වන වගන්තියේ සඳහන් වරදක් සිදු කර ඇති බව හෝ එවැනි වරදක් සිදු කිරීම සඳහා වූ කුමන්ත්‍රණයක්, සූදානමක්, උත්සාහයක් හෝ අනුබල දීමක් පවතින බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බවට කොමිෂන් සභාව සෑහීමට පත් වේ නම්, මූලික විමර්ශනයක් පැවැත්වීමෙන් තොරව පරීක්ෂණයක් පවත්වන ලෙස කොමිෂන් සභාව විසින් බලය පවරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විමර්ශනයේ අරමුණ වනුයේ:-

(අ) 41 වන වගන්තියේ සඳහන් යම් වරදක් සිදු කර ඇද්ද යන්න නිශ්චය කිරීම;

(ආ) (අ) ඡේදයේ සඳහන් යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් හඳුනාගැනීම සහ සොයා ගැනීම;

(ඇ) 41 වන වගන්තියේ සඳහන් යම් වරදක් සිදු කිරීමට අදාළ කරුණු සහ අවස්ථානුගත සිදුවීම් සම්පව දෙනු ලැබිය හැකි තැනැත්තන් සෙවීම, සම්මුඛව පරීක්ෂා කිරීම සහ ඔවුන්ගේ ප්‍රකාශ වාර්තාගත කිරීම;

(ඈ) අපරාධ නඩු කටයුතුවල දී සාක්ෂි බවට පරිවර්තනය කරනු ලැබීමේ හැකියාවක් ඇත්තා වූ ලේඛන සහ කරුණු රැස් කිරීම;

(ඉ) 41 වන වගන්තියේ සඳහන් යම් වරදක් සිදු කර ඇත්තා වූ තැනැත්තන්ගේ අනන්‍යතාවය නිශ්චය කිරීම;

(ඊ) 41 වන වගන්තියේ සඳහන් යම් වරදක් සිදු කර ඇත්තා වූ යම් තැනැත්තකු සොයා ගැනීම, අත්අඩංගුවට ගැනීම සහ ඔවුන්ගේ ප්‍රකාශ වාර්තාගත කිරීම;

(උ) 41 වන වගන්තියේ සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් තැනැත්තකුට එරෙහිව නීති කෘත්‍ය පැවරීම හෝ වෙනත් නීත්‍යානුකූල පියවරක් ගනු ලැබිය යුතු ද යන්න නිශ්චය කිරීම; හෝ

(ඍ) මේ පනතේ විධිවිධාන මගින් සලස්වා ඇති වෙනත් යම් උචිත පියවර ගැනීම,

යන්න වේ.

(5) කොමිෂන් සභාව වෙත යම් තොරතුරක් හෝ පැමිණිල්ලක් ලැබීමේ දී හෝ කොමිෂන් සභාව විසින් ස්වකීය මෙහෙයවීම යටතේ ම හෝ කොමිෂන් සභාවට ලැබුණු වෙනත් යම් දෙයක් මත තීරණය කරනු ලැබූ අවස්ථාවක දී, 41 වන වගන්තියේ සඳහන් යම් වරදක් සිදු කිරීමේ ප්‍රවනතාවක් ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වේ නම්, එම වරද සිදුවීම අනාවරණය කරගෙන ඒ පිළිබඳ විමර්ශන පැවැත්වීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය බවට සලකනු ලබන යම් පියවර කොමිෂන් සභාව විසින් ගනු ලැබිය හැකි ය.

(6) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, (393 වන අධිකාරය වූ) විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද යම් කොමිෂන් සභාවක් විසින් හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන ජනාධිපති විමර්ශන විශේෂ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද යම් කොමිෂන් සභාවක් විසින් පවත්වනු ලබන අවස්ථාවෝචිත පරිදි යම් පරීක්ෂණයක දී හෝ විමර්ශනයක දී හෝ එම පරීක්ෂණය සහ විමර්ශනය යන දෙකෙහිදී ම හෝ රැස්කරගනු ලබන වැදගත් දේ සලකා බැලීම අනුව 41 වන වගන්තිය යටතේ සඳහන් වූ යම් වරදක් සිදුවී ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත් වන අවස්ථාවක දී, මේ පනත ප්‍රකාරව එකී වරද සිදු කරනු ලැබුවා යැයි කියනු ලබන තැනැත්තාට හෝ තැනැත්තන්ට එරෙහිව අපරාධ නීති කෘත්‍ය පවරන ලෙස කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විධාන කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට චෝදනා ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, සහ එම තැනැත්තා විසින් මේ පනතේ සඳහන් වෙනත් යම් ආශ්‍රිත වරදක් සිදු කර ඇති බව කොමිෂන් සභාවට පෙනී යන අවස්ථාවක දී, එම වරදවල් එකම අධිචෝදනාවේ ම හෝ චෝදනා පත්‍රයේ ම ඇතුළත් කරනු ලැබ අදාළ නීතියේ විධිවිධාන යටතේ එම චෝදනා විභාග කරනු ලැබිය යුතු ය.

(7) කොමිෂන් සභාව විසින්, (6) වන උපවගන්තිය යටතේ නීති කෘත්‍ය පැවරීමට පෙරාතුව-

(අ) එවැනි යම් වරදක් සිදු කිරීම පිළිබඳ තවදුරටත් වූ විමර්ශන පවත්වන ලෙස;

(ආ) (6) වන උපවගන්තියේ සඳහන් යම් දේ ලැබීමට පෙරාතුව කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විමර්ශනයක් අතරතුර දී රැස්කොට තිබිය හැකි යම් වැදගත් දේ පිළිබඳ සලකා බලන ලෙස; සහ

(ඇ) වෙනත් යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියකින් කොමිෂන් සභාවට ලැබී ඇති වෙනත් දේ පිළිබඳ සලකා බලන ලෙස,

විධාන කරනු ලැබිය හැකි ය.

(8) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් යෝග්‍ය බවට සලකනු ලබන්නේ නම්, (1), (3), (5), (6), සහ (7) වන උපවගන්ති යටතේ රැස්කරගනු ලැබූ සහ ලැබුණ දේ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ උචිත පියවර ගැනීම පිණිස නීතිපතිවරයා වෙත හෝ වෙනත් යම් අධිකාරියක් වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(9) කොමිෂන් සභාව විසින් උචිත බවට සලකනු ලබන්නේ නම් මිස, විමර්ශන කොමිෂන් සභාවක් වෙත හෝ ජනාධිපති විමර්ශන විශේෂ කොමිෂන් සභාවක් වෙත ප්‍රකාශයක් ලබා දී ඇති හෝ එවැනි කොමිෂන් සභාවක් ඉදිරියේ සාක්ෂි ලබා දී ඇති යම් තැනැත්තකුගේ ප්‍රකාශයක්, වාර්තාගත කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(10) යම් කාරණා නියමිත දිනයට පෙරාතුව වූ කාලසීමාවකට අදාළ වුව ද, එසේ අදාළ නොවුව ද සහ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත ලැබුණ සන්නිවේදනයක් මගින් අනාවරණය වූ යම් කාරණයක් විභාග කිරීම සඳහා කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

(11) මේ වගන්තියේ (1), (3), (5), හෝ (6) යන උපවගන්තිවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකිරීමට කොමිෂන් සභාව තීරණය කරන්නේ නම් ඒ තීරණය සඳහා වූ හේතු කොමිෂන් සභාව විසින් ලිඛිතව සටහන් කළ යුතු ය.

වරදවල් පිළිබඳ පැමිණිලි

**43.** (1) කොමිෂන් සභාව වෙත පැමිණිල්ල හෝ තොරතුරු ලැබුණු දිනයේ දී එම තැනැත්තා ධුරය හෝ සේවා නියුක්තිය දරනු ලැබුව ද, නොලැබුව ද, එම ධුරය හෝ සේවා නියුක්තිය ප්‍රකාරව සිදු කරනු ලැබුවා යැයි කියනු ලබන ක්‍රියාව මගින් වරදක් සංයුක්ත වන මේ පනතේ 41 වන වගන්තියේ විධිවිධාන යටතේ යම් වරදක් සිදු කිරීමට අදාළ යම් එකී පැමිණිල්ල හෝ තොරතුර කොමිෂන් සභාව වෙත වාචිකව, ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය මගින් ලබාදිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින් විධාන කරනු ලබන ආකාරයට හැකිතාක් ඉක්මනින් වාචිකව ලබා දී ඇති පැමිණිල්ල කොමිෂන් සභාවේ යම් නිලධරයකු විසින් එම පැමිණිල්ල ලබා දී ඇති භාෂාවෙන් ලිඛිතව සංක්ෂිප්ත ලෙස සටහන් කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ලබා දී ඇති භාෂාවෙන් එම පැමිණිල්ල වාර්තා කිරීමට එම නිලධරයාට නොහැකි වේ නම්, එම පැමිණිල්ල ලිඛිතව ඉදිරිපත් කරන ලෙස එම නිලධරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. පැමිණිලිකරුට එම පැමිණිල්ල ලිඛිතව ලබා දීමට නොහැකි වේ නම්, එසේ කිරීමට හේතු සටහන් කිරීමෙන් පසුව නිලධරයා විසින් පැමිණිල්ල එක් ජාතික භාෂාවකින් වාර්තාගත කර ඒ වාර්තාව පැමිණිලිකරුට කියවා දීම හෝ පැමිණිලිකරුට තේරුම්ගත හැකි භාෂාවකින් අර්ථ නිරූපණය කර දීම කරනු ලැබිය යුතු ය.

(3) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් රජයේ අධිකාරියක් හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ යම් අධිකාරියක් හෝ විසින් තම කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී පනතේ විධිවිධාන යටතේ යම් අල්ලස් හෝ දූෂණ ක්‍රියාවක් සිදුව තිබිය හැකි හෝ සිදු කරනු ලැබ ඇතැයි සැක කරනු ලැබිය හැකි බව එකී මතය වන අවස්ථාවක එකී රජයේ අධිකාරිය හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය විසින් එකී කාරණය විමර්ශනය සඳහා කොමිෂන් සභාවට යොමු කරනු ලැබිය යුතු ය.

පැමිණිලිකරු විසින් ප්‍රගතිය දැනගෙන සිටිය හැකි බව

**44.** (1) 43 වන වගන්තිය යටතේ පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලබන යම් තැනැත්තකු වෙත තත්කාර්ය සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දී විමර්ශනයේ ප්‍රගතිය අඩාල නොවන පරිදි 42 වන වගන්තිය යටතේ පවත්වන ලද යම් විමර්ශනයක ප්‍රගතිය පිළිබඳ කරුණු සපයනු ලැබිය හැකි ය. කොමිෂන් සභාව විසින් විමර්ශනයට අදාළව ගනු ලැබූ මූලික පියවර අදාළ තැනැත්තාට සන්නිවේදනය කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතින් සළසා ඇති ආකාරයට සපයන ලද, හුවමාරු කර ගන්නා ලද හෝ සන්නිවේදනය කරන ලද යම් තොරතුරක් සම්බන්ධයෙන් 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

සෝදිසි කිරීම සහ තහනමට ගැනීම

**45.** (1) (අ) 41 වන වගන්තියේ සඳහන් යම් වරදක් සිදු කර ඇති බවට සහ වරද සිදු කිරීම පිළිබඳ සාක්ෂි යම් පරිශ්‍රයක හෝ යම් යාත්‍රාවක, වාහනයක හෝ ගුවන් යානයක හෝ යම් තැනැත්තකු වෙත සොයා ගැනීමට තිබෙන බවට සැක කිරීමට සාධාරණ හේතුවක් පවතින බව; හෝ

(ආ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන යම් විමර්ශනයක් තුළ දී ඉදිරිපත් කිරීමට නියමිත වූ එහෙත් එසේ ඉදිරිපත් කර නොමැති යම් පොතක්, ගිණුමක් හෝ වෙනත් යම් ලේඛනයක් හෝ දෙයක් එවැනි පරිශ්‍රයක හෝ වාහනයක, යාත්‍රාවක හෝ ගුවන් යානයක හෝ යම් තැනැත්තකු වෙත තිබෙන බවට,

කොමිෂන් සභාව සෑහීමට පත් වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ යම් නිලධරයකුට අවස්ථාවෝචිත පරිදි, එම පරිශ්‍රයට, වාහනයට, යාත්‍රාවට, හෝ ගුවන් යානයට ඇතුළු වන ලෙස සහ එම පරිශ්‍රය, හෝ වාහනය, යාත්‍රාව, ගුවන් යානය හෝ තැනැත්තා සෝදිසි කරන ලෙස ලිඛිත නියමයක් මගින් එම නිලධරයා වෙත බලය පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලය ලැබූ යම් නිලධරයකු විසින් එකී පරිශ්‍රය හෝ වාහනය, යාත්‍රාව හෝ ගුවන් යානය හෝ යම් තැනැත්තකු වෙත තිබී සොයා ගනු ලැබූ සහ මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීම පිළිබඳ සාක්ෂි ලෙස විශ්වාස කිරීමට

සාධාරණ හේතු ඇති යම් ද්‍රව්‍යයක් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන යම් විමර්ශනයක දී ඉදිරිපත් කළ යුතු ව තිබූ බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින යම් පොතක්, ගිණුමක් හෝ ලේඛනයක් නැතහොත් දෙයක් මේ වගන්තිය මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නිලධරයකු විසින් තහනමට ගනු ලැබිය හැකි අතර මේ වගන්තිය මගින් තමා වෙත දෙන ලද බලය යටතේ තහනමට ගන්නා ලද එකී සෑම ලිපියක් ම, පොතක් ම, ගිණුමක් ම, ලේඛනයක් ම හෝ දෙයක් ම එකී නිලධරයා විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ වූ යම් සෝදිසි කිරීමක දී, කාන්තාවක විසින් මිස, කිසිදු කාන්තාවක් සෝදිසි කරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තිය ප්‍රකාරව යම් පරිශ්‍රයකට, යාත්‍රාවකට, වාහනයකට හෝ ගුවන් යානයකට ඇතුළුවීම සඳහා යම් තැනැත්තකුට බලය පවතින අවස්ථාවක දී, එම බලය ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා ඔහු විසින් සාධාරණ ලෙස අවශ්‍ය වන පරිදි එම බලය පාවිච්චි කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධාන ප්‍රකාරව තහනමට ගනු ලැබූ සියලු අයිතම පිළිබඳව සහ ඒවා පිළිවෙළින් සොයා ගනු ලැබූ ස්ථානවල ලැයිස්තුවක් එම තහනමට ගැනීම බලාත්මක කළ කොමිෂන් සභාවේ නිලධරයා විසින් සකස් කරනු ලැබ ඔහු විසින් එයට අත්සන් තබනු ලැබිය යුතු ය.

(5) ඉහත උපවගන්තියේ සඳහන් ලැයිස්තුවේ පිටපතක් එකී දේපළේ අයිතිකරුට හෝ එකී දේපළ තහනමට ගනු ලැබුවේ යම් තැනැත්තකුගෙන් ද, එකී තැනැත්තා වෙත හැකි පහසු ඉක්මනින් භාර දෙනු ලැබිය යුතු ය.

(6) ඉහත සඳහන් පරිදි තහනමට ගැනීමට යටත් වන චංචල දේපළ යම් බැංකුවක සන්තකයේ, භාරයේ හෝ පාලනය යටතේ පවතින අවස්ථාවක දී, 49 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(7) මේ වගන්තියේ සඳහන් විධිවිධාන බලාත්මක කිරීම සඳහා, අවශ්‍ය විය හැකි සහාය ද සමඟින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන යම් නිලධරයකු විසින් රජයේ යම් දෙපාර්තමේන්තුවකට, කාර්යාලයකට හෝ ආයතනයකට ඇතුළු වී සෝදිසි කරනු ලැබිය හැකි ය.

(8) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ කොමිෂන් සභාවේ යම් නිලධරයකු විසින් හෝ මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී සහාය වීම පිණිස රජයේ නිලධරයකුගේ හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකුගේ සහාය ලබාගත හැකි ය.

(9) (1) වන උපවගන්තිය යටතේ බලයලත් යම් නිලධරයකු විසින් මේ වගන්තිය යටතේ වූ යම් බලතල ක්‍රියාත්මක කිරීමේ දී 46 වන වගන්තිය යටතේ එකී නිලධරයාට නිකුත් කරන ලද වොරන්ට් පත සෑම විටම රැගෙන යා යුතු ය.

වොරන්ට් පතක් නිකුත් කිරීම

**46.** අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, යෝග්‍ය බවට සලකන කොමිෂන් සභාවේ යම් නිලධරයන් වෙත වොරන්ට් පතක් නිකුත් කරනු ලැබිය හැකි අතර එම වොරන්ට් පත 45 වන වගන්තිය යටතේ එම නිලධරයා වෙත බලය පැවරීම පිළිබඳ බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.

වරෙන්තුවක් නොමැතිව තැනැත්තන් අත්අඩංගුවට ගැනීම ආදිය

**47.** (1) කොමිෂන් සභාවේ යම් බලයලත් නිලධරයකු විසින්:-

(අ) තමා ඉදිරිපිට දී යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරයි නම්;

(ආ) යම් තැනැත්තකු මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධ අදාළත්වයක් දරයි නම් හෝ එවැනි අදාළ වීමක් සම්බන්ධයෙන් ඔහුට එරෙහිව සාධාරණ පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත්නම් හෝ විශ්වසනීය තොරතුරක් ලැබී ඇත්නම් හෝ සාධාරණ සැකයක් පවතී නම්;

(ඇ) කොමිෂන් සභාව විසින් සේවයේ යොදවා ඇති යම් නිලධරයකු ස්වකීය වගකීම් ඉටුකිරීමේ දී යම්

තැනැත්තකු විසින් එයට බාධා කරයි නම් හෝ යම් තැනැත්තකු නීත්‍යානුකූල අත්අඩංගුවෙන් පැන ගොස් ඇත්නම් හෝ පැන යාමට උත්සාහ කරයි නම්;

(ඈ) යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කිරීමේ අදහසින් යුතුව යම් පූර්ව ආරක්ෂණ පියවර ගෙන ඇති බවට විශ්වාස කිරීමට හේතු පවතින අවස්ථානුගත කරුණු යටතේ තමා සිටීම වසන් කිරීම සඳහා පූර්ව ආරක්ෂණ පියවර ගෙන ඇති බවට අනාවරණය වේ නම්; හෝ

(ඉ) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ දී වරද සිදු කරනු ලැබුවේ නම්, මේ පනත යටතේ වූ වරදක් වශයෙන් දඬුවම් කරනු ලැබිය හැකි වන්නා වූ ද, උද්ර්පණය සම්බන්ධයෙන් හෝ පළාගිය තැනැත්තන් සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් තත්කාලයේ බලපවත්වන යම් නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ දී අත්අඩංගුවේ තබා ගැනීම හෝ රඳවා ගැනීම ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි ස්ථානයක දී එවැනි යම් ක්‍රියාවක් සිදු කර ඇති බවට එම තැනැත්තාට එරෙහිව සාධාරණ පැමිණිල්ලක් සිදු කර ඇති බවට හෝ විශ්වසනීය තොරතුරක් ලැබී ඇති බවට හෝ සාධාරණ සැකයක් එවැනි තැනැත්තකුට එරෙහිව පවතින්නේ නම්,

මේ පනතේ විධිවිධාන යටතේ වූ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් සැක කරනු ලබන එවැනි යම් තැනැත්තකු කොමිෂන් සභාවේ යම් බලයලත් නිලධරයකු විසින් මහෙස්ත්‍රාත්වරයකුගේ නියෝගයක් හෝ වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අත්අඩංගුවට ගැනීමක් සිදු කිරීමේ දී, එම තැනැත්තා අත්අඩංගුවට ගැනීම සඳහා වචනයෙන් හෝ ක්‍රියාවෙන් ඉඩදී ඇත්නම් මිස, එම අත්අඩංගුවට ගැනීම සිදු කරනු ලබන නිලධරයා විසින් එම තැනැත්තාගේ ශරීරය ඇත්ත වශයෙන් ම ස්පර්ශ කිරීම හෝ අල්ලා රැඳවීම කළ යුතු අතර එම තැනැත්තා තමා අත්අඩංගුවට පත්වන චෝදනාවේ හෝ පැමිණිල්ලේ ස්වභාවය දැනුම්දිය යුතු අතර විධිමත් අත්අඩංගුවට ගැනීමක් සිදු කරනු නොලැබ හෝ සියලු අදහස් හා අරමුණු අනුව හෝ

ඒ තැනැත්තා අත්අඩංගුවේ සිටිය දී සාමාන්‍ය අත්අඩංගුවට ගැනීමක් සිදු නොකළේ ය යන වර්ණවත් මවා පෑමක් මත රඳවා තබා ගැනීම සියලු ආකාරයෙන් එම තැනැත්තා අත්අඩංගුවට ගැනීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) එම තැනැත්තා තමාව අත්අඩංගුවට ගැනීම සඳහා වූ උත්සාහය කෙරෙහි බලය යොදමින් ප්‍රතිවිරෝධතාවක් දක්වන්නේ නම් හෝ අත්අඩංගුවට ගැනීම මඟ හැරීමට උත්සාහ දරන්නේ නම්, එම අත්අඩංගුවට ගැනීම සිදු කරන නිලධරයා විසින් එම අත්අඩංගුවට ගැනීම ඵලදායී කර ගැනීම සඳහා අවශ්‍ය සාධාරණ ක්‍රමයක් භාවිත කරනු ලැබිය හැකි ය.

(4) අත්අඩංගුවට ගැනීමට නියමිත යම් තැනැත්තකු යම් ස්ථානයකට ඇතුළු වී සිටින බවට හෝ යම් ස්ථානයක් තුළ සිටින බවට විශ්වාස කිරීමට අත්අඩංගුවට ගැනීම සිදු කරන නිලධරයාට හේතු පවතී නම්, එම නිලධරයා විසින් ඉල්ලීමක් කිරීමේ දී, එම ස්ථානයේ සිටින හෝ එම ස්ථානය භාරව සිටින තැනැත්තා විසින් එම අත්අඩංගුවට ගැනීමට නියමිත තැනැත්තා වෙත නිදහස් ප්‍රවේශය ලබා දීමට සහ එම ස්ථානය සෝදිසි කිරීමට සියලු සාධාරණ පහසුකම් ඔහුට  සලසනු ලැබිය යුතු ය.

(5) ඉහතින් ම වූ උපවගන්තිය යටතේ එවැනි ස්ථානයක් වෙත ප්‍රවේශය ලබාගත නොහැකිවේ නම්, ඕනෑම අවස්ථාවක දී වරෙන්තුවක් යටතේ ක්‍රියාකරනු ලබන නිලධරයා විසින් හෝ වරෙන්තුවක් නිකුත් කර තිබුණ ද අත්අඩංගුවට ගැනීමට නියමිත තැනැත්තා වෙත ගැලවී යෑමේ අවස්ථාවක් සැලසීමෙන් තොරව එය ලබාගත නොහැකි වන අවස්ථාවක දී, එම නිලධරයා විසින් එම ස්ථානයට ඇතුළු වී එම තැනැත්තා සෝදිසි කරනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය.

(6) අත්අඩංගුවට ගැනීමේ කාර්යයක් සඳහා යම් ස්ථානයකට නීත්‍යනුකූලව ඇතුළු වීමෙන් පසුව එහි රඳවා තබා ගනු ලැබ සිටින නිලධරයකු විසින්, තමා ඉන් නිදහස් වීම පිණිස නැතහොත් වෙනත් යම් තැනැත්තකු ඉන් නිදහස් කර ගැනීම පිණිස එම ස්ථානයේ යම් බාහිර හෝ අභ්‍යන්තර දොරක් හෝ ජනේලයක් කඩා විවෘත කරනු ලැබිය හැකි ය.

(7) අත්අඩංගුවට ගන්නා ලද යම් තැනැත්තකු, පළායෑම වැළැක්වීමට අවශ්‍ය වන ප්‍රමාණයට වඩා වැඩි සීමා කිරීමකට යටත් කරනු නොලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින්, වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම සඳහා යම් නිලධරයකු වෙත බලය පවරනු ලබන යම් නීති පැනවීමක් ක්‍රියාත්මක වීම සමග මැදිහත් වීමක් හෝ එහි යම් වෙනස් කිරීමක් නොවිය යුතු ය.

අත්අඩංගුවට ගැනීමෙන් පසු කාර්ය පටිපාටිය

**48.** (1) යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමක් සිදු කරනු ලබන යම් නිලධරයකු විසින් අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සහ ඇප ලබාගැනීම සඳහා මෙහි සඳහන් විධිවිධානවලට යටත්ව, එසේ අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තා ආසන්නත ම මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

(2) සිදුවීම පිළිබඳ සියලු අවස්ථානුගත කරුණු යටතේ සාධාරණ වූ කාල පරිච්ඡේදයක් ඉක්මවා වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තකු යම් නිලධරයකු විසින් දීර්ඝ කාලයක් අත්අඩංගුවේ තබා ගැනීම හෝ අන්‍යාකාරයකින් රඳවා තබා ගැනීම සිදු කරනු නොලැබිය යුතු අතර එම කාලසීමාව අත්අඩංගුවට පත් වූ ස්ථානයේ සිට මහෙස්ත්‍රාත්වරයා වෙත ගෙන යෑම සඳහා අවශ්‍ය කාලය බැහැර කිරීමෙන් පසුව පැය විසි හතරක් නොඉක්මවිය යුතු ය.

(3) අත්අඩංගුවට පත් වූ තැනැත්තා ඉදිරිපත් කරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද, එම මහෙස්ත්‍රාත්වරයා මෙම නඩුව විභාග කිරීම සඳහා අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයා නොවන අවස්ථාවක දී, 149 වන වගන්තියට යටත්ව සහ විමර්ශනයේ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසුව, එසේ අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තාව දින දාහතරක් නොඉක්මවන කාලසීමාවක් ඇතුළත නඩු විභාගය සඳහා අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරන ලෙස නියෝග කරනු ලැබිය යුතු ය.

(4) නීත්‍යානුකූල අත්අඩංගුවේ සිටින යම් තැනැත්තකු ගැලවී යන්නේ නම් හෝ ගලවා ගනු ලබන්නේ නම් යන අවස්ථාවක දී, එසේ එම තැනැත්තා ගැලවී යනුයේ හෝ ගලවා ගනු ලැබුවේ කවර නිලධරයකුගේ අත්අඩංගුවෙන් ද, එම නිලධරයා විසින් එම තැනැත්තා එසේ අත්අඩංගුවේ සිටි අධිකරණ බලප්‍රදේශය තුළ දී

හෝ ඉන් පිටත දී වුව ද වහාම ලුහුබැඳ ගොස් ඕනෑම ස්ථානයක දී, අත්අඩංගුවට ගත යුතු අතර එකී අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් 47 වන වගන්තියේ විධිවිධාන අදාළ කොට ගත යුතු ය.

(5) උපදේශිත ලෙස යම් ව්‍යවහාර නෝට්ටුවක් භාරගෙන, ඉල්ලා සිටිනු ලැබ හෝ පිරිනමනු ලැබ ඇති බවට ප්‍රකාශ කරමින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සන යටතේ වූ වාර්තාවක් ද සමඟ නඩුකරයේ දී, අත්අඩංගුවට ගෙන ඇති තැනැත්තා විසින් තුටු පඬුරක් වශයෙන් පිළිගෙන ඇති, ඉල්ලා ඇති හෝ පිරිනමා ඇති ලෙස සලකන යම් ව්‍යවහාර නෝට්ටු නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින් තමා වෙත ස්වකීය සහතිකයේ නිශ්චිතව දක්වනු ලබන නෝට්ටුවල මුදල් වර්ගය සහ නෝට්ටු අංක ඉදිරිපත් කර ඇති බවට ප්‍රකාශ කරමින් ස්වකීය අත්සන යටතේ සහතිකය නිකුත් කරනු ලැබිය යුතු අතර එම සහතිකය, එම නඩු කටයුතුවල දී එම නෝට්ටු ඉදිරිපත් කිරීම වෙනුවට එම නෝට්ටු පිළිගෙන ඇති ලෙස, ඉල්ලා ඇති ලෙස හෝ පිරිනමා ඇති ලෙස සලකනු ලබන තැනැත්තාට එරෙහිව පවරනු ලබන යම් නීති කෘත්‍යවල දී ආවේශ්‍ය කරගනු ලැබිය යුතු ය.

**49.** (1) 42 වන වගන්තිය යටතේ යම් විමර්ශනයක් පැවැත්වීමේ දී කොමිෂන් සභාව විසින්- විමර්ශනයක් පැවැත්වීමේ දී යම් තැනැත්තන් පරීක්ෂා කිරීම

(අ) ලබා ගැනීමට, භාර ගැනීමට, ගැනීමට අවශ්‍ය හෝ යෝග්‍ය බවට කොමිෂන් සභාව විසින් අදහස් කරනු ලැබිය හැකි යම් ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීම සහ භාර ගැනීම සහ පරීක්ෂා කිරීමට අවශ්‍ය හෝ යෝග්‍ය බවට අදහස් කරනු ලබන සියලු තැනැත්තන් පරීක්ෂා කිරීම කරනු ලැබිය හැකි ය;

(ආ) කොමිෂන් සභාව විසින් විභාග කරනු ලැබීමේ කාර්ය සඳහා කොමිෂන් සභාවට පැමිණෙන ලෙස යම් තැනැත්තකුට නියම කිරීම සහ කොමිෂන් සභාවේ අදහස අනුව විමර්ශනය වන කාරණාවලට අදාළ වන්නා වූ ද, කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකු වෙත යොමු කරනු ලැබුවා වූ ද, ප්‍රශ්නයක් සඳහා වාචිකව හෝ දිව්රුමක් හෝ ප්‍රතිඥාවක් මගින් පිළිතුරු ලබා දෙන ලෙස හෝ දිව්රුම් ප්‍රකාශයක ආකෘතියෙන් විමර්ශනයට යටත් වූ යම් කාරණාවලට අදාළ යම් කාරණා ප්‍රකාශ කරන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය;

(ඈ) යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක් හෝ වෙනත් යම් දෙයක් ඉදිරිපත් කිරීම සඳහා එවැනි යම් තැනැත්තකු කැඳවනු ලැබිය හැකි ය;

(ඇ) 42 වන වගන්තිය යටතේ යම් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පවත්වනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එවැනි යම් තැනැත්තකුගේ හෝ එවැනි තැනැත්තකුගේ ආශ්‍රිත යම් තැනැත්තකුගේ හෝ එවැනි යම් තැනැත්තකු අධ්‍යක්ෂවරයකු වන යම් සමාගමක හෝ එවැනි තැනැත්තකුට අර්ථලාභී සම්බන්ධතාවක් පවතින යම් භාරයක හෝ එවැනි තැනැත්තකු හවුල්කරුවකු වන්නා වූ යම් සංස්ථාවක යම් ගිණුමකට අදාළව ඕනෑම ආකාරයක ආකෘතියකින් නිවේදනයේ දක්වා ඇති කාලසීමාවක් ඇතුළත යම් තොරතුරු සපයන ලෙස ලිඛිත නිවේදනයක් මගින් කොමිෂන් සභාව විසින් යම් බැංකුවක්, බැංකු නොවන මූල්‍ය ආයතනයක් හෝ නම් කළ මූල්‍ය නොවන ව්‍යාපාරයක් වෙත විධාන කිරීම හෝ එසේ නිශ්චිතව දක්වන ආකාරයට මුද්‍රිත ආකෘතියෙන් එහි සඳහන් යම් තොරතුරුවල සහතික පිටපත් සැපයීම සඳහා විධාන කිරීම කරනු ලැබිය හැකි ය;

(ඉ) (ඇ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ සහ 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන කාරණාවලට අදාළ පහත දැක්වෙන තොරතුරු සහ දේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස යම් බැංකුවක්, බැංකු නොවන මූල්‍ය ආයතනයක් හෝ නම් කළ මූල්‍ය නොවන ව්‍යාපාරයක් වෙත නියම කරනු ලැබිය හැකි ය; එනම්–

**(i)** එම බැංකුව, ආයතනය හෝ ව්‍යාපාරය විසින් යම් තැනැත්තකු වෙත සපයනු ලබන මූල්‍ය සේවාවලට අදාළ වන තොරතුරු සහ දේ;

**(ii)** යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන යම් මූල්‍ය ගනුදෙනුවක් පිළිබඳ විස්තර;

**(iii)** එම බැංකුව, ආයතනය හෝ ව්‍යාපාරය විසින් සපයනු ලබන බැංකු ගිණුම්, තැන්පතු, ප්‍රේෂණ සහ මුදල් ආපසු ගැනීම් මෙන්ම මූල්‍ය සේවා පිළිබඳ විස්තර;

**(iv)** යම් තැනැත්තකු විසින් මූල්‍ය සේවා ලබා ගැනීම් සම්බන්ධයෙන් වූ විස්තර; සහ

**(v)** යම් ගිණුමකට හෝ ගනුදෙනුවකට අදාළ සහතික කළ ගිණුම් ප්‍රකාශයක් හෝ වෙනත් යම් විස්තර;

(ඊ) (ඇ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනතේ විධිවිධාන යටතේ හෝ මේ පනතේ සඳහන් ආශ්‍රිත වරදක් සම්බන්ධයෙන් හෝ යම් විමර්ශනයක් පැවැත්වීමේ කාර්ය සඳහා යම් තොරතුරක් හෝ ලේඛනයක් සපයන ලෙස පහත සඳහන් නිලධරයන් වෙත නියම කරනු ලැබිය හැකි ය. එනම්:-

**(i)** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද යම් අමාත්‍යාංශයක ලේකම්වරයා;

**(ii)** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මහලේකම්වරයා;

**(iii)** 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 97 වන වගන්තිය යටතේ පත් කරන ලද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා;

**(iv)** (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 12 වන වගන්තිය යටතේ පත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා;

**(v)** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද විගණකාධිපතිවරයා;

**(vi)** (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 33 වන වගන්තිය යටතේ පත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා;

**(vii)** 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව පත් කරන ලද මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂවරයා;

(viii) 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පනතේ 19 වන වගන්තිය යටතේ පත් කරන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

**(ix)** (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා;

**(x)** (351 වන අධිකාරය වූ) ආගමන හා විගමන පනතේ 4 වන වගන්තිය යටතේ පත් කරන ලද ආගමන හා විගමන පාලකවරයා;

**(xi)** 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා;

**(xii)** 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ආනයන සහ අපනයන පාලකරවයා;

**(xiii)** 2007 අංක 07 දරන සමාගම් පනතේ 47 වන වගන්තිය යටතේ පත් කරන ලද සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා;

**(xiv)** (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද ඉඩම් කොමසාරිස්වරයා;

**(xv)** 2003 අංක 3 දරන බුද්ධිමය දේපළ පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(xvi) (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 204 වන වගන්තිය යටතේ පත් කරන ලද මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා;

(xvii) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22ආ වගන්තිය යටතේ පත් කරන ලද විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(xviii) රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ වෙනත් යම් රාජ්‍ය ආයතනයක ප්‍රධානියකු;

(xix) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ අඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ඉඩම් රෙජිස්ටාර් ජනරාල්වරයා; හෝ

(xx) පළාත් සභාවක සභාපතිවරයා හෝ යම් පළාත් පාලන ආයතනයක සභාපතිවරයකු හෝ විශේෂ කොමසාරිස්වරයකු;

(ළ) 42 වන වගන්තිය යටතේ යම් සන්නිවේදනයක් ලැබී ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එවැනි තැනැත්තකු හට පහත දැක්වෙන පරිදි ලිඛිතව දිව්රුම් ප්‍රකාශයක් සපයන ලෙස නියම කරනු ලැබිය හැකි ය; එනම්:-

(i) යම් වේලාවක දී හෝ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වේලාවක දී එම තැනැත්තා විසින් හෝ එම තැනැත්තා සමග සම්බන්ධිත වෙනත් යම් තැනැත්තකු විසින් අයිතිය දරන හෝ සන්තකය දරන සියලු චංචල හෝ නිශ්චල දේපළ පිළිබඳ නිශ්චිතව දක්වනු ලබන සහ එම නිශ්චිතව දක්වන ලද දේපළ මිල දී ගැනීම මගින් ත්‍යාග, රික්තවරණ, උරුමය හෝ අන්‍යාකාරයකින් අත්කරගනු ලැබූ දිනය නිශ්චිතව දක්වමින්; සහ

(ii) කොමිෂන් සභාවේ අදහස අනුව විමර්ශනයට අදාළ වන වෙනත් යම් කාරණා පිළිබඳ විස්තර අන්තර්ගත වන පරිදි වූ ලිඛිත දිව්රුම් ප්‍රකාශයක්;

(ඌ) ඉහත (ඊ) සහ (උ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති තැනැත්තන් හැර, වෙනත් තැනැත්තකු වෙත-

(i) 42 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විමර්ශනයක් සඳහා එම තොරතුරු සහාය විය හැකි බවට විශ්වාස කිරීමට කොමිෂන් සභාවට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී, කවර හෝ අවස්ථාවක හෝ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන යම් කාලයක දී එම තැනැත්තා විසින් අයිතිය දරනු ලැබූ හෝ සන්තකය දරනු ලැබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ නිශ්චිතව දක්වමින්; සහ

(ii) කොමිෂන් සභාවේ මතය අනුව එම විමර්ශනය සඳහා අදාළ වන වෙනත් යම් කාරණා පිළිබඳ විස්තර අන්තර්ගත වන පරිදි,

ලිඛිත දිව්රුම් ප්‍රකාශයක් සපයන ලෙස එම තැනැත්තාට විධාන කරනු ලැබිය හැකි යː

එසේ වුව ද, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් යම් විධානයක් නිකුත් කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එම තැනැත්තා එකී විධානයට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වූ යම් වරදක විෂය වස්තුව වන්නා වූ යම් මූල්‍යමය සාධන පත්‍රයක් හෝ එහි අමතර එකතුවක් ඇතුළු යම් චංචල දේපළක් හෝ එම වරද සිදු කිරීමට අදාළ යම් සාක්ෂියක් යම් බැංකුවක් සන්තකයේ හෝ ආරක්ෂාව යටතේ හෝ පාලනය යටතේ පවතින බවට වූ කොමිෂන් සභාවේ නිලධරයකු විසින් ලබා දී ඇති යම් තොරතුරක් පිළිබඳව කොමිෂන් සභාව විසින් සෑහීමට පත් වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, නියමයක් මගින් වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, එම දේපළෙන්

වෙන්වීම හෝ ඒ සම්බන්ධයෙන් ගනුදෙනු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා සිදු නොකරන ලෙස බැංකුව වෙත විධාන කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන නියමයකට අල්ලස් මගින් උපයාගත් මුදල් අන්තර්ගත බවට සැක කරනු ලබන බැංකු ගිණුම් හෝ වෙනත් මූල්‍යමය තැන්පතු සහ ගිණුම්, ඒවායේ අන්තර්ගත වන්නා වූ අල්ලස් මගින් ලද මුදල්වල ප්‍රමාණයට, කොමිෂන් සභාව විසින් ඒ සම්බන්ධයෙන් සාදනු ලබන රීතිවලින් පනවනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව 53 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ක්‍රියා විරහිත කිරීම ඇතුළත් විය හැකි ය.

(4) බැංකුවක් හෝ බැංකුවක යම් නියෝජිතයකු හෝ සේවානියුක්තයකු විසින්, (2) වන උපවගන්තියේ සඳහන් එකී අනුකූලව ක්‍රියා කිරීම මත, වෙනත් යම් නීතියක් හෝ කොන්ත්‍රාත්තුවක්, ගිවිසුමක් හෝ වැඩපිළිවෙළක් යටතේ හෝ අන්‍යාකාරයකින් යම් තැනැත්තකු විසින් සිදු කරන යම් නීතියක් යටතේ වූ නඩු පැවරීමකට හෝ වෙනත් යම් නඩු පැවරීමකට හෝ හිමිකම්පෑමකට යටත් නොවිය යුතු ය.

(5) මේ පනත යටතේ පවත්වනු ලබන යම් විමර්ශනයක් අවසන් වීමෙන් පසුව, විමර්ශනයට යටත් වූ යම් කරුණකට යම් ආකාරයකින් සම්බන්ධතාවක් දක්වන හෝ අදාළ වන යම් තැනැත්තකු වෙත හෝ කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන යම් විමර්ශනයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද නිවේදනයකට අනුකූලව ස්වකීය කළමනාකරු ක්‍රියාකර ඇත්තා වූ යම් බැංකුවක් වෙත කොමිෂන් සභාව විසින් එම විමර්ශනය සම්බන්ධයෙන් එම තැනැත්තා හෝ බැංකුව විසින් සාධාරණ ලෙස දරන ලද පිරිවැය සහ වියදම් සපුරාලීමට ප්‍රමාණවත් විය හැකි බවට කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් මුදලක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන සියලු මුදල් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(7) එම තැනැත්තා යම් අපරාධමය චෝදනාවක් හෝ දණ්ඩනයක් සඳහා හෝ අභිමි කිරීමකට නිරාවරණය වන ප්‍රවනතාවක් ඇති ප්‍රශ්න හැර, මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව ඉදිරිපිට පෙනී සිටින යම් තැනැත්තකු, ඔහු වෙත කොමිෂන් සභාවේ නිලධරයන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලු ප්‍රශ්න සඳහා සත්‍ය ලෙස පිළිතුරු ලබාදීමට බැඳී සිටින්නේ ය.

විද්වතුන්ගේ සහාය ලබා ගැනීම

**50.** (1) විමර්ශනයක් පැවැත්වීම සඳහා රජයේ රස පරීක්ෂකවරයා විසින්, රජයේ වෛද්‍ය වෘත්තිකයකු හෝ වෙනත් යම් දේශීය හෝ විදේශීය විද්වතකු විසින් යම් තැනැත්තකු පරීක්ෂා කිරීම අවශ්‍ය වන බවට කොමිෂන් සභාව විසින් සලකනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්-

(අ) එම තැනැත්තාගේ එකඟත්වය ඇතිව රජයේ රස පරීක්ෂකවරයා, විමර්ශනය පවත්වනු ලබන ක්ෂේත්‍රයේ විශේෂඥතාවයක් ඇති වෙනත් යම් දේශීය හෝ විදේශීය විද්වතකු හෝ රජයේ වෛද්‍ය වෘත්තිකයකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට භාජනය වීම සඳහා කොමිෂන් සභාව ඉදිරියේ දී පරීක්ෂණයකට ලක්වන ලෙස, එම තැනැත්තා කැඳවනු ලැබිය හැකි ය; සහ

(ආ) (අ) ඡේදයේ සඳහන් යම් විද්වතකුගෙන් කොමිෂන් සභාව විසින් තමා වෙත යොමු කරන ලද කරුණක් පිළිබඳ වාර්තාවක් සපයන ලෙස ලිඛිතව නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා විසින්, එසේ තමාව පරීක්ෂණයට ලක්වීම සඳහා කැමැත්ත ලබා නොදෙන අවස්ථාවක දී, එම තැනැත්තාව පරීක්ෂා කර ඒ සම්බන්ධයෙන් වාර්තා කරන ලෙස විමර්ශනය පවත්වනු ලබන එහි නම් සඳහන් විද්වත් තැනැත්තා වෙත බලය ලබාදෙන නියෝගයක් නිකුත් කරන ලෙස එම විමර්ශනය පවත්වන ස්ථානයට අදාළව අධිකරණ බලය පවතින මහෙස්ත්‍රාත්වරයා වෙත කොමිෂන් සභාව විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. එවැනි නියෝගයක් නිකුත් කර ඇති අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා විසින් එසේ එම විද්වත් තැනැත්තාගේ පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතු අතර එම විද්වතා විසින් එම පරීක්ෂණයේ ප්‍රතිඵල නිශ්චිතව දක්වමින් මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

ඇඟිලි සලකුණු, ඡායාරූප, රහස්‍ය නොවන සාම්පල, රුධිර සාම්පල සහ හඬ සාම්පල ආදිය ලබා ගැනීම

**51.** (1) 47 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු අත්අඩංගුවට ගෙන ඇති අවස්ථාවක දී හෝ 49 වන වගන්තිය යටතේ සිතාසි භාරදී ඇති අවස්ථාවක දී, කොමිෂන් සභාවේ යම් බලයලත් නිලධරයකු විසින්, එම තැනැත්තාගේ රුධිර සාම්පල, හඬ සාම්පල, ඡායාරූප, ඇඟිලි අත්ල හෝ පාද සලකුණු හෝ ශරීරයේ වෙනත් යම් කොටසක සාම්පල සහ එම තැනැත්තාගේ බර සහ උස පිළිබඳ කිරුම් මිනුම් ලබා ගැනීම හෝ එසේ ලබා ගැනීමට කටයුතු සැලැස්වීම කරනු ලැබිය හැකි ය.

(2) (අ) එම තැනැත්තාට වරද සම්බන්ධයෙන් චෝදනා නොකිරීමට තීරණයක් ගෙන ඇත්නම්; හෝ

(ආ) එම තැනැත්තාට මේ පනත යටතේ වූ යම් වරදක් සඳහා චෝදනා කරනු ලැබ එහෙත් වරදකරු කිරීමට පෙරාතුව අධිකරණයක් විසින් නිදහස් කර ඇත්නම් හෝ නඩු විභාගයේ දී හෝ අභියාචනයේ දී නිදොස් කොට නිදහස් කර ඇත්නම්, සහ එහි යම් සේයා පටක හෝ පිටපත් සමඟින් හැකි සාධාරණ ඉක්මනින් හඳුනා ගැනීමේ විස්තර විනාශ කරනු ලැබ ඇත්නම් නැතහොත් එම තැනැත්තා වෙත ඒවා භාර දී ඇත්නම් මිස,

(1) වන උපවගන්තිය යටතේ ලබාගෙන ඇති යම් තැනැත්තකුගේ හඳුනාගැනීමේ විස්තර කොමිෂන් සභාව විසින් සන්තකයේ තබා ගනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ යම් වරදකට කලින් වරදකරු වී ඇත්තා වූ යම් තැනැත්තකුගේ හඳුනාගැනීමේ විස්තර කොමිෂන් සභාව විසින් භාරයේ තබාගනු ලැබිය හැකි ය.

(4) මේ පනත යටතේ සිදු කරන ලද හෝ සිදු කරනු ලැබූ ලෙස සලකනු ලබන යම් වරදක් සම්බන්ධයෙන් වූ විමර්ශනයක දී,-

(අ) එම තැනැත්තා සම්බන්ධව මේ පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකර හෝ ඒ අනුව රඳවා තබාගෙන ඇත්නම්; සහ

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයකුගේ තත්ත්වයට අඩු නොවන මට්ටමක යම් නිලධරයකු විසින් (මෙහි මින්

මතු "බලය දෙනු ලබන නිලධරයා" ලෙස හඳුන්වනු ලබන) එම ලබා ගැනීම සඳහා අවසර ලබා දී ඇත්නම්,

පමණක්, වෝහාරික විශ්ලේෂණ සඳහා යම් තැනැත්තකුගෙන් රහස්‍ය නොවන සාම්පලයක් ලබා ගත හැකි ය.

(5) (අ) රහස්‍ය නොවන සාම්පලය ලබා ගැනීමට නියමිත වනුයේ යම් තැනැත්තකුගෙන් ද එම තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදු කර ඇති බවට සැක කිරීමට, සාධාරණ හේතු ඇත්නම්; සහ

(ආ) සාම්පලය මගින් එම වරද සිදු කිරීම හෝ සිදු නොකිරීම තහවුරු වන බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්,

පමණක්, (4) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නියම කර ඇති ආකාරයට බලය දෙනු ලබන නිලධරයකු විසින් ස්වකීය බලය ලබාදිය හැකි ය.

(6) බලය දෙනු ලබන නිලධරයකු විසින් ස්වකීය බලය දීම ලිඛිතව ලබා දිය යුතු අතර ප්‍රායෝගික අපහසුතාවයක දී, ස්වකීය බලය දීම වාචිකව ලබා දී හැකිතාක් ඉක්මනින් ලිඛිතව එය තහවුරු කරනු ලැබිය යුතු ය.

(7) (5) වන උපවගන්තිය යටතේ යම් බලය ලබාදී ඇති අවස්ථාවක දී, එම බලය දීම මගින් බල සහිත වූ නිලධරයා විසින්, රහස්‍ය නොවන සාම්පලයක් ලබා ගැනීමට පෙරාතුව, එම සාම්පලය ලබාගත යුත්තේ යම් තැනැත්තකුගෙන් ද එම තැනැත්තා වෙත-

(අ) එම තැනැත්තා විසින් සිදු කර ඇති බවට සැකකරනු ලබන තැනැත්තා වෙත වරදේ ස්වභාවය පිළිබඳ දැනුම්දෙනු ලැබිය යුතු ය;

(ආ) එම සාම්පලය මගින් එම තැනැත්තා විසින් වරද සිදු කිරීම තහවුරු කිරීම සඳහා ප්‍රවනතාවක් ඇති බවට හෝ එම වරද සිදු කිරීම ඔප්පු නොවීම සඳහා විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බවට දැනුම් දෙනු ලැබිය යුතු ය;

(ඇ) බලය පවරා තිබීම පිළිබඳ දැනුම් දෙනු ලැබිය යුතු ය;

(ඈ) සාම්පලය ලබා ගැනීම සඳහා ඔහු විසින් කැමැත්ත ලබා දිය හැකි බව හෝ කැමැත්ත ලබා නොදිය හැකි බව දැනුම් දෙනු ලැබිය යුතු ය; සහ

(ඉ) සාම්පලය විශ්ලේෂණය කරනු ලබන බවත් එවැනි විශ්ලේෂණයකින් උපචිත වන තොරතුරු එකී වරද සඳහා වූ අපරාධ නඩු කටයුත්තක දී භාවිත කළ හැකි වූ හෝ මේ පනත යටතේ එකී තැනැත්තා අත්අඩංගුවට ගනු ලැබිය හැකි වෙනත් යම් වරදක් පිළිබඳ සාක්ෂි සපයනු ලැබිය හැකි බව දැනුම් දිය යුතු ය.

(8) යම් තැනැත්තකු (4) වන උපවගන්තිය යටතේ රහස්‍ය සාම්පලයක් ලබා ගැනීම සඳහා කැමැත්ත ලබා නොදෙන්නේ නම්, කොමිෂන් සභාව විසින් එසේ රහස්‍ය නොවන සාම්පලයක් ලබා ගැනීම සඳහා බලය පවරනු ලබන නියෝගයක් ලබා ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(9) (4) වන උපවගන්තිය යටතේ රහස්‍ය නොවන සාම්පලයක් ලබාගෙන ඇත්තේ යම් තැනැත්තකුගෙන් ද එම තැනැත්තාට එම සාම්පල විශ්ලේෂණයෙන් ලැබෙන ප්‍රතිඵල දැන ගැනීම සඳහා හිමිකමක් ඇත්තේ ය.

(10) මේ වගන්තිය යටතේ රහස්‍ය නොවන සාම්පලයක් ලබා ගැනීම සඳහා ලබා දී ඇති කැමැත්ත ලිඛිතව ලබාදිය යුතු මෙන්ම එම කැමැත්ත ලබා දෙන තැනැත්තා විසින් එයට අත්සන් තබනු ලැබිය යුතු ය.

(11) (8) වන වගන්තිය යටතේ නියෝගයක් නිකුත් කර ඇති අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත ප්‍රතිඵල වාර්තා කරනු ලැබිය යුතු ය.

(12) යම් තැනැත්තකුගෙන් ලබා ගැනීමට නියමිත රහස්‍ය නොවන සාම්පලය ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු විසින් පමණක් ලබාගත යුතු ය.

(13) රහස්‍ය නොවන සාම්පල භාවිතය පිළිබඳ සීමාවන්, ‍වෝහාරික විශ්ලේෂණ ප්‍රතිඵල සහ සාම්පල සහ වාර්තා බැහැර කිරීම පිළිබඳව වන සීමා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

මහෙස්ත්‍රාත්වරුන්ගේ සහාය ලබා ගැනීම

**52.** (1) 50 වන වගන්තිය, 51 වන වගන්තියේ (8) වන උපවගන්තිය හෝ 59 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්තේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද එවැනි, සෑම මහෙස්ත්‍රාත්වරයකු විසින් ම උචිත අධිකරණ නියෝග සහ සිතාසි නිකුත් කිරීම මගින් විමර්ශනය සඳහා සහාය විය යුතු මෙන්ම විශේෂයෙන් ම වරදකරුගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමේ කාර්ය සඳහා හඳුනාගැනීමේ පෙරට්ටුවක් පැවැත්වීම හෝ පැවැත්වීම සඳහා බලය ලබාදීම කරනු ලැබිය යුතු මෙන්ම එම කාර්ය සඳහා එවැනි සැකකරුවකුට හෝ වෙනත් යම් තැනැත්තකුට එවැනි පෙරට්ටුවකට සහභාගී වන ලෙස නියම කිරීම, රහස්‍ය තත්ත්වයෙන් ස්වකීය හඳුනාගැනීම සිදු කිරීම සඳහා සාක්ෂිකරුවකුට ඉඩ ලබාදීම මෙන්ම එවැනි පෙරට්ටුවක කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කිරීම හෝ සකස් කිරීමට කටයුතු සැලැස්වීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර ඒ සඳහා අදාළ වන කටයුතු යුක්තියේ කාර්ය සඳහා අවශ්‍ය යම් ප්‍රතිමානවලට යටත්ව සහ මහෙස්ත්‍රාත්වරයාගේ සහාය අපේක්ෂා කරනුයේ යම් විමර්ශනයක් සම්බන්ධයෙන් ද එම විමර්ශනයේ යහපත් තත්ත්වයට හානියක් නොවන පරිදි කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිනුයේ නම් රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

තහනම් නියෝග

**53.** (1) කොමිෂන් සභාව විසින්-

(අ) යම් නියෝගයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක් 42 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පවත්වනු ලබන විට එම තැනැත්තාගේ කලත්‍රයා, එම තැනැත්තාගේ වෙනත් යම් පවුලේ සාමාජිකයකු හෝ එම පළමුව සඳහන් තැනැත්තා වෙනුවෙන් භාරයක් වශයෙන් යම් දේපළක් දරනු ලබන

වෙනත් යම් තැනැත්තකු හෝ ඔහුගේ චංචල දේපළ කිසිවක් තම සන්තකයේ, භාරකාරත්වයේ හෝ පාලනයේ පවත්නා යම් බැංකුවක්, බැංකු කටයුතුවල නොයෙදෙන මූල්‍ය ආයතනයක් හෝ නමෝදිෂ්ඨ මූල්‍ය නොවන ව්‍යාපාරයක් හෝ ඔහු අධ්‍යක්ෂවරයකු වන්නා වූ යම් සමාගමක් හෝ ඔහු හවුල්කරුවකු වන්නා වූ යම් ආයතනයක් හෝ විසින් තත් නියෝගය කොමිෂන් සභාව විසින් අවලංගු කරන තෙක් එම නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් චංචල හෝ නිශ්චල දේපළක් පිළිබඳ අයිතිය හෝ සම්බන්ධතාවක් පැවරීමෙන් (මෙහි "තහනම් නියෝගය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලිඛිත නියෝගයක් මගින් තහනම් කරනු ලැබිය හැකි මෙන්ම-

**(i)** නිශ්චල දේපළක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, එම නිශ්චල දේපළ පිහිටි පළාතේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත;

**(ii)** මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 204 වන වගන්තිය යටතේ පත් කරන ලද මෝටර් වාහන කොමසාරිස්වරයා වෙත; සහ

**(iii)** යම් සමාගමක කොටස්, ස්කන්ධ හෝ ණය පත්‍ර සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, 2007 අංක 07 දරන සමාගම් පනතේ 471 වන වගන්තිය යටතේ පත් කරන ලද සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සහ එම සමාගමේ ලේකම්වරයා වෙත,

ඇතුළුව කොමිෂන් සභාව විසින් යෝග්‍ය බවට සලකනු ලබන එවැනි යම් අධිකාරියක් වෙත එම ලිඛිත නියෝගයේ පිටපතක් භාරදීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය;

(ආ) (අ) ඡේදය යටතේ නිකුත් කරනු ලබන තහනම් නියෝගයේ පිටපතක් භාර දී ඇත්තේ යම් අධිකාරියක් වෙත ද, එම අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයක හෝ වාර්තාවක එම පිටපත ලියාපදිංචි කිරීමට හෝ ගොනු

කිරීමට කටයුතු සලස්වන ලෙස ලිඛිත නියෝගයක් මගින් නියම කරනු ලැබිය හැකි ය;

(ඇ) 42 වන වගන්තිය යටතේ යම් තොරතුරක් හෝ පැමිණිල්ලක් හෝ සන්නිවේදනයක් ලැබී ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එවැනි යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් පිටවීම වැළැක්වීම සඳහා ලිඛිත නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන, මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා, විදේශ ගමන් බලපත්‍රය සහ වෙනත් සංචාරක ලේඛන භාරයට ගන්නා ලෙස හෝ වෙනත් අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙස (351 වන අධිකාරය වූ) ආගමන හා විගමන පනතේ 4 වන වගන්තිය යටතේ පත් කරන ලද ආගමන හා විගමන පාලකවරයා වෙත ලිඛිත නියෝගයක් මගින් නියම කරනු ලැබිය හැකි ය; සහ

(ඈ) 42 වන වගන්තිය යටතේ යම් තොරතුරක් හෝ පැමිණිල්ලක් ලැබී ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එවැනි යම් තැනැත්තකු ලිඛිත නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටවීම වැළැක්වීම සඳහා අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙස ලිඛිත නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන යම් පොලිස් නිලධරයකු වෙත ඔහුගේ නමින් හෝ ධුරයෙන් ලිඛිත නියෝගයක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින් එම තහනම් නියෝගය බලාත්මකව පවතින මාස තුනක කාලසීමාව තුළ දී, එම තහනම් නියෝගය තහවුරු කිරීම සඳහා මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය වේ නම් එම මුල් මාස තුනක කාලසීමාව දීර්ඝ කිරීමක් ඉල්ලා සිටිනු ලැබිය යුතු ය.

(3) එවැනි තහනම් නියෝගයක් තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් හේතු පවතින බවට මහාධිකරණය විසින් සෑහීමට පත් වන අවස්ථාවක දී, මහාධිකරණය විසින් එම තහනම් නියෝගය තහවුරු කරනු ලැබිය හැකි අතර එය දීර්ඝ කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, -

(අ) එම අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය හැකි වෙනත් යම් නියෝගවලට යටත්ව; සහ

(ආ) එසේ ප්‍රදානය කරන ලද දීර්ඝ කිරීමක උපරිම කාලසීමාව කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන තහනම් නියෝගය ලබා ගැනීමේ දින සිට වසර එකක් නොඉක්මවනු ලැබිය යුතු බවට වූ නියම කිරීමට යටත්ව,

මහාධිකරණය විසින් අවශ්‍ය බවට සලකනු ලබන යම් කාලසීමාවක් සඳහා දීර්ඝ කිරීම ප්‍රදානය කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, මේ වගන්තිය යටතේ වූ යම් වරදක් සඳහා අධිචෝදනාවක් ගොනුකර ඇති අවස්ථාවක දී, එම වරද සම්බන්ධයෙන් වූ නඩු විභාගය අවසන් වන තෙක් හෝ එම වරද සම්බන්ධ වරදකරු කිරීමට එරෙහිව අභියාචනයක් යොමුකර ඇති අවස්ථාවක දී, අභියාචනයේ තීරණය ලැබෙන තෙක් එම නියෝගය හේතු වාර්තා කරමින් මහාධිකරණය විසින් අවලංගු කර ඇත්නම් මිස, අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු ය.

(4) මහාධිකරණය විසින් (3) වන උපවගන්තිය යටතේ යම් තහනම් නියෝගයක් තහවුරු කරනු ලබන අවස්ථාවක දී, සද්භාවී තුන්වන පාර්ශ්වයකට තහනම් නියෝගයේ විෂය වස්තුව වන ගිණුම, දේපළ හෝ ආයෝජනය සම්බන්ධයෙන් වූ ස්වකීය හිමිකම්පෑම් තහවුරු කිරීම පිණිස මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම පහසු කරලීමේ අරමුණින්, මහාධිකරණය විසින් එම නියෝගය පිළිබඳ නිවේදනයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ වන යටත් පිරිසෙයින් එක් පුවත්පතක හෝ පළ කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(5) මේ පනත යටතේ යම් චංචල දේපළක් තහනමට ගෙන ඇති අවස්ථාවක දී, එම චංචල දේපළ තහනමට ගනු ලැබුවේ යම් තැනැත්තකුගේ සන්තකයකින්, භාරයකින් හෝ පාලනයකින් ද, එසේ එම තැනැත්තාගේ සන්තකයෙන්, භාරයෙන් හෝ පාලනයෙන් එම චංචල දේපළ ඉවත් කිරීමෙන් සහ කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් තැනැත්තකුගේ හෝ අධිකාරයක හෝ ස්ථානයක තැබීම මගින් තහනමට ගැනීම බලාත්මක කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ යම් දේපළක් ඉවත් කිරීම බලාත්මක කිරීම ප්‍රායෝගික නොවන හෝ අන්‍යාකාරයකින් යෝග්‍ය නොවන බව කොමිෂන් සභාවට සෑහීමට පත් වන අයුරින් පෙනී

යන අවස්ථාවක දී, එම දේපළ තහනමට ගනු ලැබූ ස්ථානයේ, කොමිෂන් සභාවේ යම් බලයලත් නිලධරයකුගේ භාරය යටතේ කොමිෂන් සභාව විසින් එය ඒ අයුරින් තබනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (10) වන උපවගන්තියේ සඳහන් යම් චංචල දේපළක් ඇතුළු යම් චංචල දේපළක් මේ පනත යටතේ තහනමට ගෙන ඇති අවස්ථාවක දී, තහනමට ගැනීම බලාත්මක කළ නිලධරයා හැර කොමිෂන් සභාවේ යම් බලයලත් නිලධරයකු විසින්-

(අ) පනවනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව සහ මුදා හැරීම සඳහා බලය ලබා දී ඇති නිලධරයා විසින් කරනු ලබන ඉල්ලීම මත චංචල දේපළ භාරදෙනු ලබන බව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ඇපකරයක් සැපයීමට යටත්ව සහ යම් නියම සහ කොන්දේසි ඇත්නම් එම නියම සහ කොන්දේසි සමඟ අනුකූලව ක්‍රියා කිරීමට යටත්ව චංචල දේපළ එහි අයිතිකරු වෙත හෝ එම දේපළෙහි සන්තකය, භාරකාරත්වය හෝ පාලනය තහනමට ගනු ලැබුවේ යම් තැනැත්තකුගෙන් ද එම තැනැත්තා වෙත හෝ එම දේපළ සඳහා හිමිකම් දරන යම් තැනැත්තකු වෙත තාවකාලිකව ආපසු භාරදීම කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) එසේ චංචල දේපළ ආපසු භාර දෙනු ලබන තැනැත්තාට එම දේපළ බැහැර කිරීමේ නිදහස සහිතව, එම දේපළ සඳහා එම දේපළ එසේ ආපසු භාර දෙනු ලබන දිනයේ පැවති විවෘත වෙළෙඳපොළ වටිනාකම නියෝජනය කරනු ලබන මුදලකට වඩා අඩු නොවන මුදලක් සඳහා ඇපකරයක් සැපයීමක් සහිතව එම චංචල දේපළ එහි අයිතිකරු වෙත හෝ එම දේපළේ සන්තකය, භාරකාරත්වය හෝ පාලනය තහනමට ගනු ලැබුවේ යම් තැනැත්තකුගෙන් ද එම තැනැත්තා වෙත හෝ ඒ සඳහා හිමිකම් ඇති යම් තැනැත්තකු වෙත එම චංචල දේපළ ආපසු භාරදෙනු ලැබිය හැකි ය.

(7) යම් චංචල දේපළක් තාවකාලිකව ආපසු භාර දී ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, එවැනි යම් තැනැත්තකු විසින් ඉල්ලා

සිටීමේ දී එම දේපළ ආපසු භාරදීමට අපොහොසත් වන අවස්ථාවකදී හෝ එම ඡේදය යටතේ පනවා ඇති යම් නියම හෝ කොන්දේසි සමග අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක දී-

(අ) එම දේපළ සම්බන්ධයෙන් සපයා ඇති ඇපකරය රජය සතු කිරීම කරනු ලැබිය යුතු ය; සහ

(ආ) එවැනි තැනැත්තකු අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකින් සහ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩ මුදලකින් හෝ එම දඩ මුදල සහ බන්ධනාගාරගත කිරීම යන දෙකින් ම දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරන්නේ ය.

(8) (7) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි තාවකාලිකව ආපසු භාර දී ඇති දේපළක් සම්බන්ධයෙන් අධිකරණය විසින් රජය සතු කිරීමේ නියෝගයක් නිකුත් කර ඇති අවස්ථාවක දී, එම දේපළ ආපසු භාර දී ඇත්තේ යම් තැනැත්තකු වෙත ද එම තැනැත්තා විසින් සපයන ලද ඇපකරය රජය සතු කිරීම මගින් එම රජය සතු කිරීම බලාත්මක කරනු ලැබිය යුතු ය.

(9) මේ පනත යටතේ තහනමට ගත් යම් චංචල දේපළකට එරෙහිව, නඩු පවරනු ලැබීමට අපේක්ෂිත තැනැත්තා හැර වෙනත් යම් තැනැත්තකුගේ ක්‍රියාකාරිත්වයේ හෝ භාරයේ හෝ පාලනය යටතේ වූ මුදල්, කොටස්, සුරැකුම්පත්, ස්කන්ධ, ණය පත්‍ර හෝ වෙනත් යම් තේරීම්වලින් සංයුක්ත වන අවස්ථාවක දී,-

(අ) එම වෙනත් යම් තැනැත්තා එම දේපළ භාවිත කිරීම, පැවරීම හෝ ගනුදෙනු කිරීම තහනම් කරමින්; හෝ

(ආ) එම නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට සහ එසේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් ඇතුළත එම දේපළ කොමිෂන් සභාව වෙත භාර කරන ලෙස එම තැනැත්තා වෙත නියම කරමින්,

එම වෙනත් යම් තැනැත්තා වෙත නියෝගයක් භාරදීම මගින් කොමිෂන් සභාවේ බලයලත් නිලධරයකු විසින් තහනමට ගැනීම බලාත්මක කරනු ලැබිය යුතු ය.

(10) තහනමට ගනු ලැබූ යම් චංචල දේපළක් වේගයෙන් විනාශවීමට හෝ විකෘතිවීමට යටත් වේ නම් හෝ අපහසුවකින් තොරව එම දේපළ නඩත්තු කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, සහ (6) වන උපවගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු හෝ විසින් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දී, මහාධිකරණය විසින් එම දේපළ විකිණීමට හෝ විකිණීමට සලස්වන ලෙස සහ එම අධිකරණය විසින් තීරණය කරනු ලබන ආකාරයට විකිණීමෙන් ලැබෙන විකුණුම් පිරිවැය රඳවා තබා ගැනීමට නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද මේ පනත යටතේ සිදුවන ඕනෑම නීති කෘත්‍යයකින් ලැබෙන ආදායමෙන් දේපළ නඩත්තු කිරීම සහ විකිණීම සඳහා වන ඕනෑම පිරිවැයක් හෝ වියදමක් අඩු කිරීමට මහාධිකරණයට නියෝග කළ හැකිය.

(11) තහනම් නියෝගයක් බලපවත්වනු ලබන ඕනෑම ගිණුමක්, දේපළක් හෝ ආයෝජනයක් සම්බන්ධයෙන් ගනුදෙනුවක් සිදු නොකළ යුතු අතර එසේ ක්‍රියාත්මක කරනු ලබන ඕනෑම ගනුදෙනුවක් ශුන්‍ය සහ බල රහිත වේ.

(12) මේ වගන්තිය යටතේ තහනම් නියෝගයක් කිරීමට පෙර, එවැනි නියෝගයක් මගින් බලපෑමට ලක් වූ යම් තැනැත්තකුගේ නීත්‍යනුකූල ව්‍යාපාරයට හෝ වෙනත් අවශ්‍යතාවලට හානි විය හැකි බව ඒ වෙනුවෙන් කරනු ලබන ඉල්ලීමක් මත මහාධිකරණයේ මතය වන්නේ නම්, එවැනි ගිණුමක්, දේපළක් හෝ ආයෝජනයකට අදාළ ඕනෑම අත්‍යවශ්‍ය ගනුදෙනුවක් එම අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි පරිදි කොමිෂන් සභාව විසින් බලය පවරන ලද නිලධරයකුගේ අධීක්ෂණයට යටත්ව සහ මඟපෙන්වීම යටතේ සිදු කිරීමට අවසර ලබා දීමේ නියෝගයක් කිරීමට මහාධිකරණයට හැකි ය.

ශ්‍රී ලංකාවෙන් පිටත දී දේපළ ගනුදෙනු කිරීම තහනම් බව

**54.** යම් දේපළක් මේ පනත යටතේ වූ යම් වරදක වස්තු විෂයය බව හෝ එවැනි යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් භාවිත කර ඇති බව සහ එම දේපළ ශ්‍රී ලංකාවෙන් පිටත දරන බවට හෝ තැන්පත් කර ඇති බවට කොමිෂන් සභාව විසින් සෑහීමට පත් වන

අවස්ථාවක දී, එම දේපළ දරනු ලබනුයේ යම් තැනැත්තකු විසින් ද එම තැනැත්තා විසින් හෝ එම දේපළ තැන්පත් කර ඇත්තේ යම් තැනැත්තකු වෙත ද එම තැනැත්තා විසින් එම දේපළ ගනුදෙනු කිරීම තහනම් කරමින් නියෝගයක් ලබා ගැනීම පිණිස කොමිෂන් සභාව විසින් මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

විශේෂ විමර්ශන ක්‍රමවේද

**55.** (1) මේ පනතේ 42 වන වගන්තිය යටතේ වූ යම් විමර්ශනයක දී, කොමිෂන් සභාව විසින් පහත දේ ඇතුළුව යම් විමර්ශන ක්‍රමවේද භාවිත කරනු ලැබිය හැකි ය; එනම්-

(අ) කොමිෂන් සභාව වෙත අල්ලසක් ඉල්ලා සිටීමක් පිළිබඳ වාර්තා කර ඇති යම් තැනැත්තකුට ඉල්ලා සිටි ආකාරයට සෘජුව හෝ වක්‍රව එම අල්ලස, ලබා දීමට හෝ එය ලබා ගැනීමට බලය ලබාදීම;

(ආ) ආවේක්ෂණය සහ නිරීක්ෂණය;

(ඇ) ආවරණ මෙහෙයුම්;

(ඈ) දෘශ්‍ය පටිගත කිරීම්; හෝ

(ඉ) ඇහුම්කන් දීම සහ රහසිගත ශ්‍රව්‍ය පටිගත කිරීමේ උපාංග භාවිතය.

(2) (1) වන උපවගන්තියේ (ඈ) සහ (ඉ) ඡේදවල කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් මහාධිකරණයෙන් ඒකපාර්ශ්විකව නියෝගයක් ලබාගත යුතු ය. මහාධිකරණය වෙත කරනු ලබන සෑම ඉල්ලීමක් ම සම්බන්ධයෙන් වූ රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර ඒ හා සම්බන්ධ නඩු කටයුතු රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

තොරතුරු ආරක්ෂාව සහ සංරක්ෂණය

**56.** දත්ත පණිවුඩ, විද්‍යුත් ලේඛන, විද්‍යුත් පටිගත කිරීම් හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයේ වෙනත් යම් සන්නිවේදනයක් මාර්ගයෙන් කොමිෂන් සභාව විසින් ලබාගන්නා හෝ රැස්කරගනු ලබන තොරතුරු ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා නිර්ණායක කොමිෂන් සභාව විසින් රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

සේවා සපයන්නන්ගෙන් තොරතුරු ලබා ගැනීම

**57.** කොමිෂන් සභාවේ අදහස අනුව එවැනි තොරතුරු මේ පනත යටතේ වූ යම් වරදක් ලෙස සැලකිය හැකි යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් පවත්වන විමර්ශනයක දී ප්‍රයෝජනවත් විය හැකි අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, යම් විදුලි සංදේශන, සැටලයිට්, ඩිජිටල් සේවා හෝ දත්ත සේවා සපයන්නකු වෙත-

(අ) එකී සේවා සපයන්නා විසින් යම් තැනැත්තකු වෙත සපයනු ලබන හෝ සපයමින් සිටින සේවාවලට අදාළ තොරතුරු ලබාදෙන ලෙස;

(ආ) එම සේවා ලබා දී ඇති යම් තැනැත්තකු විසින් භුක්ති විඳිනු ලබන සේවාවලට අදාළ තොරතුරු සපයන ලෙස;

(ඇ) එවැනි යම් සේවා සපයන්නකු විසින් ගබඩා කරනු ලැබිය ලේඛනාගාරගත කළ හැකි වන හෝ අන්‍යාකාරයකින් තැබිය හැකි යම් තොරතුරු, දත්ත හෝ ලේඛන හෝ වාර්තා සපයන ලෙස; සහ

(ඈ) එම සේවා සපයන්නා විසින් සපයනු ලබන සේවා හරහා යම් උපකරණයක් වෙත හෝ උපකරණයකින් දත්ත හෝ තොරතුරු බාගත කිරීම හෝ අත්පතනය කිරීමට අදාළ තොරතුරු සපයන ලෙස,

නියම කරනු ලැබිය හැකි ය.

සන්නිවේදන අවහිර කිරීම

**58.** (1) යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ වූ වරදක් සිදු කර ඇති බවට, සිදු කරමින් සිටින බවට හෝ සිදු කිරීමට අත්‍යාසන්න බවට සැක කිරීමට හෝ විශ්වාස කිරීමට කොමිෂන් සභාවේ යම් බලයලත් නිලධරයකු වෙත සාධාරණ හේතු පවතින්නේ නම්, යම් ක්‍රියාකලාපයක් රහස්‍ය නියාමනය කිරීම සඳහා සහ යම් සන්නිවේදනයක් පටිගත කිරීම පිණිස බලය පවරනු ලබන අධිකාරී පත්‍රයක් ලබා ගැනීම සඳහා කොමිෂන් සභාවේ යම් බලයලත් නිලධරයකු විසින් මහාධිකරණය වෙත ලිඛිතව ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලිඛිත ඉල්ලීමක් ලැබීමෙන් පසුව, එම තැනැත්තා පිළිබඳ විදුලි සංදේශනය ඇතුළු ඕනෑම ක්‍රමයකින් හැසිරීම් සහ සන්නිවේදන රහස්‍ය නියාමනය සහ

වාර්තා කිරීම සඳහා බලය පැවරීමට සාධාරණ වූ සැක කටයුතු හේතු හෝ විශ්වාසයක් පවතින බවට සෑහීමට පත්වීමෙන් පසුව, මහාධිකරණ විනිසුරුවරයකු විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය. මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර ඒ හා සම්බන්ධ නඩු කටයුතු ඒකපාර්ශ්වික සහ රහසිගත ලෙස පවත්වනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක් බලයලත් නිලධරයා විසින් තත්කාර්ය සඳහා කරන ලද තවදුරටත් වූ ඉල්ලීමක් මගින් අලුත් කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන යම් අවසර පත්‍රයක් මගින්,-

(අ) අවසර පත්‍රය ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා විවෘත ලෙස හෝ රහසිගත ලෙස ඇතුළු වීම සඳහා හෝ අලුත් කරන ලද අවසර පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, අවසර පත්‍රයේ සඳහන් යම් ස්ථානයක් වෙත අවශ්‍ය වේ නම් බලෙන් නැවත ඇතුළු වීම සඳහා; සහ

(ආ) අලුත් කරන ලද අවසර පත්‍රයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, මුල් අවසර පත්‍රයට අනුගාමීව නියාමනය සහ වාර්තා කිරීම අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා,

යම් නිලධරයකු වෙත බලය පවරනු ලැබිය හැකි ය.

(5) අවස්ථානුගත කරුණු අනුව (1) වන උපවගන්තිය යටතේ වූ ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සාධාරණ ලෙස ප්‍රායෝගික නොවේ නම්, වාචික ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(6) ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය කොමිෂන් සභාව විසින් රීති මගින් නිශ්චිතව දක්වනු ලබන පරිදි විය යුතු ය.

(7) කොමිෂන් සභාව විසින් මේ පනතේ විධිවිධාන යටතේ කරන ලද යම් පටිගත කිරීමක් මේ පනතේ කාර්ය සඳහා පමණක් භාවිත කරනු ලබන බවට වගබලා ගනු ලැබිය යුතු ය.

දත්ත සහ තොරතුරු සම්බන්ධව ඇති අවහිර කිරීම් ඉවත් කිරීම

**59.** අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ පනත යටතේ-

(අ) වරදක් සිදු කර ඇති තැනැත්තකුගේ අනන්‍යතාවය නිශ්චය කිරීමේ කාර්යය සඳහා;

(ආ) වරදක් සිදු කර ඇති තැනැත්තකු සිටින ස්ථානය නිශ්චය කිරීමේ කාර්ය සඳහා;

(ඇ) වරදක් පිළිබඳ විමර්ශනයක් පැවැත්වීම සඳහා පහසුකම් සැලැස්වීමේ කාර්ය සඳහා;

(ඈ) වරදක් සිදු කර ඇති තැනැත්තකුට එරෙහිව සාක්ෂි රැස් කිරීමේ කාර්ය සඳහා;

(ඉ) එක් තැනැත්තකු විසින් හෝ තැනැත්තන් වැඩි දෙනකු විසින් වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කරමින්, සැලසුම් කරමින්, සූදානම් වෙමින් හෝ උත්සාහ කරමින් සිටී ද යන්න නිශ්චය කිරීමේ කාර්ය සඳහා; හෝ

(ඊ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම වැළැක්වීම සඳහා පියවර ගැනීමේ කාර්ය සඳහා,

පහත දැක්වෙන පරිදි කොමිෂන් සභාව වෙත බලය පවරන ලෙස මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය; එනම්-

(i) යම් සන්නිවේදනයකට හෝ දත්ත ගබඩා සේවා හෝ දත්ත හෝ තොරතුරු උපාංගවලට අදාළ සේවාවන් අවහිර කිරීමේ හෝ කේතවලට හැරවීමේ සේවා සපයනු ලබන යම් තැනැත්තකු වෙත එවැනි සේවා අවහිර කිරීම ඉවත් කරන ලෙස හෝ කේතවලට හැරවීම ඉවත් කරන ලෙස සහ එහි අන්තර්ගත තොරතුරු සපයන ලෙස විධාන කිරීම සඳහා කොමිෂන් සභාව වෙත බලය පවරන ලෙස;

(ii) යම් තැපැල් පණිවුඩයක් හෝ විද්‍යුත් තැපෑලක් හෝ දුරකතන, හඬ, අන්තර්ජාල හෝ දෘශ්‍ය සංවාද හෝ සම්මන්ත්‍රණ හෝ වෙනත් යම් මාධ්‍යයක් හරහා ලැබෙන

ඕනෑම සන්නිවේදනයක් රඳවා ගන්නා ලෙස, කියවන ලෙස, සවන්දෙන ලෙස හෝ පටිගත කරන ලෙස විධාන කිරීම සඳහා කොමිෂන් සභාව වෙත බලය පවරන ලෙස; හෝ

(**iii**) යම් හුවමාරු හෝ පැවරීම් පද්ධතියක පවතින යම් සාදෘශ්‍යය හෝ ඩිජිටල් දත්ත හෝ තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා කොමිෂන් සභාව වෙත බලය පවරන ලෙස,

වේ.

විමර්ශනවල දී සහාය

**60.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, පොලිස් නිලධරයකු හැර වෙනත් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වටිනාකම රුපියල් දස දහසක් නොඉක්මවන යම් අල්ලසක් ඉල්ලා සිටීමේ, පිළිගැනීමේ හෝ පිරිනැමීමේ ක්‍රියාවන් සංයුක්ත, වරදක් සිදුකර ඇති බවට සැක කිරීමට සාධාරණ හේතු පවතින බවට කොමිෂන් සභාව සෑහීමට පත් වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, එම නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන ආකාරයෙන් හෝ ක්‍රමයකින් ඒ කාරණය සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වන ලෙස එම නියෝගයේ නම් සඳහන් සහකාර පොලිස් අධිකාරීවරයකුගේ තත්ත්වයේ හෝ ඊට ඉහළ යම් පොලිස් නිලධරයකු හෝ යම් බලයලත් නිලධරයකු වෙත නියම කරනු ලැබිය හැකි ය. එම නියෝගය මගින් යම් බැංකු ගිණුමක්, කොටස් ගිණුමක්, මිල දී ගැනීම් ගිණුමක්, වියදම් ගිණුමක් හෝ වෙනත් යම් ගිණුමක් හෝ යම් බැංකුවක පවතින ආරක්ෂක සේප්පුවක් විමර්ශනය කිරීම සඳහා බලය පවරනු ලැබිය හැකි අතර, එසේ බලය පවරනු ලැබ ඇති නිලධරයා විසින් නියම කරනු ලබන පරිදි එවැනි යම් හෝ සියලු තොරතුරු හෝ ගිණුම් හෝ ලේඛන හෝ ලිපි යම් තැනැත්තකු විසින් හෙළිදරව් කිරීම හෝ ඉදිරිපත් කිරීම සඳහා එම බලය ප්‍රමාණවත් බලයක් විය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ මෙහෙයවීම මත යම් වරදක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ ආරම්භ කරන ලද යම් විමර්ශනයක් සම්බන්ධයෙන් උපදෙස් සැපයීම, විධාන ලබා දීම හෝ කවර හෝ අදියරක දී භාරගෙන එකී විමර්ශනය මෙහෙයවීම සහ මගපෙන්වීම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ විමර්ශනය අවසන් වීමෙන් පසුව, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ විමර්ශනයක් පවත්වන ලෙස, කොමිෂන් සභාව විසින්, ඉල්ලා සිටිනු ලැබුවේ යම් පොලිස් නිලධරයකු වෙතින් ද, එම පොලිස් නිලධරයා විසින් එම විමර්ශනය පිළිබඳ කොමිෂන් සභාව වෙත ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම වාර්තාවේ පහත සඳහන් කාරණා අන්තර්ගත විය යුතු ය. එනම්:-

(අ) කාරණයට අදාළ අවස්ථාවෝචිත කරුණු පිළිබඳ සම්පූර්ණ ප්‍රකාශයක්;

(ආ) සියලු සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශවල පිටපත්; සහ

(ඇ) අදාළ විය හැකි හෝ කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු, ලේඛන, හෝ ඉදිරිපත් කිරීම්.

(4) කොමිෂන් සභාව විසින් 65 වන වගන්තිය යටතේ පියවර ගනු ලැබීමට හැකි වන පරිදි මේ වගන්තිය යටතේ පවත්වන ලද යම් විමර්ශනයක ප්‍රතිඵල කොමිෂන් සභාව වෙත වහාම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

හවුල් විමර්ශන

**61.** (1) අවස්ථානුගත කරුණු යටතේ එසේ සාධාරණීකරණය කරනු ලබයි නම්, මේ පනතේ 41 වන වගන්තිය යටතේ උද්දේශිත යම් වරදක් පිළිබඳ විමර්ශනයක් පැවැත්වීමේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකාව තුළ පවතින වෙනත් යම් විමර්ශන අධිකාරියක් අතර යම් ගිවිසුමක් ඇති කර ගැනීම මගින් නිශ්චිත කාලසීමාවක් සඳහා හවුල් විමර්ශන කණ්ඩායම් සකස් කරනු ලැබිය හැකි ය.

(2) විදේශ රාජ්‍යයක් විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, පහත සඳහන් දේ පිළිබඳව හවුල් විමර්ශන කණ්ඩායම් ස්ථාපිත කරනු ලැබිය හැකි ය; එනම්:-

(අ) ශ්‍රී ලංකාව සහ වෙනත් විදේශ රාජ්‍ය පාර්ශ්වයන් වන්නා වූ ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික ගිවිසුම් හෝ වැඩපිළිවෙළ යටතට ගැනෙන කාරණා; හෝ

(ආ) එවැනි ගිවිසුම් හෝ වැඩපිළිවෙළ නොමැති අවස්ථාවක දී, සිදු වීමෙන් සිදුවීම මත පදනම්ව ක්‍රියාකිරීම.

(3) පහත සඳහන් අවස්ථාවල දී, එනම්:-

(අ) විමර්ශන නීතිය බලාත්මක කිරීම, නියාමන කාර්ය සහ නඩු පැවරීම යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, යම් විමර්ශනයක නියැලී සිටින නියෝජිත ආයතන හෝ රාජ්‍ය විසින් සම්බන්ධීකරණය සහ සමගි කිරීම අවශ්‍ය වන එකම විෂය වස්තුවක් මත විමර්ශන පවත්වනු ලබන අවස්ථාවක දී; සහ

(ආ) (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, විමර්ශන කටයුතු ශ්‍රී ලංකාවේ දී සහ වෙනත් යම් රාජ්‍යයක එකවර පවත්වනු ලැබිය යුතු වන අවස්ථාවක දී,

හවුල් විමර්ශන කණ්ඩායම් පිහිටුවනු ලැබිය හැකි ය.

(4) විමර්ශනයට යටත් වූ තැනැත්තන් නිසි අධිකරණ බලය ඇති අධිකරණවල දී විභාගයට භාජනය කරන අවස්ථාවල දී, හවුල් විමර්ශන තුළ දී ලබාගත් තොරතුරු එකී නිසි අධිකරණ බලය සහිත අධිකරණ විසින් භාවිත කරනු ලැබිය හැකි ය.

තොරතුරු හෙළි කිරීම් සහ හවුල් භාවිතය

**62.** (1) මේ පනතේ විධිවිධාන යටතේ ලැබුණු යම් තොරතුරක මූලාශ්‍රය හෝ එම තොරතුර ලබාගත් ආකාරය හෙළිදරව් කිරීමට කොමිෂන් සභාවට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ කොමිෂන් සභාවේ වෙනත් යම් නිලධරයකුට හෝ සේවානියුක්තයකුට හෝ 27 වන වගන්තිය යටතේ සේවය ලබාගෙන ඇත්තේ යම් තැනැත්තකුගෙන් ද, එම තැනැත්තාට බල කරනු නොලැබිය යුතු ය.

(2) ජාත්‍යන්තර ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික ගිවිසුම් හෝ වැඩපිළිවෙළ යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට හෝ එවැනි ගිවිසුම් හෝ වැඩපිළිවෙළ නොමැති අවස්ථාවක දී, එක් එක් සිද්ධිය මත පදනම්ව, විදේශීය රාජ්‍යයක නීතිය යටතේ වන විමර්ශනයක

අපරාධ නඩු කටයුත්තක කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින්, යම් විමර්ශනයකට අදාළ තොරතුරු, යම් දේශීය නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් හෝ වෙනත් යම් රජයේ අධිකාරියක් හෝ වෙනත් යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් සමඟ හුවමාරු කරගනු ලැබිය හැකි ය.

ජාත්‍යන්තර සහයෝගීතාව

**63.** (1) කොමිෂන් සභාව විසින්-

(අ) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ දී, යම් කාරණයක් හෝ සම්බන්ධිත කාරණයක් පිළිබඳව විදේශ රාජ්‍යවල පවතින අපරාධ විමර්ශන අධිකාරීන් හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් සමඟ සම්ප්‍රේෂණය කරනු ලැබිය හැකි ය; සහ

(ආ) කොමිෂන් සභාව සහ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් වී ඇති යම් ගිවිසුමක් හෝ වැඩපිළිවෙළක් යටතේ එවැනි තොරතුරු හුවමාරු කර ගැනීම හා සම්බන්ධ යම් ආයතන, නියෝජිත ආයතන හෝ පුද්ගල මණ්ඩල අතර පවතින යම් ගිවිසුමක හෝ වැඩපිළිවෙළක සඳහන් යම් නියම හා කොන්දේසි මත, කොමිෂන් සභාවේ බලතල සහ කාර්යයන්ට සමාන බලතල හා කාර්ය සහිත යම් විදේශීය රාජ්‍යයක ආණ්ඩුවක් විසින් පිහිටුවනු ලබන යම් ආයතනයක් හෝ නියෝජිත ආයතනයක් හෝ විදේශීය රාජ්‍යයක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ වෙනත් යම් ආයතනයක් හෝ නියෝජිත ආයතනයක් සමඟ එවැනි යම් වාර්තාවක් හෝ තොරතුරු හුවමාරු කරගනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින්,

(අ) කොමිෂන් සභාවේ බලතල සහ කාර්යයන්වලට සමාන බලතල සහ කාර්යයන් ඇති විදේශ රාජ්‍යයක යම් ආයතනයක් හෝ නියෝජ්‍යායතනයක් හෝ විදේශ රාජ්‍යයක රජයන් විසින් පිහිටුවන ලද ජාත්‍යන්තර සංවිධානයක් හෝ පුද්ගල මණ්ඩලයක් සමඟ; හෝ

(ආ) නීතිය බලාත්මක කිරීමේ විදේශීය නියෝජ්‍යායතනයක් සමඟ,

කොමිෂන් සභාව සහ ඒ ආයතනය, නියෝජ්‍යායතනය හෝ අධිකාරිය අතර තොරතුරු හුවමාරු කිරීම සම්බන්ධයෙන් ලිඛිතව යම් ගිවිසුමකට හෝ සැලසුමකට එළඹිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සන්නිවේදනය කරනු ලබන හෝ හුවමාරු කරගනු ලබන හෝ (2) වන උපවගන්තිය යටතේ එළඹෙන ලද ගිවිසුමක් හෝ වැඩපිළිවෙළක් යටතේ හුවමාරු කරනු ලබන තොරතුරු, එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතියෙන් ආවරණය වන වරදක් හෝ දූෂණයක් නැතහොත් එවැනි වරදකට සැලකිය යුතු ලෙස සමාන වූ වරදක් සම්බන්ධයෙන් වන විමර්ශනයකට, අපරාධ නඩු කටයුත්තකට හෝ නඩු කටයුත්තකට අදාළ වන බවට සැක කිරීමට කොමිෂන් සභාවට, ආයතනයට, නියෝජ්‍යායතනයට හෝ අධිකාරියට සාධාරණ හේතු ඇති යම් තොරතුරු විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් (2) වන උපවගන්තිය යටතේ එළඹෙනු ලබන ගිවිසුම් හෝ වැඩපිළිවෙළටඃ-

(අ) එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතියෙන් ආවරණය වන වරදක් හෝ දූෂණයක් හෝ එවැනි වරදකට සැලකිය යුතු ලෙස සමාන වූ වරදක් සංස්ථාපනය වන යම් ක්‍රියාවක් පිළිබඳ විමර්ශනය කිරීමට සහ අපරාධ නඩු පැවරීමට අදාළ කාර්ය සඳහා ලබාගත් තොරතුරු හෝ නඩු කටයුතු භාවිත කිරීම සම්බන්ධයෙන් වන සීමා කිරීම් ඇතුළත් විය යුතු ය; සහ

(ආ) හුවමාරු කරන ලද තොරතුරු සම්බන්ධයෙන් රහස්‍යභාවයෙන් යුතු ව කටයුතු කරනු ලැබිය යුතු බවට ද කොමිෂන් සභාවේ ප්‍රකාශිත කැමැත්ත නොමැතිව එම තොරතුරු වැඩිදුරටත් අනාවරණය නොකළ යුතු බවට ද වූ විධිවිධානයක් ඇතුළත් විය යුතු ය.

**64.** (1) කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන සෑම සිතාසියක් ම ලිඛිතව සහ අනුපිටපතක් සහිත විය යුතු අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් කළ යුතු අතර රීති මගින් නිශ්චිතව දක්වනු ලබන ආකෘතියකින් විය යුතු ය. සිතාසි

(2) සිතාසි -

(අ) ලියාපදිංචි තැපෑලෙන්;

(ආ) ශීඝ්‍රගාමී තැපෑලෙන්;

(ඇ) කොමිෂන් සභාව විසින් නියම කළ හැකි පරිදි ග්‍රාම නිලධරයකු විසින්;

(ඈ) සමාගමක් හෝ සංස්ථාවක් හෝ සංස්ථාපිත පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, කළමනාකාර අධ්‍යක්ෂවරයා, ලේකම්වරයා හෝ වෙනත් එවැනි සමාන නිලධරයකු හෝ ඒ සමාගමේ, සංස්ථාවේ හෝ සංගමයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය භාර තැනැත්තා වෙත;

(ඉ) රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක සේවානියුක්තයකු හෝ වන තැනැත්තකු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, එකී තැනැත්තා රජයේ නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ වන්නා වූ ආයතනයේ ප්‍රධානියා වෙත;

(ඊ) වෙනත් යම් තැනැත්තකු යටතේ සේවය කරන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන අවස්ථාවක ඒ තැනැත්තාගේ සේවායෝජකයා වෙත; හෝ

(උ) විද්‍යුත් තැපැල හෝ රූපාකාරය තිබේ නම් ඒ මගින්,

භාරදිය යුතු ය.

(3) සිතාසි භාරදිය යුතු තැනැත්තා නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමෙන් සොයාගත නොහැකි අවස්ථාවක, ඒ තැනැත්තාගේ පවුලේ යම් වැඩිහිටි සාමාජිකයකු වෙත හෝ ඒ තැනැත්තා සමඟ වාසය කරන තැනැත්තකු වෙත අනුපිටපතක් තබා යාමෙන් සිතාසි භාරදිය හැකි ය.

(4) නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීම මගින් (2) වන සහ (3) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති සේවාව සඵල කර ගැනීමට හැකි නොවන්නේ නම්, කොමිෂන් සභාව විසින් සිතාසි භාරදිය

යුතු තැනැත්තා සාමාන්‍යයෙන් පදිංචිව සිටින නිවසේ, ස්ථානයේ හෝ පරිශ්‍රයේ යම් ප්‍රකට ස්ථානයක සිතාසියේ අනුපිටපතක් ඇලවිය යුතු අතර එවැනි අවස්ථාවක දී සිතාසි නිසි ලෙස භාරදෙනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(5) යම් සිතාසියක් ලියාපදිංචි තැපෑලෙන් හෝ ශීඝ්‍රගාමී තැපෑලෙන් යවන අවස්ථාවක දී, ඒ සිතාසිය සඳහා අදාළ තැපැල් කාර්යාලය විසින් නිකුත් කළ කුවිතාන්සිය ඉදිරිපත් කිරීම තුළින් ඒ සිතාසිය භාරදිය නොහැකිව ආපසු හරවා එවා ඇත්නම් මිස ඒ සිතාසි ලැබුණ බවට බැලුබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(6) සිතාසියක් භාරදුන්නේ යම් තැනැත්තකු හට ද, ඒ සෑම තැනැත්තකු ම ඒ සිතාසියේ දක්වා ඇති පරිදි යම් ස්ථානයකට නියමිත වේලාවට කොමිෂන් සභාව හමුවට පැමිණිය යුතු අතර කොමිෂන් සභාව විසින් ඔහුට ඉදිරිපත් කරන යම් ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු අතර සිතාසියෙන් ඔහුට නියම කරන යම් ලේඛන හෝ වෙනත් ද්‍රව්‍ය ඉදිරිපත් කළ යුතු ය.

අපරාධ නඩු කටයුත්තක් පැවරීම

**65.** (1) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පවත්වන විමර්ශනයක දී ලැබුනු යම් දෙයකින් යම් තැනැත්තකු විසින් මේ පනතේ විධිවිධාන යටතේ වරදක් සිදු කිරීම හෙළිදරව් වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, නිසි අධිකරණයක දී ඒ තැනැත්තාට එරෙහිව අපරාධ නඩු කටයුත්තක් පවරන ලෙසට අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියෝග කළ හැකි අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ අනුව නඩු කටයුත්තක් පැවරිය යුතු යඃ

එසේ වුව ද, යම් තැනැත්තකු විසින් රුපියල් දස දහසක් නො ඉක්මවන වටිනාකමක් ඇති අල්ලසක් අයදීම, පිළිගැනීම, ප්‍රතිග්‍රහණය කිරීම ඇතුළත් වන මේ පනත යටතේ වරදක් හෙළිදරව් වන කරුණු කොමිෂන් සභාව විසින් පවත්වන විමර්ශන ක්‍රියාවලියක දී කොමිෂන් සභාව විසින් සොයාගත් අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් අදාළ මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ ඒ තැනැත්තාට එරෙහිව නඩු කටයුත්තක් පැවරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියෝග කළ යුතු අතර රුපියල් දස දහසක් ඉක්මවන වටිනාකමක් ඇති අල්ලසක් අයදීම, පිළිගැනීම, ප්‍රතිග්‍රහණය කිරීම ඇතුළත් වන මේ පනත යටතේ වරදක් සිදු කිරීම එකී කරුණු මගින් හෙළිදරව් වන විට දී කොමිෂන්

සභාව විසින්, අධිචෝදනාවක් මගින් මහාධිකරණයේ ඒ තැනැත්තාට එරෙහිව නඩු කටයුත්තක් පැවරීමට නියෝග කළ යුතු ය. මූල්‍යමය වශයෙන් ගණනය කළ නොහැකි අල්ලසක් වන වෙනත් සියලු අවස්ථාවල දී අදාළ මහාධිකරණයේ දී නඩු කටයුත්තක් පවරනු ලැබිය යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක එරෙහිව කුමක් සඳහන් වුව ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් කළ චෝදනා පත්‍රයක් මගින් මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුත්තක් පැවරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට මේ වගන්තියේ (1) වන උපවගන්තියට අනුකූලව බලතල තිබිය යුතු අතර 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තිය මේ වගන්තියේ කාර්යය සඳහා අදාළ නොවිය යුතු ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 162 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් කළ යම් චෝදනා පත්‍රයක් සඳහා අදාළ කර ගත යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ චෝදනා පත්‍රයක් හරහා නඩුවක් ගොනු කිරීමෙන් පසුව, මහෙස්ත්‍රාත්වරයා විසින්-

(අ) චූදිතයාට ඔහු ඉදිරියේ පෙනී සිටීමට හෝ චූදිතයා ඔහු ඉදිරියට ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්විය යුතු ය;

(ආ) චෝදනා පත්‍රය මත නඩු පවරනු ලැබිය යුතු එක් එක් චූදිතයා හට චෝදනා පත්‍රයේ පිටපතක් ඇමුණුම් ද සහිතව ලබාදීමට කටයුතු සැලැස්විය යුතු ය;

(ඇ) නඩුවේ විභාග දිනය චූදිතයාට දැනුම් දිය යුතු ය;

(ඈ) චූදිතයා අධිකරණයට ඉදිරිපත් කරන හෝ පෙනී සිටින අවස්ථාවක දී, චූදිතයාට චෝදනාව කියවා පැහැදිලි කර දිය යුතු අතර චෝදිත වරදට ඔහු වැරදිකරු ද නැතහොත් නිවැරදිකරු ද යන්න විමසිය යුතු ය;

(ඉ) චූදිතයා වරදකරු යැයි ප්‍රකාශ කර සිටින්නේ නම් සහ ඔහුගේ ආයාචනයේ බලපෑම ඔහු නිවැරදිව අවබෝධ කරගෙන ඇති බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන බව පෙනී යන්නේ නම්, වරදකරු බවට තීන්දුව සටහන් කර අදාළ නීතියේ විධිවිධාන අනුව ඔහුට දඬුවමක් පනවා ඒ දඬුවම සටහන් කළ යුතු ය; සහ

(ඊ) චූදිතයා ආයාචනයක් නොකරන්නේ නම් හෝ ඔහු වරදකරුවකු නොවන බවට අයැද සිටින්නේ නම්, ඔහුට විරුද්ධව නඩුව විභාග කළ යුතු අතර 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන මේ පනත යටතේ වැරදි සඳහා මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන නීති කෘත්‍යක දී අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගත යුතු ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් කළ අධිචෝදනාවක් මගින් (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින් කළ විධානයකට අනුකූලව මහාධිකරණයක දී නඩු කටයුත්තක් පවරන අවස්ථාවක දී, ඒ අධිචෝදනාව ලැබුණු පසු ඒ අධිචෝදනාව ඒ මහාධිකරණයට නීතිපතිවරයා විසින් ඉදිරිපත් කළ අධිචෝදනාවක් ලෙසින්, ඒ අධිචෝදනාවේ විස්තර කරන ලද වරද විභාග කිරීමට අධිකරණ බලය තිබිය යුතු ය.

(6) අධිචෝදනා පත්‍රයකට ඇමිණිය යුතු බවට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතින් නියම කරන ලේඛනවලට අමතරව, චූදිතයකු විසින් සහ පැමිණිල්ලේ සාක්ෂිකරුවකු ලෙස කැඳවීමට අදහස් කරන සෑම තැනැත්තකු විසින් ම කොමිෂන් සභාව ඉදිරියේ සිදු කළ යම් ප්‍රකාශ ඇත්නම් ඒ ප්‍රකාශවල පිටපතක් එවැනි සෑම අධිචෝදනා පත්‍රයක් සමඟම අමුණා තිබිය යුතු ය.

(7) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාවේ අවසරය ලැබූ කොමිෂන් සභාවේ සාමාජිකයකු, කොමිෂන් සභාවේ ඉල්ලීම මත ඇටර්නි ජනරාල්වරයා හෝ ඒ සඳහා කොමිෂන් සභාව විසින් විශේෂයෙන් බලය දෙන ලද නීතිඥවරයකු හට-

(අ) (i) චෝදනා පත්‍රයක් මත මහෙස්ත්‍රාත් අධිකරණයක දී; සහ

(ii) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් කළ අධිචෝදනා පත්‍රයක් මත මහාධිකරණයේ දී,

පවත්වනු ලබන වරදක් විභාග කිරීමේ නඩුවක දී පැමිණිල්ල මෙහෙය වීම; හෝ

(ආ) කොමිෂන් සභාවට අදාළ විය හැකි වෙනත් යම් නඩු කටයුත්තක දී කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටීම,

කළ හැකි වන්නේ යː

එසේ වුව ද, කොමිෂන් සභාව විසින්, පැමිණිල්ල මෙහෙය වීමට හෝ වෙනත් යම් නඩු කටයුත්තක දී කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටීමට නීතිපතිවරයා වෙත ඉල්ලීමක් කර ඇති අවස්ථාවක, නීතිපතිවරයා නොමැති අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් බලය දෙන ලද කොමිෂන් සභාවේ නිලධරයකු විසින් එම නඩුව පවත්වාගෙන යාමට හෝ කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටීමට හිමිකම් ලබනු ඇතː

එසේ තවදුරටත්, කොමිෂන් සභාව විසින් බලය දෙන ලද කොමිෂන් සභාවේ නිලධරයකු විසින් පැමිණිල්ල මෙහෙයවන අවස්ථාවක දී හෝ කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටින විට නීතිපතිවරයා විසින් ඒ නිලධරයාට සහාය දිය හැකි ය.

සාක්ෂි ලැයිස්තුවේ හෝ නඩු භාණ්ඩ ලැයිස්තුවේ නිශ්චිතව දක්වා නැති යම් සාක්ෂි කැඳවීම හෝ යම් ලේඛන භාවිතය හෝ ඉදිරිපත් කිරීම

**66.** මේ පනතේ 41 වන වගන්තිය යටතේ දක්වා ඇති වරදක් සඳහා යම් තැනැත්තකුගේ නඩු විභාගයක දී වෙනත් යම් ලිඛිත නීතියක එරෙහිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි අදාළ අධිකරණය විසින්, සාක්ෂි හෝ නඩු භාණ්ඩ ලැයිස්තුවේ නිශ්චිතව දක්වා නැති අවස්ථාවෝචිත පරිදි, යම් සාක්ෂියක් කැඳවීම හෝ එවැනි යම් ලේඛනයක් භාවිත කිරීම හෝ ඉදිරිපත් කිරීම යුක්තිය පසිඳලීම පිණිස අවශ්‍ය වන බවට අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක දී, කොමිෂන් සභාව වෙත අවසර ලබා දෙනු ලැබිය හැකි ය.

අධිචෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීම

**67.** (1) මේ පනත යටතේ වරදක් හෝ ඊට වැඩි වැරදි ගණනක් සිදු කර ඇති බවට අධිචෝදනා ලබා ඇති තැනැත්තකුට එරෙහිව මහාධිකරණයක් ඉදිරියේ නඩු තීන්දුවක් ලබා දීමට පෙර කවර හෝ

අවස්ථාවක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ අනුමතය සහිතව (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කරුණු නිසි සැලකිල්ලට ගනිමින් සහ (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද කොන්දේසි එකක් හෝ ඊට වැඩි ගණනකට යටත්ව මහාධිකරණයේ අවසරය මත ඒ චූදිතයාට එරෙහිව වන අධිචෝදනාව ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ අධිචෝදනාවක් ඉල්ලා අස්කර ගන්නා අවස්ථාවක දී ඔහු විසින්,-

(i) අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය;

(ii) ජාතික යහපත සහ පොදු යහපත;

(iii) වරදෙහි වින්දිතයන්ගේ අදහස්; සහ

(iv) චූදිත තැනැත්තා හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ නීතිඥවරයා විසින් කළ හැකි ඉදිරිපත් කිරීම්,

පිළිබඳ නිසි සැලැකිල්ල යොමු කළ යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ අධිචෝදනාවක් ඉල්ලා අස්කර ගන්නා විට, නියමිත කාලසීමාවක් තුළ ඉටු කළ යුතු පහත දැක්වෙන කොන්දේසිවලින් එකක් හෝ කිහිපයක් චූදිතයා මත පැනවිය හැකි යː-

(i) කොමිෂන් සභාව විසින් නිකුත් කළ පාඨයක් භාවිත කරමින් මහාධිකරණය ඉදිරිපිට දී ප්‍රසිද්ධියේ කනගාටුව ප්‍රකාශ කර සමාව ගැනීම;

(ii) කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි වරදේ වින්දිතයන්ට වන්දියක් ගෙවීම;

(iii) මේ පනත යටතේ වරදක් සිදු කිරීමෙන් ඔහු වැළකෙන බවට ප්‍රසිද්ධියේ භාර ගැනීම; හෝ

(iv) තෝරා පත් කරන ලද සහ පත් කරන ලද යන දෙයාකාරයේ රජයේ නිලයන් දැරීමෙන් ස්ථිරව ම වැළකෙන බව.

(4) (3) වන උපවගන්තිය යටතේ පනවන ලද කොන්දේසි, ඒ කොන්දේසි සම්පූර්ණ කිරීමට නියම කරන ලද කාලසීමාව තුළ යම් තැනැත්තකු විසින් සපුරන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මුල් අධිචෝදනාවේ නිශ්චිතව දක්වා ඇති චෝදනාව ඉන්පසුව චූදිතයාට එරෙහිව අලුත් අධිචෝදනාවක් ලෙස ඉදිරිපත් නොකළ යුතු ය.

(5) චූදිතයා විසින් සාධාරණ හේතුවක් නොමැතිව එකී කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මුල් අධිචෝදනාවේ පැවති එම චෝදනා මතම චූදිතයාට එරෙහිව අලුත් අධිචෝදනාවක් ගොනු කළ හැකි අතර ඒ කොන්දේසි සපුරාලීමට චූදිතයාට දී තිබූ කාලසීමාව ඉකුත් වූ පසුව චූදිතයාට නඩු පැවරීම ආරම්භ කළ හැකි ය.

**68.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් කළ අධිචෝදනා පත්‍රයක් මගින් මහාධිකරණයේ නඩු කටයුත්තක් පවරන අවස්ථාවක දී, නීතිපතිවරයා විසින් එවැනි වරදක් සඳහා මහාධිකරණයට අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කළේ නම්, එකී තීන්දුවට, නියෝගයට හෝ දඬුවමට එරෙහිව අභියාචනා කිරීමට නීතිපතිවරයාට අයිතිය තිබිය හැකිව තිබූ සියලු නඩුවල දී ඒ මහාධිකරණයේ තීන්දුවකට, නියෝගයකට හෝ දඬුවමකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට ද අයිතිය තිබිය යුතු ය. අභියාචනා

(2) වෙනත් යම් ලිඛිත නීතියක එරෙහිව කුමක් සඳහන් වුව ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් කළ චෝදනා පත්‍රයක් මගින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුත්තක් පවරන අවස්ථාවක දී, ඒ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු තීන්දුවකට, නියෝගයකට හෝ දඬුවමකට එරෙහිව අභියාචනයක් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට අයිතිය තිබිය යුතු ය.

(3) වෙනත් යම් ලිඛිත නීතියක එරෙහිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් බලය දෙනු ලැබූ කොමිෂන් සභාවේ නිලධරයකු විසින්, කොමිෂන් සභාවේ ඉල්ලීමක් මත නීතිපතිවරයා විසින් හෝ කොමිෂන් සභාව විසින් විශේෂයෙන් බලය පවරනු ලැබූ වෙනත් යම් නීතිඥවරයකු විසින්-

(අ) මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන අභියාචනයක් මෙහෙය වීමට ; සහ

(ආ) කොමිෂන් සභාවට සබඳතාවයක් ඇති වෙනත් යම් නඩු කටයුත්තක අභියාචනයක් වෙනුවෙන් කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටීමට,

බලය තිබිය යුතු ය.

එසේ වුව ද, යම් අභියාචනයක් පවත්වාගෙන යාමට හෝ වෙනත් යම් නඩු කටයුත්තක අභියාචනයක දී කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටීමට කොමිෂන් සභාව නීතිපතිවරයාගෙන් ඉල්ලා ඇති අවස්ථාවක, නීතිපතිවරයා නොමැති අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් බලය දෙනු ලබන කොමිෂන් සභාවේ නිලධරයකු විසින් එම ඒ අභියාචනය පවත්වාගෙන යාමට හෝ කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටීමට හිමිකම ලබනු ඇත:

එසේම තවදුරටත්, කොමිෂන් සභාව විසින් බලය දෙන ලද කොමිෂන් සභාවේ නිලධරයකු විසින් අභියාචනයක් පවත්වාගෙන යන අවස්ථාවක දී හෝ කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටින අවස්ථාවක දී, නීතිපතිවරයා විසින් ඒ නිලධරයාට සහාය ලබාදිය හැකි ය.

නීතිපතිවරයාගේ සහාය ඉල්ලා සිටීම

**69.** (1) විමර්ශනයකට පෙරාතුව හෝ විමර්ශනයක් අතරතුර දී හෝ විමර්ශනයක් අවසන් වීමේ දී හෝ නඩුව විභාග වෙමින් පවත්නා කාලය තුළ දී, අභියාචනයක දී හෝ විමර්ශනයේ විෂයය වස්තුවට අදාළ යම් ගැටලුවක දී කොමිෂන් සභාව විසින් නීතිපතිවරයාගේ නිරීක්ෂණ, අදහස, මතය, උපදෙස් හෝ අදහස් ලබාගැනීම සහ සලකා බැලීම කළ හැකි ය.

(2) කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ එහි බලතල සහ කාර්යයන් ඉටුකිරීමට අදාළ වන යම් කාරණාවල දී නීතිපතිවරයාගේ අදහස් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටින පරිදි නීතිපතිවරයා විසින් එවැනි සහායන් ලබාදීම නීත්‍යානුකූල විය යුතු ය.

(4) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකන්නේ නම්, එය විසින් 42 වන වගන්තිය යටතේ රැස් කළ සහ ලබාගත් දේ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ යම් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට නීතිපතිවරයා වෙතට යොමු කළ හැකි ය.

අපසහායකයන්ට එරෙහිව චෝදනා ගොනු කිරීම හෝ අපරාධ නඩු පැවරීම නොකළ යුතු බව

**70.** (1) මේ පනතේ III වන කොටසේ විධිවිධාන යටතේ අල්ලස් චෝදනාලත් තැනැත්තකු සම්බන්ධයෙන් වන විමර්ශනයක යම් අවස්ථාවක දී හෝ එවැනි තැනැත්තකු සම්බන්ධයෙන් වන නඩු විභාගයක් අවසන් වීමට පෙර යම් අවස්ථාවක දී, එකී වරදට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධ වී ඇති බවට හෝ එම වරදට පෙරෙවි බවට සලකනු ලබන යම් තැනැත්තකුගෙන් කොමිෂන් සභාව විසින් ස්වකීය අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් එකී තැනැත්තාගෙන් එම නඩු විභාගයේ දී සාක්ෂි ලබා ගැනීමේ අරමුණ ඇතිව, එකී තැනැත්තා විසින් එකී වරද සම්බන්ධයෙන් ඔහුගේ දැනීම අනුව වූ අවස්ථානුගත කරුණු සියල්ල පිළිබඳ සම්පූර්ණ වූ ද, සත්‍ය වූ ද, අනාවරණයක් සිදු කිරීමේ කොන්දේසිය මත එම තැනැත්තාට සහ එම වරද සිදු කිරීමේ දී ප්‍රධානියකු ලෙස නැතහොත් අනුබල දෙන්නකු ලෙස සම්බන්ධ වී ඇති අනෙක් සෑම තැනැත්තකුට ම එරෙහිව චෝදනා ගොනු නොකිරීමට නැතහොත් අපරාධ නඩු නොපැවරීමට එහි නම් කර ඇති යම් මහෙස්ත්‍රාත්වරයකුට බලය දෙනු ලැබිය හැකි ය.

(2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති සෑම තැනැත්තකුගේ ම දිව්රුම මත දුන් සාක්ෂි, මහෙස්ත්‍රාත්වරයා විසින් සටහන් කළ යුතු අතර ඒ සටහන කොමිෂන් සභාවට ප්‍රේෂණය කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති සෑම තැනැත්තකු ම නඩුවේ සාක්ෂිකරුවකු ලෙස පිරික්සිය යුතු ය.

(4) එකී තැනැත්තා ඇප මත නිදහස් කර නොමැති නම්, නඩු විභාගය අවසන් වන තෙක් සිරභාරයේ රඳවා තැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති යම් තැනැත්තකු අත්‍යාවශ්‍ය දෙයක් හිතාමතාම සඟවා ඇත්නම් හෝ අසත්‍ය සාක්ෂි ලබා දී ඇත්නම්, එම තැනැත්තාට එරෙහිව චෝදනා ගොනු කරනු ලැබ ඇත්තේ යම් වරදක් සම්බන්ධයෙන් ද එම වරද සඳහා හෝ එම කරුණ සම්බන්ධයෙන් එම තැනැත්තා වෙනත් යම් වරදක් සඳහා වරදකරු බවට පෙනී යන අවස්ථාවක දී එම වරද සම්බන්ධයෙන් හෝ ඔහුට එරෙහිව නඩු විභාග කරනු ලැබිය හැකි ය.

(6) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් සිදු කළ ප්‍රකාශයක්, (5) වන උපවගන්තියේ සඳහන් කර ඇති පරිදි ඔහුව විභාග කිරීමක දී ඔහුට එරෙහි සාක්ෂි වශයෙන් ලබා දිය හැකි ය.

**නඩු කල්තැබීමේ ගිවිසුම්**

**71.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සිදු කරන ලද වරද මේ පනතේ 106 වන සහ 108 වන වගන්ති යටතට ගැනෙන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කළ කරුණුවලට නිසි සැලකිල්ල දක්වමින් සහ (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද කොන්දේසි එකක් හෝ ඊට වැඩි ගණනකට යටත්ව එම වගන්ති යටතේ වරදක් සිදු කර ඇති බවට චෝදනා ලද යම් තැනැත්තකු සමඟ ඒ තැනැත්තාට එරෙහිව අපරාධ නඩු කටයුත්තක් වසර පහකට නොඅඩු සහ වසර දහයක් නො ඉක්මවන යම් කාලසීමාවක් සඳහා අත්හිටුවීමට සහ කල් තැබීමට ගිවිසුමකට එළඹිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අපරාධ නඩු කටයුත්තක් අත්හිටුවීමට හෝ කල් තැබීමට කොමිෂන් සභාව එකඟ වන අවස්ථාවක දී, එය විසින්-

(අ) අල්ලස සහ දූෂණය වැළැක්වීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ;

(ආ) ජාතික අවශ්‍යතාව සහ පොදු අවශ්‍යතාව;

(ඇ) වරදේ වින්දිතයන්ගේ අදහස් තිබේ නම් එම අදහස්; සහ

(ඈ) චූදිත තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ නීතිඥවරයා විසින් ඉදිරිපත් කළ හැකි නියෝජනයන් පිළිබඳ,

නිසි සැලකිල්ල දැක්විය යුතු ය.

(3) මේ පනත යටතේ වරදක් සිදු කර ඇතැයි කියනු ලබන යම් තැනැත්තකුට එරෙහිව අපරාධ නඩු කටයුත්තක් කල් තැබීමට හෝ අත්හිටුවීමට (1) වන උපවගන්තියේ නියමයන් ප්‍රකාර කොමිෂන් සභාව එකඟ වන අවස්ථාවක දී, ඒ තැනැත්තාට එරෙහිව අපරාධ නඩු කටයුත්තක් අත්හිටුවීමට සහ කල්තැබීම සඳහා සලකා බැලීමක් ලෙස ඒ තැනැත්තා වෙත නියම කරන කාලයක් තුළ සම්පූර්ණ කළ යුතු පහත දැක්වෙන කොන්දේසිවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් පැනවීම සඳහා මහාධිකරණයේ අවසරය ලබා ගැනීමට කොමිෂන් සභාව විසින් මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය-

(අ) කොමිෂන් සභාව විසින් නිකුත් කළ පාඨයක් භාවිත කරමින් මහාධිකරණය ඉදිරිපිට දී ප්‍රසිද්ධියේ කණගාටුව ප්‍රකාශ කර සමාව ගැනීමට;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කර ඇති පරිදි වරදේ වින්දිතයන්ට වන්දියක් ගෙවීමට;

(ඇ) මේ පනත යටතේ වරදක් සිදු කිරීමෙන් ඒ තැනැත්තා වළකින බවට ප්‍රසිද්ධියේ භාර ගැනීමට;

(ඈ) රජයේ නිලයන් දැරීමෙන් ස්ථිරවම වැළකී සිටීමට සහ වසර හතක කාලසීමාවක් සඳහා තේරී පත් වූ නිලයක් දැරීමෙන් වැළකීමට; හෝ

(ඉ) වරදට අදාළ මුළු මුදල වන්දි ලෙස රජයට ගෙවීමට සහ එයින් සියයට විසි පහක මුදලක් කොමිෂන් සභාවේ අරමුදලට බැර කිරීමට.

(4) (අ) මහාධිකරණය විසින්, (3) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ ඉල්ලීම සලකා බැලීමෙන් පසු සහ ගිවිසුම යුක්තියේ යහපත සඳහා වන බවට සහ ගිවිසුමේ නියමයන් අපක්ෂපාත, සාධාරණ සහ සමානුපාතික බවට සෑහීමට පත්වීම මත එම ගිවිසුම අනුමත කර ඒ පිළිබඳව ඒ තැනැත්තාට දැනුම් දිය යුතු ය.

(ආ) මහාධිකරණය විසින් ඒ ගිවිසුම අනුමත කිරීමේ දිනයේ සිට එම ගිවිසුම බලාත්මක වන්නේ ය.

(5) ඒ තැනැත්තා විසින් (3) වන උපවගන්තිය යටතේ පනවන ලද කොන්දේසි සම්පූර්ණ කිරීම සඳහා නියම කරන ලද කාලසීමාව තුළ ඒ කොන්දේසි සම්පූර්ණ කර ඇත්නම් කොමිෂන් සභාව විසින් ඒ තැනැත්තා සිදු කරනු ලැබ ඇතැයි කියන වරද සම්බන්ධයෙන් ඔහුට එරෙහිව කටයුතු නොකළ යුතු ය.

(6) ඒ තැනැත්තා වලංගු හේතුවක් නොමැතිව ඒ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන්නේ නම්, මහාධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු කොමිෂන් සභාව විසින් අධිචෝදනා පත්‍රය මත ඒ තැනැත්තාට එරෙහිව අපරාධ නඩු කටයුත්තක් ආරම්භ කළ හැකි ය.

(7) ගිවිසුමේ නියම කරන ලද කාලසීමාව ඉකුත් වීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මහාධිකරණය වෙත දැනුම් දී සහ එහි අවසරය ලබා ගැනීම මත ඒ තැනැත්තාට එරෙහිව නඩු කටයුත්ත ඉදිරියට ගෙන යාම නැවැත්විය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ වූ යම් ගිවිසුමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ-

(i) සංස්ථාගත කළ පුද්ගල මණ්ඩලයක් සමඟ;

(ii) හවුල් ව්‍යාපාරයක්; හෝ

(iii) සංස්ථාගත නොකළ සංගමයක් වන අවස්ථාවක දී, එකී සංගමයේ නමින්,

එළඹිය යුතු ය.

සාමාන්‍ය බලතල

**72.** මේ පනතේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා, කොමිෂන් සභාව විසින්. මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවූ වෙනත් යම් උචිත පියවර ගනු ලැබිය හැකි ය.

V වන පරිච්ඡේදය

**තොරතුරු සපයන්නන්, අකටයුතුකම් දැනුම්දෙන්නන්, සාක්ෂිකරුවන් සහ කොමිෂන් සභාවට සහාය දෙන වෙනත් තැනැත්තන් ආරක්ෂා කිරීම**

කොමිෂන් සභාවේ තොරතුරු සපයන්නන් ආරක්ෂා කිරීම

**73.** (1) මේ පනත යටතේ යම් වරදක් සිදු කරනු ලැබ ඇති බවට හෝ සිදු කරනු ලැබ ඇති බවට සැක කරන හෝ සිදු කිරීමට ඉඩ ඇති බවට කොමිෂන් සභාවට රහසිගතව විශ්වාස කටයුතු තොරතුරක් ලැබෙන අවස්ථාවක දී, එම තොරතුරු සහ දැනුම් දෙන්නාගේ අනන්‍යතාවය හෙළිදරව් නොකළ යුතු අතර තොරතුරු සපයන්නා සහ ඒ තොරතුරුවලට අදාළ කාරණා යම් අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ වෙනත් අධිකාරියක් ඉදිරියේ යම් නඩු කටයුත්තක දී හෙළිදරව් කරනු නොලැබිය යුතු ය.

(2) සාක්ෂිවල දී දෙන ලද හෝ යම් සිවිල්, අපරාධ හෝ වෙනත් නඩු කටයුත්තක දී පරීක්ෂා කිරීම සඳහා නීතියෙන් බැඳුණු යම් ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක තොරතුරු සපයන්නාට හෝ තොරතුරු සපයන්නා විසින් දෙන ලද තොරතුරුවලට අදාළ සටහනක් ඇතුළත් වන අවස්ථාවක දී, අදාළ අධිකරණය, විනිශ්චය සභාව හෝ වෙනත් අධිකාරිය විසින්, තොරතුරු සපයන්නාට හෝ දෙන ලද තොරතුරුවලට අදාළ වන එම වාර්තාවේ කොටස් ඒ තොරතුරු සපයන්නාගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම පිණිස දර්ශනය වීමෙන් වැළැක්වීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ යම් වරදක් සඳහා වන නඩු විභාගයක දී නඩුව පිළිබඳ සම්පූර්ණ පරීක්ෂණයකින් පසුව තොරතුරු සපයන්නා විසින් වැරදි බවට දැනුවත්ව සිටි හෝ සත්‍යයක් ලෙස පිළිගත නොහැකි වූ වැදගත් ප්‍රකාශයක් තොරතුරු සපයන්නා විසින් හිතාමතා ම ස්වකීය පැමිණිල්ලේ සඳහන් කර ඇති බවට අධිකරණයේ මතය වන අවස්ථාවක දී හෝ වෙනත් නඩු කටයුත්තක දී, තොරතුරු සපයන්නා සොයා ගැනීමකින් තොරව එයට අදාළ පාර්ශ්වයන් අතර සම්පූර්ණයෙන් ම යුක්තිය පසිඳලිය නොහැකි බවට අධිකරණයේ මතය වන අවස්ථාවක දී, එවිට, අධිකරණය විසින් මුල් පැමිණිල්ල ලියවිල්ලකින් වේ නම්, එය ඉදිරිපත් කිරීමට නියම කළ හැකි අතර එය පරීක්ෂා කිරීමට අවසර ලබා දීම සහ තොරතුරු සපයන්නා සම්බන්ධයෙන් සම්පූර්ණ හෙළිදරව්වක් කරන ලෙස නියම කළ හැකි ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහාධිකරණයක් විසින් එසේ වරදකරු කරනු ලැබීමේ දී, ඒ තැනැත්තා රුපියල් පනස්දහසක දඩයකට හෝ මාස හයක් නො ඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(5) යම් තැනැත්තකු විසින්-

(අ) යම් තැනැත්තකු, රාජ්‍ය නිලධරයකු, සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක්, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ආස්ථිත්වයක් විසින් මේ පනත යටතේ වූ වරදක්

සිදු කරනු ඇති බවට හෝ සිදු කරමින් සිටින බවට හෝ සිදු කර ඇති බවට හෝ සිදු කිරීමට ඉඩ ඇති බවට කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාවේ යම් නිලධරයකු වෙත හෝ වෙනත් යම් නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරියක් වෙත තොරතුරු සපයනු ලබන අවස්ථාවක දී; සහ

(ආ) එවැනි තොරතුරක් සපයන ලද අවස්ථාවක දී, එම තොරතුරු සත්‍ය බවට සහ මේ පනත යටතේ විමර්ශනයක් පැවැත්වීම අවශ්‍ය වන්නා වූ යම් ස්වභාවයක තොරතුරක් වන බවට විශ්වාස කරනු ලබන අවස්ථාවක දී,

එම තොරතුරු සැපයීම හේතුවෙන් එම තැනැත්තා සිවිල් හෝ අපරාධ වගකීමකට යටත් කරනු නොලැබිය යුතු ය.

(6) එවැනි තොරතුරු සැපයීම හේතුවෙන් යම් තොරතුරු සපයන්නකුගේ සේවා නියුක්ත තත්ත්වයන් අහිතකර බලපෑමකට යටත් කිරීම, පළිගැනීමකට, යටපත් කිරීමකට, තර්ජනය කිරීමකට, පීඩාවකට, තුවාල කිරීමකට හෝ බියවැද්දීමට හෝ ඉහත කවර හෝ ක්‍රියාකාරකමකට යටත් කරනු නොලැබිය යුතු ය. අකටයුතුකම් දැනුම්දෙනු ලබන්නකු විසින් 74 වන වගන්තිය යටතේ යම් තොරතුරක් සපයනු ලැබ ඇති අවස්ථාවක දී, එවැනි තොරතුරු සැපයීම සඳහා ඔහුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගනු නොලැබිය යුතු ය.

(7) තොරතුරු හෙළිදරව් කිරීමක් සම්බන්ධයෙන් වෙනත් යම් නීතියක්, ගිවිසුමක්, දිවුරුම්දීමක් හෝ ව්‍යවහාරයක් යටතේ වූ යම් තහනම් කිරීමක් හෝ සීමා කිරීමක් නොසලකා හරිමින්, 74 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ මේ වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ යම් තොරතුරක් සැපයීම සම්බන්ධයෙන් අකටයුතුකම් දැනුම්දෙන්නකු අනර්ථකාරී ක්‍රියාවකට යටත් කරනු නොලැබිය යුතු ය.

(8) සේවායෝජකයකු සහ සේවානියුක්තයකු අතර පවතින යම් සේවා ගිවිසුමක හෝ වෙනත් යම් ගිවිසුමක සඳහන් යම් විධිවිධානයක්-

(අ) මේ පනත යටතේ යම් නඩු කටයුත්තක් හෝ ගිවිසුමක් උල්ලංඝනය කිරීම සම්බන්ධ යම් නඩු කටයුත්තක් පැවරීමෙන් හෝ පවත්වා ගෙන යාමෙන් වළක්වනු ලබන යම් ගිවිසුමක් ඇතුළු මේ පනතේ යම් විධිවිධානයක් බැහැර කරන බවට සලකනු ලබන තාක් දුරට; හෝ

(ආ) යම් සේවානියුක්තයකු තොරතුරු සැපයීමෙන් වළක්වනු ලබන බවට හෝ තොරතුරු සැපයීම අධෛර්යමත් කිරීමේ බලපෑමක් ඇති කරනු ලබන බවට වන තාක්දුරට,

බල රහිත වන්නේ ය.

(9) (6) වන උපවගන්තියේ කාර්ය සඳහා, පටහැනි තත්ත්වයක් ඔප්පු කරනු ලබන තෙක් සේවා නියුක්තිය පිළිබඳ අහිතකර තත්ත්වයන් පළිගැනීමක්, පීඩාකිරීමක්, තුවාල සිදු කිරීමක් හෝ බිය වැද්දීමක් හෝ ඉහත කී යම් ක්‍රියාකාරකමක් සිදු වී ඇති බවට පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

(10) යම් අකටයුතුකම් දැනුම් දෙන්නකු විසින් ඔහු විසින් සපයනු ලබන තොරතුරු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විමර්ශනයක දී, කොමිෂන් සභාවට සහාය දක්වනු ලැබිය යුතු ය.

අකටයුතුකම් දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීම

**74.** (1) රජයේ සේවකයකු හෝ පුද්ගලික අංශයේ ආස්ථිත්වයක යම් සේවකයකු-

(අ) ඔහු සේවයේ නියුක්ත වන්නා වූ අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය ආයතනයේ හෝ පෞද්ගලික අංශයේ ආස්ථිත්වයක් තුළ හෝ යම් තැනැත්තකු පිළිබඳව මේ පනත යටතේ වන වරදක් සිදුව ඇති බවට හෝ සිදුවන බවට හෝ සිදුවීමට ඉඩ ඇති බවට ඔහුගේ ජ්‍යෙෂ්ඨ නිලධරයා වෙත තොරතුරු දැනුම් දීමේ අවස්ථාවක දී; සහ

(ආ) එම තැනැත්තා තොරතුරු සපයන අවස්ථාවේ දී ඔහු සපයන තොරතුරු සත්‍ය බවට සහ එම තොරතුරු මේ පනත යටතේ විමර්ශනයක් පැවැත්වීමට අවශ්‍ය වන යම්

ස්වභාවයක පවතින බවට විශ්වාස කිරීමට හේතු පවතින අවස්ථාවක දී,

(මෙහි මින් මතු "අකටයුතුකම් දැනුම් දෙන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ රජයේ සේවකයා හෝ පුද්ගලික අංශයේ ආස්ථිත්වයක සේවානියුක්තයා ඒ තොරතුරු සැපයීමේ ප්‍රතිඵලයක් ලෙස කිසිදු සිවිල් හෝ අපරාධ වගකීමක් සඳහා යටත් නොකළ යුතු ය.

(2) මේ වගන්තියේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර මහාධිකරණය විසින් එසේ වරදකරු කරනු ලැබීමේ දී, එම තැනැත්තා, රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩ මුදලකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වන බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

කොමිෂන් සභාවට සහාය දක්වන තැනැත්තන්ගේ ආරක්ෂාව

**75.** (1) කොමිෂන් සභාවට සහාය දක්වන යම් තැනැත්තකුගේ ආරක්ෂාව අගතියට පත් විය හැකි බවට හෝ ඒ තැනැත්තා හෝ වෙනත් යම් තැනැත්තකු තර්ජනය කිරීමකට, හිරිහැර කිරීමකට, තුවාල සිදු කිරීමට හෝ තර්ජනය කිරීමට ලක්විය හැකි බවට කොමිෂන් සභාවට පෙනී යන්නේ නම්, කොමිෂන් සභාව විසින්-

(අ) ඒ තැනැත්තාගේ ශාරීරික ආරක්ෂාව සැපයීමට අවශ්‍ය වන; හෝ

(ආ) ඒ තැනැත්තා හෝ වෙනත් යම් තැනැත්තා තර්ජනයකින්, හිරිහැර කිරීමකින්, තුවාල සිදු කිරීමෙන් හෝ බියගැන්වීමකින් ආරක්ෂා කිරීමට අවශ්‍ය වන,

යම් වැඩපිළිවෙළක් කොමිෂන් සභාව විසින් සකස් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ "කොමිෂන් සභාවට සහාය දක්වන යම් තැනැත්තකු" යන්නෙන්-

(අ) මේ පනතේ 73 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු දැනුම් දෙන්නකු;

(ආ) සාක්ෂිකරුවකු;

(ඇ) කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ පවත්වන හෝ පැවැත්විය යුතු විභාග කිරීමක දී හෝ විමර්ශනයක දී හෝ ගනු ලබන හෝ ගනු ලැබිය යුතු වෙනත් යම් පියවරක දී කොමිෂන් සභාව ඉදිරිපිට දී සාක්ෂි දීමට හෝ ලේඛනයක් හෝ වෙනත් යම් දෙයක් ඉදිරිපත් කිරීමට පෙනී සිටි, පෙනී සිටින හෝ පෙනී සිටීමට සිටින තැනැත්තකු;

(ඈ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ගනු ලබන හෝ ගනු ලැබිය යුතු වෙනත් පියවරවල දී හෝ පවත්වන හෝ පැවැත්විය යුතු විභාගයක දී හෝ විමර්ශනයක දී කොමිෂන් සභාවට ලේඛනයක් හෝ වෙනත් යම් දෙයක් ඉදිරිපත් කර ඇති හෝ ඉදිරිපත් කිරීමට යෝජනා කර ඇති තැනැත්තකු; හෝ

(ඉ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පවත්වන හෝ පවත්වනු ලැබිය යුතු විභාගයක් හෝ විමර්ශනයක දී හෝ ගනු ලබන හෝ ගනු ලැබිය යුතු වෙනත් යම් පියවරක දී වෙනත් යම් ආකාරයකින් කොමිෂන් සභාවට සහාය දී ඇති හෝ සහාය දෙන හෝ සහාය දීමට සිටින තැනැත්තකු,

අදහස් වේ.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද එවැනි යම් වැඩපිළිවෙළකට පහත සඳහන් දේ ඇතුළත් විය හැකි යः-

(අ) (i) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් ආරක්ෂාවක් සැපයීමට;

(ii) ඒ ආරක්ෂාව සැපයීමේ දී සහාය වීමට සේවක සහාය හෝ පහසුකම් හෝ ඒ දෙකම සැපයීමට; හෝ

(iii) ඒ ආරක්ෂා සැපයීමේ දී අන්‍යාකාර සහායක් සැපයීමට,

පොලිස්පතිවරයාට හෝ යම් පොදු අධිකාරියකට හෝ යම් රජයේ නිලධරයකුට විධාන නිකුත් කිරීම;

(ආ) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ කායික ආරක්ෂාව රැකගැනීමේ කාර්යය සඳහා හෝ ඒ තැනැත්තා තර්ජනයකින් හෝ හිරිහැර කිරීමකින් ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද තැනැත්තකුට අදාළව නියෝග සිදු කිරීම ඇතුළත් වේ. එවැනි නියෝගයක් (අ) ඡේදයේ සඳහන් කර ඇති ආකාරයේ විධානවලට සීමා නොවේ.

(4) කොමිෂන් සභාව විසින් දෙන ලද එවැනි යම් විධානයකට හැකිතාක් සාධාරණ ලෙස අනුකූලව ක්‍රියා කිරීම පොලිස්පතිවරයාගේ, හෝ වෙනත් යම් රාජ්‍ය අධිකාරියක හෝ රාජ්‍ය නිලධරයකුගේ වගකීම වන්නේ ය.

(5) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නිශ්චිතව සඳහන් කරන ලද තැනැත්තකුට අදාළ වන යම් නියෝගයක් සාධාරණ හේතුවක් නොමැතිව උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර මහාධිකරණයකින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමේ කාලයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

**76.** (1) කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාව ඉදිරියේ කරන ලද යම් ප්‍රකාශයක්, දෙන ලද තොරතුරක් හෝ පිළිතුරක් හෝ ඉදිරිපත් කළ යම් ලේඛනයක් හෝ වෙනත් යම් දෙයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු යම් අධිකරණයක දී යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තකට හෝ නඩු පැවරීමකට හෝ වෙනත් නීති කටයුත්තකට හෝ යටත් නොවිය යුතු යː

සාක්ෂිකරුවන්ගේ මුක්තිය

(2) කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව ඉදිරියේ යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක, හෝ දෙන ලද පිළිතුරක් හෝ තොරතුරක් පිළිබඳ කිසිදු සාක්ෂියක් ඒ තැනැත්තාට එරෙහිව යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී හෝ නඩු පැවරීමක දී හෝ නීති කෘත්‍යයක දී ආවේශ්‍ය කර නොගත යුතු යː

එසේ වුව ද, මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධාන මගින්-

(i) මේ පනතේ 119 වන වගන්තිය සමග කියවිය යුතු (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ XI වන

පරිච්ඡේදය යටතේ යම් වරදක් සඳහා හෝ මේ පනත යටතේ වරදක් සඳහා යම් නඩුවකට, නඩු පැවරීමකට හෝ යම් වරදක් සඳහා වූ දණ්ඩනයකට යම් තැනැත්තකුගේ බැඳීම ලිහිල් කිරීමක් හෝ බලපෑමක් නොවිය යුතු ය හෝ ලිහිල් කිරීමක් හෝ බලපෑමක් ලෙස සලකනු ලැබීම හෝ තේරුම් ගැනීම නොකළ යුතු ය;

(ii) එවැනි යම් නඩුවක දී හෝ නඩු පැවරීමේ කාර්ය සඳහා හෝ යම් තැනැත්තකුගේ නම හෝ ඔහුගේ ප්‍රකාශයක් හෝ ප්‍රකාශයකින් යම් කොටසක් ප්‍රසිද්ධ කිරීම හෝ හෙළිදරව් කිරීම තහනම් කිරීමක් හෝ තහනම් කිරීමක් ලෙස සලකනු ලැබීමක් හෝ එසේ තේරුම් ගැනීමක් නොවිය යුතු ය; හෝ

(iii) 147 වන වගන්තිය යටතේ ආවේශ්‍ය වන යම් ප්‍රකාශයක ආවේශ්‍ය බව සඳහා බලපෑමක් නොවිය යුතු ය.

කොමිෂන් සභාවට සහාය දෙන සාක්ෂිකරුවන් සහ තැනැත්තන් ආරක්ෂා කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී නීති නියෝජනයන් සැපයීම

**77.** මේ පනතේ 73, 74 සහ 75 වගන්ති ප්‍රකාර, යම් තොරතුරු සපයන්නකු, අකටයුතුකම් දැනුම් දෙන්නකු හෝ සාක්ෂිකරුවකු විසින් කරන ලදැයි උද්දේශිත යම් වරදක් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක පවත්වනු ලබන යම් පරීක්ෂණයක් ඇතුළු යම් විමර්ශනයක දී හෝ මහාධිකරණය ඉදිරියේ වූ යම් විභාගයක දී, එකී තොරතුරු සපයන්නාට, දැනුම් දෙන්නාට හෝ සාක්ෂිකරුට එකී විමර්ශනයට හෝ විභාගයට අගතියක් නොවන පරිදි නීති සහාය ලබා දීමට කොමිෂන් සභාවට බලතල තිබිය යුතු ය.

වින්දිතයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**78.** 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ සහ එයට සහාය දීමේ පනතේ විධිවිධාන යටතේ තහවුරු කරනු ලැබ ඇති වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ සඳහන් කිසිවකින් අගතියක් නොවිය යුතු ය.

## II වන කොටස

### වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශය

මේ කොටසේ පරමාර්ථ

**79.** (1) මේ පනතේ 2 වන වගන්තියට යටත්ව, මේ කොටසේ පරමාර්ථ විය යුත්තේ-

(අ) සියලු රජයේ සේවකයන්ට ශ්‍රී ලංකාව තුළ සහ ඉන් බැහැර පවතින ඔවුන්ගේ වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙසට බල කිරීම;

(ආ) එකී ප්‍රකාශ ලබාදීම සඳහා වූ මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියක් සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඇ) අදාළ බලධාරීන් විසින් එකී ප්‍රකාශ වලට යොමු වනු ලැබීම සඳහා සහ මේ කොටස අදාළ වන යම් තැනැත්තකුට එරෙහිව යම් තොරතුරක් ලැබුණු පසු පැවැත්විය යුතු විමර්ශනයක් සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඈ) වත්කම් සහ බැරකම් ප්‍රමාද වී භාරදීම්, ප්‍රකාශ නොකර සිටීම් සහ අසත්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් ගනු ලැබිය යුතු සුදුසු පියවර සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඉ) ප්‍රසිද්ධ සමීක්ෂණ මගින් රජයේ කර්තව්‍යයන් හෝ නිල කටයුතු ඉටු කිරීමේ දී පැන නගින අයථා පොහොසත්වීම් සහ බැඳීම් පිළිබඳ සට්ටනයන් වැළැක්වීම; සහ

(ඊ) එයට සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම.

මේ පනත අදාළ කර ගැනීම

**80.** (1) මේ කොටසේ විධිවිධාන පහත දැක්වෙන පන්තිවලින් හෝ විස්තරවලින් කවරකට හෝ අයත් වන සෑම තැනැත්තකුට ම අදාළ විය යුතු යඃ-

(අ) ජනාධිපතිවරයා;

(ආ) අග්‍රාමාත්‍යවරයා;

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරු;

(ඈ) පළාත් ආණ්ඩුකාරවරු;

(ඉ) පළාත් සභා මන්ත්‍රීවරු සහ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධරයන්;

(ඊ) පළාත් පාලන ආයතනවල තෝරා පත් කර ගනු ලැබූ සභිකයන් සහ මාණ්ඩලික නිලධරයන්;

(උ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන විනිසුරුවරුන් සහ රජයේ නිලධරයන්;

(ඌ) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන රජයේ නිලධරයන්;

(එ) අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන අධිකරණ නිලධරයන් සහ ලේඛනගත රජයේ නිලධරයන්;

(ඒ) අමාත්‍යාංශවල සහ රජයේ දෙපාර්තමේන්තුවල මාණ්ඩලික නිලධරයන්;

(ඔ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (1) (ඉ) ව්‍යවස්ථාව ප්‍රකාරව පත් කරනු ලබන ලද ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන්;

(ඕ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොමිෂන් සභාවල අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවේ සභාපතිවරුන් හෝ සාමාජිකයන් ලෙස පත් කරනු ලබන තැනැත්තන්;

(ක) ශ්‍රී ලංකා මහ බැංකුවේ මාණ්ඩලික නිලධරයන්;

(ග) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ (1) (ඇ) ව්‍යවස්ථාව යටතේ හෝ යම් ප්‍රඥප්තියක් යටතේ පිහිටුවන ලද ස්වාධීන කොමිෂන් සභාවල මාණ්ඩලික නිලධරයන්;

(ච) යම් ප්‍රඥප්තියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද ස්වාධීන නියාමන සහ අධීක්ෂණ කොමිෂන් සභාවල හෝ පුද්ගල මණ්ඩලවල සභාපතිවරු, කොමසාරිස්වරු, සාමාජිකයන් සහ මාණ්ඩලික නිලධරයන්;

(ජ) යම් ප්‍රඥප්තියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද යම් රාජ්‍ය සංස්ථාවක සභාපතිවරු, අධ්‍යක්ෂවරු, මණ්ඩලවල සාමාජිකයන්, විධායක නිලධරයන්;

(ට) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ, පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සහ පළාත් පාලන ආයතනවල සභිකයන්ගේ පුද්ගලික කාර්ය මණ්ඩල සාමාජිකයන්;

(ඩ) (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව ඇති කොට පවත්වාගෙන යන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධරයන්;

(ණ) (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව ඇති කොට පවත්වාගෙන යන ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධරයන්;

(ත) (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ විධිවිධානවලට අනුකූලව ඇති කොට පවත්වාගෙන යන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලලත් නිලධරයන්;

(ද) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත හෝ (138 වන අධිකාරය වූ) වෘත්තීය සමිති ආඥාපනතේ කාර්ය සඳහා වන පිළිගත් දේශපාලන පක්ෂවල තනතුරු දරන්නන්;

(න) (138 වන අධිකාරය වූ) වෘත්තීය සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි වී ඇති වෘත්තීය සමිතිවල විධායක නිලධරයන්;

(ප) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක දී තෝරා පත් කර ගැනීම සඳහා නම් කළ අපේක්ෂකයන්;

(ඔ) රජය හෝ රජයේ සංස්ථාවක් විසින් සියයට විසිපහකට නොඅඩු කොටස් දරන්නා වූ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කළ සමාගම්වල සභාපතිවරුන්, අධ්‍යක්ෂවරු සහ මාණ්ඩලික නිලධරයන්;

(ම) මේ පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතන වන්නා වූ මූල්‍ය ආයතනවල කළමනාකරණ හෝ අධීක්ෂණ කටයුතුවල නියැලෙන කාර්ය මණ්ඩලය;

(ය) ශ්‍රී ලංකාවේ රාජ්‍ය දූත මණ්ඩලවල ප්‍රධානීන්;

(අඅ) අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය දූත මණ්ඩලවලට පත් කළ නිලධරයන්;

(ආආ) (180 වන අධිකාරය වූ) පුවත්පත් ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කරනු ලැබ ඇති පුවත්පත්වල හිමිකරුවන්, කර්තෘවරුන් සහ කර්තෘ මණ්ඩලයේ සාමාජිකයන්;

(ඇඇ) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී මාධ්‍ය සමාගම්වල හිමිකරුවන්, කර්තෘවරුන් සහ කර්තෘ මණ්ඩලයේ සාමාජිකයන්; සහ

(ඈඈ) යම් නිලධරයන් ඔවුන්ට අදාළ යම් නිලයන්වල කටයුතු කිරීමේදී එම වැඩ කටයුතුවල ස්වභාවයන් සැලකිල්ලට ගත්විට අල්ලස් හෝ දූෂණවලට පෙළඹීමට ඒ නිලධරයාට ඇති ඉඩකඩ සැලකිල්ලට ගනිමින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ යම් වෙනත් නිලධාරි කාණ්ඩයන්.

(2) (1) වන උපවගන්තිය ක්‍රියාත්මක වීම ප්‍රකාරව මේ කොටසේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තකු, මෙහි මින් මතු මේ කොටසේ "මේ කොටස අදාළ වන තැනැත්තා" යනුවෙන් හඳුන්වනු ලැබේ.

වත්කම් සහ බැරකම් ප්‍රකාශ සිදු කිරීම සඳහා මේ කොටස අදාළ වන තැනැත්තන්ගේ කාර්ය භාරය

**81.** (1) මේ කොටස අදාළ වන සෑම තැනැත්තකු ම (මෙහි මින් මතු "මේ කොටසේ වත්කම් සහ බැරකම් ප්‍රකාශය" යනුවෙන් හඳුන්වනු ලබන) 82 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව-

(අ) ඔහුගේ සියලු වත්කම් සහ බැරකම්;

(ආ) ඔහුගේ කලත්‍රයාගේ සියලු වත්කම් සහ බැරකම්;

(ඇ) ඔහුගෙන් යැපෙන එක් එක් දරුවන්ගේ වයස නොසලකා එම එක් එක් දරුවන්ගේ සියලු වත්කම් සහ බැරකම්;

(ඈ) ඔවුන්ගේ වයස නොසලකා ඔහුගෙන් යැපෙන වෙනත් තැනැත්තන්ගේ සියලු වත්කම් සහ බැරකම්; සහ

(ඉ) යම් තැනැත්තා මේ කොටස අදාළ වන තැනැත්තා සමඟ අන්‍යෝන්‍ය අයිතාවාසිකම් සහ බැඳීම් හුවමාරු කර නොගන්නා අවස්ථාවක දී හැර, ප්‍රකාශයේ දිනයට අවම වශයෙන් මාස හයකටවත් පෙරාතුව මේ කොටස අදාළ වන තැනැත්තා සමඟ පොදු නිවසක සහවාසයෙන් ජීවත්වන විටදී එකී වෙනත් යම් තැනැත්තාගේ සියලු වත්කම් සහ බැරකම්,

පිළිබඳ ප්‍රකාශයක් සිදු කළ යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා "වත්කම් සහ බැරකම්" යන්නෙන්, නියෝග මගින් විස්තර නියම කරනු ලැබිය යුතු, ශ්‍රී ලංකාව තුළ සහ ඉන් බැහැරව සෘජුව හෝ ප්‍රතිලාභ වශයෙන් හිමිකම් දරනු ලබන වත්කම්, බැරකම්, ආදායම, වියදම, සහ පොලී මුදල් අදහස් වේ.

වත්කම් හා බැරකම් ප්‍රකාශ සිදු කරනු ලැබිය යුත්තේ කවර විටෙක ද යන්න පිළිබඳ

**82.** (1) මේ කොටස අදාළ වන සෑම තැනැත්තකු ම නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් වත්කම් සහ බැරකම් ප්‍රකාශය-

(අ) (මෙහි මින් මතු "ප්‍රථම පත්වීමේ දී සිදු කළ යුතු ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) පත් කළ දින සිට මාස තුනක් තුළ;

(ආ) (මෙහි මින් මතු "වාර්ෂික ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) (3) වන උපවගන්තිය ප්‍රකාරව වාර්ෂිකව;

(ඇ) (මෙහි මින් මතු "ධුර කාලය අවසානයේ දී හෝ විශ්‍රාම යාමේ දී සිදු කරනු ලබන ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ රැකියාවේ නිල කාලය අවසන් වීමේ දී හෝ ඔහුගේ විශ්‍රාම දිනයෙන් හෝ ඔහු ධුරයෙන් ඉවත් කළ දිනයෙන් ඉක්බිතිව ම දින දාහතරක් තුළ;

(ඈ) (මෙහි මින් මතු "විශ්‍රාම යාමෙන් පසු සිදු කරනු ලබන ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) (ඇ) ඡේදය යටතේ ප්‍රකාශය සිදු කළ වර්ෂයට අනුගාමී වර්ෂ දෙකක් තුළ;

(ඉ) (මෙහි මින් මතු "තත්කාර්ය ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) රුපියල් මිලියන දහයක් හෝ රුපියල් මිලියන දහයකට වඩා වැඩි වත්කම් සහ බැරකම් පිළිබඳ වටිනාකමේ සුවිශේෂී වෙනස්කමක් සිදුවන අවස්ථාවක, ඒ සිදුවීමේ දින සිට මාසයක් ඇතුළත; සහ

(ඊ) අවස්ථාවෝචිත පරිදි 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ආයතන ඡන්ද විමසීම් පනත හෝ (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ, මැතිවරණ සඳහා නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇති විට දී,

සිදු කළ යුතු ය.

(2) යම් තැනැත්තකු නියම කළ දිනයේ දී මේ කොටස අදාළ නොවන තැනැත්තකු වන අවස්ථාවක දී, මේ කොටස අදාළ වන තැනැත්තකු බවට ඔහු පත්වන දින සිට මාස තුනක් ඇතුළත ඔහු විසින් මේ කොටස අදාළ වන තැනැත්තකු බවට ඔහු පත්වන දිනට ඔහුගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් සිදු කළ යුතු ය:

එසේ වුව ද, 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ද) ඡේදයේ සඳහන් පරිදි මේ කොටස අදාළ වන යම් තැනැත්තකු

විසින් ඡන්ද විමසීම පිළිබඳ දිනය ප්‍රකාශ කරනු ලබන අදාළ නීතිය යටතේ ප්‍රකාශය සිදු කරනු ලබන දිනය දක්වා වන කාලසීමාව සඳහා ඔහුගේ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ වත්කම් සහ බැරකම්වල පළමු ප්‍රකාශය භාරදීමට නියම කර ඇති සෑම තැනැත්තකු ම, මේ කොටස අදාළ වන තැනැත්තකු බවට ඔහු පත්වීම අවසන් වී ඇත්නම් මිස එක් එක් වර්ෂයේ ජුනි මස තිස්වන දින වන විට ඒ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනට ඔහුගේ වත්කම් සහ බැරකම්වල ප්‍රකාශයක් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් සිදු කළ යුතු අතර, මේ කොටස යටතේ ඔහුගේ වත්කම් සහ බැරකම්වල ප්‍රකාශයක් සිදු කිරීමට පළමුව ඔහුට නියම කළ දිනයේ ඔහු විසින් දැරූ වත්කම් සහ බැරකම් ඒ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු ය:

එසේ වුව ද, (2) වන උපවගන්තිය යටතේ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් සිදු කිරීමට නියම කර ඇති තැනැත්තකු විසින් යම් වර්ෂයක් තුළ මාර්තු මස තිස්එක් වන දිනයට පෙරාතුව මාස හයක් තුළ යම් දිනයක දී පළමු ප්‍රකාශය සිදු කර ඇති අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් කරන ලද සුවිශේෂී වෙනසක් ඔහුගේ වත්කම් සහ බැරකම්වල පවතින අවස්ථාවක ඒ වර්ෂය සඳහා වන වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් හැර (මෙහි මින් මතු "තත්කාර්ය ප්‍රකාශයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් ප්‍රකාශයක් ඒ වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලෙසට ඔහුට නියම නොකළ යුතු ය.

වත්කම් සහ බැරකම් ප්‍රකාශ පිළිබඳ ක්‍රියාවලිය

**83.** (1) වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහ සත්‍යායනය කිරීම (මෙම කොටසේ මින් මතු "මධ්‍යම අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාව විසින් පාලනය කරනු ලබන මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියක් මගින් සිදු කළ යුතු ය.

(2) (මෙහි මින් මතු "ඉලෙක්ට්‍රොනික ප්‍රකාශ" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික වත්කම් සහ බැරකම් ප්‍රකාශ සිංහල, දෙමළ නැතහොත් ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ යුතු ය.

(3) මේ පනතේ විධිවිධාන මගින් පැහැදිලිවම බැහැර කර නොමැති හෝ මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ විධිවිධාන මේ කොටසට අදාළ විය යුතු ය.

(4) ඉලෙක්ට්‍රොනික වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් සිදු කර ඇති තැනැත්තකු විසින් ඒ ප්‍රකාශයේ වෙනස් කිරීම්-

(අ) පළමුවන හෝ ඊට පසුව සිදු කරනු ලබන ප්‍රකාශ සඳහා දින පහළොවක් තුළ; සහ

(ආ) තත්කාර්ය ප්‍රකාශ සඳහා දින හතක් තුළ,

සිදු කළ හැකි අතර ඒ ක්‍රමය ඒ කාලසීමාවෙන් පසුව ස්වංක්‍රීයව ම වැසී යනු ලැබේ:

කෙසේ වුව ද, මේ කොටස අදාළ වන තැනැත්තකුට යුක්ති සහගත හේතුවක් පවතින බවට මධ්‍යම අධිකාරිය විසින් සලකනු ලබන අවස්ථාවක දී, මධ්‍යම අධිකාරියේ විශේෂ අවසරය ඇතිව අවස්ථාවෝචිත පරිදි, දින පහළොවකට හෝ දින හතකට පසුව ඔහුගේ ඉලෙක්ට්‍රොනික ප්‍රකාශයේ වෙනස්කම් සිදු කිරීමට මධ්‍යගත ඉලෙක්ට්‍රොනික ඉදිරිපත් කිරීමේ පද්ධතියට ප්‍රවේශ වීමට අවසර දෙනු ලැබිය හැකි ය.

(5) මේ කොටස අදාළ වන තැනැත්තකු (4) වන උපවගන්තිය යටතේ ස්වකීය ප්‍රකාශයේ වෙනස්කමක් සිදු කරන අවස්ථාවක දී, එකී තැනැත්තා විසින් අවශ්‍ය කරන වෙනස්කම් සිදු කිරීමට ඔහුගේ මුල් ප්‍රකාශයේ පිටපත් එකී තැනැත්තාට සැපයිය යුතු අතර එකී තැනැත්තාගේ ප්‍රකාශයේ අවසන් පිටපත සත්‍ය සහ අවසාන ප්‍රකාශය ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මේ කොටස අදාළ වන තැනැත්තකු විසින්, (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කළ යුතු ප්‍රකාශයක් භාරදීමේ දී, මධ්‍යම ඉදිරිපත් කිරීමේ අධිකාරියෙන් හෝ මධ්‍යම අධිකාරිය විසින් පත් කරන ලද යම් නිලධරයකුගේ සහාය ලබාගත හැකි ය.

(7) මධ්‍යගත ඉලෙක්ට්‍රොනික ඉදිරිපත් කිරීමේ පද්ධතිය බලාත්මකභාවයට එළඹෙන තෙක් සංක්‍රාන්ති කාලසීමාව තුළ හෝ තාක්ෂණික දෝෂ හේතුවෙන් ඉලෙක්ට්‍රොනික පද්ධතිය අඩපණ වී ඇති සුවිශේෂී අවස්ථාවක හෝ වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශ අතින් ඉදිරිපත් කිරීම සඳහා අවසර දිය යුතු ය.

**සත්‍යායන ක්‍රියාවලිය**

**84.** (1) (2) වන උපවගන්තියේ සඳහන් කරනු ලබන අවස්ථානුගතයන්හි අයුතු පොහොසත්වීම් සහ බැඳියාවන් පිළිබඳ සට්ටනයන් පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂි සොයා ගැනීම සඳහා වත්කම් සහ බැරකම් ප්‍රකාශ සත්‍යායනය කිරීම මධ්‍යම අධිකාරිය විසින් සිදු කළ යුතු ය.

(2) පහත දැක්වෙන අවස්ථානුගතයන්හි දී මධ්‍යම අධිකාරිය විසින් වත්කම් සහ බැරකම් ප්‍රකාශ සත්‍යායනය කිරීම සිදු කළ යුතු යः-

(අ) නියෝග මගින් නියම කරන ලද ක්‍රියාපටිපාටියට අනුව එම සත්‍යායනය කිරීම සඳහා එකී ප්‍රකාශ තෝරා ගෙන ඇති විට;

(ආ) ඉලෙක්ට්‍රොනික පද්ධතිය මගින් වෙනස්කම් සහ අවදානම් ස්වයංක්‍රීයව අනාවරණය කර ගැනීම මත;

(ඇ) මේ කොටස අදාළ වන තැනැත්තකු සම්බන්ධයෙන්, අයුතු පොහොසත්වීම් හෝ බැඳියාවන් පිළිබඳ සට්ටනයක් පිළිබඳව යම් තැනැත්තකුගෙන් පැමිණිල්ලක් ලැබුණු පසු; හෝ

(ඈ) ජනතාවගේ මාර්ගයෙන් හෝ ස්වකීය විමර්ශන මාර්ගයෙන් බැලූ බැල්මට ඔප්පු වන්නා වූ සිදු විය හැකි උල්ලංඝන මධ්‍යම අධිකාරිය විසින් සිය මෙහෙයවීමෙන් සොයාගත් විට.

(3) වන උපවගන්තිය යටතේ සිදු කරනු ලබන සත්‍යායනයක් මගින් යම් අයථා පොහොසත්වීමක් සොයාගැනීම 42 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වන විමර්ශනයකට මඟ සලසනු ඇත.

**වෙනත් වාර්තාවලට ප්‍රවේශ වීම**

**85.** (1) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ප්‍රවේශය ලද තොරතුරු, බැඳියාවන්ගේ සට්ටනයකට ඉඩ සලසන හෝ එසේ ඉඩ සැලසිය හැකි වත්කම්, බැරකම්, ආදායම්, වියදම් සහ සම්බන්ධතාවලට අදාළ වන තාක් දුරට, වත්කම් හා බැරකම් ප්‍රකාශ සත්‍යායනය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ පිහිටි වෙනත් යම් පොදු අධිකාරියක වාර්තා සහ දත්ත සමුදායන් වෙත මධ්‍යම අධිකාරියට ප්‍රවේශය තිබිය යුතු ය.

(2) මේ කොටසේ කාර්ය සඳහා, පොදු අධිකාරිය යන්නට, 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ ඇති අර්ථය ම තිබිය යුතු අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව සහ ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සහ හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ඇතුළත් විය යුතු ය.

*වත්කම් සහ බැරකම් ප්‍රකාශය විමසා බැලීමේ බලතල*

**86.** නීතිපතිවරයාට, කොමිෂන් සභාවට, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට, විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට, පොලිස්පතිවරයාට, විශේෂ පොලිස් ඒකකවල නම් කළ නිලධරයන්ට, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ මූල්‍ය බුද්ධි ඒකකයේ නම් කළ නිලධරයන්ට මධ්‍යම අධිකාරියේ අනුමතය ඇතිව මේ කොටස යටතේ ඉදිරිපත් කර ඇති යම් වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් ඉල්ලා සිටීමට සහ ඒ පිළිබඳ විමසා බැලීමට අයිතිය තිබිය යුතු ය.

*මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය*

**87.** (1) මේ කොටස අදාළ වන සෑම තැනැත්තකුගේ ම වත්කම් සහ බැරකම්වලට අදාළව තොරතුරු සුරක්ෂිත කිරීමේ කාර්ය සඳහා මධ්‍යම අධිකාරිය විසින් (මෙහි මින් මතු "මධ්‍යම ඉලෙක්ට්‍රොනික පද්ධතිය" වශයෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් පවතින දත්ත මූලයක් පවත්වාගෙන යා යුතු ය.

(2) මධ්‍යම ඉලෙක්ට්‍රොනික පද්ධතිය පවත්වාගෙන යා යුතු ආකාරය නියම කිරීම සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ විධිවිධාන අදාළ වන යම් දත්ත, පණිවුඩ, ඉලෙක්ට්‍රොනික ලේඛන, ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ වෙනත් ලේඛනයක් සඳහා හෝ ඒ සම්බන්ධයෙන් 1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ අන්තර්ගත කිසිවක් අදාළ නොවිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය භාවිත කිරීමට බලය පැවරීම හෝ පහසුකම් සැලසීම රීති මගින් නිශ්චය කළ යුතු ය.

*ජනතා ප්‍රවේශය*

**88.** (1) මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය මගින් ජනතාවට ප්‍රවේශ විය හැකි සෑම වත්කම් සහ බැරකම් ප්‍රකාශයක ම සංස්කරණය

කළ පිටපතක් කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා එය ඉදිරිපත් කළ දින සිට මාස තුනක් ඇතුළත ස්වයංක්‍රීයව ම නිකුත් කළ යුතු ය. ඒ සංස්කරණය කළ පිටපතට-

(අ) ප්‍රකාශකයාගේ හෝ ප්‍රකාශකයා විසින් ප්‍රකාශ කරන වත්කම් අයිති තැනැත්තාගේ පදිංචි ස්ථානයේ ලිපිනය;

(ආ) ඉඩකඩම් දේපළ පිහිටා ඇති කොට්ඨාසය සහ දිස්ත්‍රික්කයට අදාළ තොරතුරු හැර ප්‍රකාශිත ඉඩකඩම් දේපළවල සම්පූර්ණ ලිපිනය/ ලිපිනයන්;

(ඇ) ප්‍රකාශයේ සඳහන් කළ පුද්ගලයන් හඳුනාගැනීමේ කාර්ය සඳහා උපන් දිනය, ජාතික හැඳුනුම්පත් අංකය, ගුවන් ගමන් බලපත්‍ර අංකය හෝ අදාළ අධිකාරිය විසින් පිළිගත් වෙනත් යම් අංකයක්; හෝ

(ඈ) බැංකු ගිණුම් අංක,

ඇතුළත් නොකළ යුතු ය.

(2) මධ්‍යම අධිකාරියේ කටයුතු ආරම්භ කර මාස තුනක කාලසීමාවක් ඇතුළත මධ්‍යම අධිකාරිය විසින් 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 23 වන වගන්තියේ නියමයන්ට අනුව මධ්‍යම අධිකාරියේ තොරතුරු නිලධරයා ලෙස නිලධරයකු පත් කළ යුතු අතර මධ්‍යම අධිකාරියේ ප්‍රධානියා එකී පනතේ කාර්යයන් සඳහා නම් කළ නිලධරයා විය යුතු ය.

ඡන්ද අපේක්ෂකයකුගේ ප්‍රකාශවලට ප්‍රවේශ වීම

**89.** 80 වන වගන්තියේ (ද) ඡේදයේ සඳහන් කරන ලද මැතිවරණවල සියලු අපේක්ෂකයන් විසින් වත්කම් සහ බැරකම් ප්‍රකාශයේ ආකෘති පිටපතක් සහ වත්කම් බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ලුහුඬු සටහනක් ඒ අපේක්ෂකයාගේ නාමයෝජනා පත්‍ර සමඟ මැතිවරණ කොමසාරිස්වරයා වෙත භාරදිය යුතු ය.

වත්කම් සහ බැරකම් ප්‍රකාශයට අදාළ වැරදි

**90.** (1) මේ කොටස යටතේ වත්කම් සහ බැරකම් ප්‍රකාශය ලබා දෙනු ලැබිය යුතු තැනැත්තකු විසින්, මේ කොටසේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන්නේ නම්, එක් එක්

වර්ෂයේ ජුනි මස තිස්වන දින සිට සති දෙකක කාලයක් ඇතුළත මධ්‍යම අධිකාරිය මගින් ලිපි යැවීම මගින් එකී තැනැත්තාට අවවාද කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 82 වන වගන්තිය යටතේ වාර්ෂික ප්‍රකාශය හෝ පශ්චාත් විශ්‍රාම ප්‍රකාශය නියමිත දිනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු, ප්‍රකාශය ලබාදිය යුතු නියමිත දිනයේ සිට ජූලි මස තිස්එක් වන දින දක්වා වන කාලය සඳහා මධ්‍යම අධිකාරිය විසින් නියම කරනු ලබන, ප්‍රකාශය කළ යුතු තැනැත්තාගේ අවසන් මාසික දළ වැටුපෙන් තිහෙන් එකකට සමාන දෛනික පරිපාලන දඩ මුදලකට යටත් විය යුතු ය. පසුගිය මාස හය සඳහා අදාළ වන දළ වැටුපෙන් තිහෙන් එකකට සමාන වැඩි කරන ලද දෛනික පරිපාලන දඩ මුදලක්, අගෝස්තු මස පළමුවන දින සිට තිස්එක් වන දින දක්වා ප්‍රමාද වී ඉදිරිපත් කිරීම සඳහා ගෙවීමට නියම කෙරෙනු ඇත. අවස්ථාවෝචිත පරිදි, දඩ මුදල පාරිශ්‍රමිකයේ හෝ විශ්‍රාම ප්‍රතිලාභයේ අධිභාරයක් විය යුතු ය.

(3) මේ පනතේ 82 වන වගන්තිය යටතේ, තම මුල් පත්වීමේ ප්‍රකාශය, තත්කාර්ය ප්‍රකාශය හෝ ධුර කාලය අවසානයේ හෝ විශ්‍රාම යාමේදී සිදු කරන ප්‍රකාශය නියමිත දිනයට එවීමට අපොහොසත් වන යම් තැනැත්තකු, මධ්‍යම අධිකාරිය විසින් නියම කරනු ලබන, ප්‍රකාශකයා අවසන් වරට ලබාගත් දළ මාසික වැටුපෙන් තිහෙන් එකකට සමාන දෛනික පරිපාලන දඩ මුදලකට යටත් විය යුතු ය. ගෙවීම් කිරීම සඳහා නියමිත දිනයට පසු දින දාහතරක් තෙක් ප්‍රමාදවීම් සඳහා දඩ මුදල නියම කරනු ලැබේ. එකී ප්‍රකාශය භාර දීමට නියමිතව තිබූ දිනයට පසු දින දාහතරත් විසිඅටත් අතර කාලය තුළ සිදු කරන ප්‍රමාදවී කරනු ලබන ගෙවීම් සඳහා පසුගිය මාස හය සඳහා ලබාගත් දළ මාසික වැටුප්වල තිහෙන් එකකට සමාන වැඩිකරන ලද දෛනික පරිපාලන දඩ මුදල් පනවනු ලැබිය යුතු ය.

(4) ඡන්ද විමසීම සඳහා නාමයෝජනා සඳහා වන ඉල්ලුම් පත්‍රය සමඟ තම වත්කම් හා බැරකම් ප්‍රකාශය භාරදීමට අපොහොසත් වන යම් තැනැත්තකු, අදාළ ලිඛිත නීතිවල විධිවිධානවලට අනුකූලව දණ්ඩනයකට යටත් විය යුතු ය.

(5) වාර්ෂික ප්‍රකාශය හෝ ධුර කාලය අවසානයේ දී හෝ විශ්‍රාම යාමේ දී සිදු කරන ප්‍රකාශය අවස්ථාවෝචිත පරිදි, අදාළ වර්ෂයේ සැප්තැම්බර් පළමු වන දා තෙක් යැවීමට අපොහොසත් වන

තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී අනතුරුව, එකී තැනැත්තා විසින් අවසන් වරට ලබාගත් මාස දොළහක දළ වැටුප්වලට සමාන දඩ මුදලකට හෝ අවුරුද්දකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩ මුදල සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය:

එසේම තවදුරටත්, කොමිෂන් සභාව විසින්, සත්‍යායනය කිරීමේ කාර්ය සඳහා, එකී භාර නොදීම් පිළිබඳ විමර්ශනය කළ යුතු ය.

(6) පළමු පත්වීම් ප්‍රකාශය, තත්කාර්ය ප්‍රකාශය හෝ සේවා අවසන් කිරීමේ ප්‍රකාශය හෝ විශ්‍රාම ප්‍රකාශය, නියමිත දිනට පසු දින විසිඅටක් ඇතුළත භාර දීමට අපොහොසත් වන යම් තැනැත්තකු, වරදක් සිදු කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී, එකී තැනැත්තා,

(අ) යම් තැනැත්තකු විසින් තම පළමු පත්වීම් ප්‍රකාශය භාර දීමට අපොහොසත් වන අවස්ථාවක දී, රුපියල් ලක්ෂයක්;

(ආ) යම් තැනැත්තකු විසින් තම තත්කාර්ය ප්‍රකාශය භාරදීමට අපොහොසත් වන අවස්ථාවක දී, රුපියල් ලක්ෂයක්; හෝ

(ඇ) යම් තැනැත්තකු විසින් තම ධුර කාලය අවසානයේ හෝ විශ්‍රාම යාමේ දී සිදු කරන ප්‍රකාශය භාරදීමට අපොහොසත් වන අවස්ථාවක දී, එකී තැනැත්තා අවසන් වරට ලබා ගත් දළ වැටුප,

ට සමාන දඩ මුදලකට හෝ අවුරුද්දකට නොවැඩි සිර දඬුවමකට හෝ දඩ මුදලකට හා සිර දඬුවම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

එසේම තවදුරටත්, කොමිෂන් සභාව විසින්, සත්‍යායනය කිරීමේ කාර්ය සඳහා භාර නොදීම් පිළිබඳ විමර්ශනය කළ යුතු ය.

(7) (අ) යම් ප්‍රකාශයක යම් අසත්‍ය ප්‍රකාශයක් සිදු කරන; හෝ

(ආ) යම් ප්‍රකාශයකින් යම් වත්කමක් හෝ බැරකමක් සිතාමතාම ඉවත් කරනු ලබන,

යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අනතුරුව එකී තැනැත්තා රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩ මුදලකට හෝ අවුරුද්දකට නොවැඩි සිර දඬුවමකට හෝ දඩ මුදල සහ සිර දඬුවම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(8) සාධාරණ හේතුවක් නොමැතිව, කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි අතිරේක තොරතුරු සැපයීමට අපොහොසත් වන යම් තැනැත්තකු, වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, එකී තැනැත්තා, රුපියල් ලක්ෂයකට නොවැඩි දඩ මුදලකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක අවුරුද්දකට නොවැඩි සිර දඬුවමකට හෝ දඩ මුදල සහ සිර දඬුවම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(9) (6) වන හෝ (7) වන උපවගන්ති යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තකු විසින්, වරදකරු කරනු ලැබූ දිනයට පසු දින දාහතරක කාලය ඇතුළත හෝ එකී වරදකරු කිරීමට එරෙහිව අභියාචනය කරනු ලබන අවස්ථාවක දී, එකී වරදකරු කිරීම සහතික කොට ප්‍රකාශ කිරීමෙන් පසු දින දාහතරක කාලය ඇතුළත, 81 වන වගන්තියේ සඳහන් කරනු ලැබ ඇති වත්කම් සහ බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු ය. මේ කොටසේ 79 වගන්තියේ විධිවිධාන සහ ඊට පෙරාතුව වූ වෙනත් වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව 81 වන වගන්තිය යටතේ යම් වත්කම් සහ බැරකම් ප්‍රකාශයන්ට එය අදාළ වන තාක් දුරට සහ ඒ ආකාරයෙන් ම මේ උපවගන්තිය යටතේ එකී තැනැත්තා විසින් සිදු කරනු ලබන යම් වත්කම් සහ බැරකම් ප්‍රකාශයකට අදාළ කරගත යුතු ය.

(10) යම් තැනැත්තකු (7) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වන වරදකට වරදකරු වන අවස්ථාවක දී, එකී වරද සිදු කරන ලද්දේ යම් වත්කමක් සම්බන්ධයෙන් ද එම වත්කම එකී වරදකරු කිරීම ප්‍රකාරව සියලු බැඳීම්වලින් නිදහස්ව රජය සතු වනු ලැබිය යුතු ය.

(11) ඉහත (10) වන උපවගන්තිය යටතේ යම් වත්කමක් රජය සතු වනු ලැබීම-

(අ) රජය සතු කිරීමේ නියෝගය සහතික කිරීමේ හෝ පිළිගැනීමේ අභියාචන තීරණය මත, රජය සතු කිරීමේ නියෝගයට එරෙහිව අභියාචනාධිකරණය වෙත හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක දී එකී රජය සතු කිරීමේ නියෝගය සහතික කරමින් හෝ පිළිගනිමින් තීරණය දීම; හෝ

(ආ) රජය සතු කිරීමේ නියෝගයට එරෙහිව අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය හැකි කාලය ඉකුත් වූ පසුව, එකී නියෝගයට එරෙහිව කිසිදු අභියාචනයක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක දී,

බලාත්මක විය යුතු ය.

(12) මධ්‍යම අධිකාරිය විසින් මේ පරිච්ඡේදය යටතේ යම් තැනැත්තකු වෙත පනවනු ලබන සියලු පරිපාලන දඩ මුදල්, අවස්ථාවෝචිත පරිදි, එකී තැනැත්තාගේ පාරිශ්‍රමික හෝ විශ්‍රාම ප්‍රතිලාභය මත අධිභාරයක් ලෙස අය කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාවේ අරමුදලට ප්‍රේෂණය කළ යුතු ය.

අතිරේක තොරතුරු ඉල්ලා සිටීමට කොමිෂන් සභාවට ඇති බලතල

**91.** මධ්‍යම අධිකාරිය විසින්, යම් ඕනෑම අවස්ථාවක දී කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් අතිරේක තොරතුරු-

(අ) මේ කොටස යටතේ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති සහ මේ කොටස යටතේ ඉදිරිපත් කළ යම් තොරතුරු හෝ ප්‍රකාශය භාවිත කරන යම් තැනැත්තකුගෙන්; හෝ

(ආ) වෙනත් යම් තැනැත්තකුගෙන්, යම් තොරතුරු, වාර්තා හෝ ලේඛන,

කොමිෂන් සභාව විසින් මේ පනතේ I වන කොටස යටතේ එහි කටයුතු ඉටු කිරීම සඳහා ඉල්ලා සිටිය හැකි ය.

වත්කම් සහ බැරකම්

**92.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ කොටසේ "වත්කම් සහ බැරකම්" යන්නෙන්, ශ්‍රී ලංකාව ඇතුළත හෝ පිටත, බැඳියාවන් පිළිබඳ සට්ටනයකට තුඩු දෙන හෝ තුඩු දිය හැකි, නියෝග මගින් එහි විස්තර නියම කරනු ලැබිය යුතු, වත්කම්, බැරකම්, ආදායම්, වියදම් සහ පොලී මුදල් අදහස් වේ.

## III වන කොටස

### I වන පරිච්ඡේදය

### අල්ලස් හෝ දූෂණවලට අදාළ වැරදි

ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ මහාධිකරණයේ විනිසුරුවරුන්, අධිකරණ නිලධරයන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අල්ලස්

**93.** (අ) ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ යම් විනිසුරුවරයකුට, අධිකරණ නිලධරයකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට, එකී විනිසුරුවරයා, නිළධරයා හෝ මන්ත්‍රිවරයා විසින් තම අධිකරණමය තත්ත්වයෙන් හෝ මන්ත්‍රීවරයකුගේ තත්ත්වයෙන් යම් ක්‍රියාවක් කරනු ලැබීමට හෝ නොකරනු ලැබීමට පෙලඹවීමක් ලෙස හෝ ත්‍යාගයක් ලෙස යම් තුටු පඬුරුක් පිරිනමන; හෝ

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ, මහාධිකරණයේ විනිසුරුවරයකු ව සිටිමින් හෝ අධිකරණ නිලධරයකු ව සිටිමින් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව එකී අධිකරණයමය තත්ත්වයෙන් හෝ මන්ත්‍රීවරයකුගේ තත්ත්වයෙන් යම් ක්‍රියාවක් කිරීම හෝ නොකර හැරීම සඳහා පෙලඹවීමක් ලෙස හෝ ත්‍යාගයක් ලෙස යම් තුටු පඬුරක් ඉල්ලා සිටින හෝ පිළිගනු ලබන,

යම් තැනැත්තකු මේ පනත යටතේ අල්ලස් වරදක් සිදු කරනු ලබන අතර වරදකරු කිරීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලසීමාවකට බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු යඃ

කෙසේ වුව ද, යම් පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකුගේ නඩත්තු කාර්යයන් සඳහා පමණක් යම් දීමනාවක් හෝ වෙනත් ගෙවීමක්

යම් වෘත්තීය සංගමයක් හෝ වෙනත් සංවිධානයක් මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට පිරිනැමීම හෝ එවැනි යම් වෘත්තීය සංගමයක් හෝ වෙනත් සංවිධානයකින් එවැනි යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් ස්වකීය නඩත්තු කාර්යයන් සඳහා පමණක් යම් දීමනාවක් හෝ වෙනත් ගෙවීමක් පිළිගැනීම මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ වරදක් නොවිය යුතු ය.

රජයේ සේවකයන්ගේ සම්මුඛ පරීක්ෂණයක් සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් තුටු පඬුරු පිළිගැනීම

**94.** (අ) යම් තැනැත්තකු වෙනුවෙන් යම් රජයේ සේවකයකු සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීම සඳහා; හෝ

(ආ) අධිකරණ හෝ ක්වාසි අධිකරණ බලතල ක්‍රියාත්මක කරන රජයේ සේවකයකු ඉදිරියේ යම් තැනැත්තකු වෙනුවෙන් පෙනී සිටීම සඳහා,

පෙලඹවීමක් හෝ පිරිනැමීමක් ලෙස යම් තුටු පඬුරු ඉල්ලා සිටින හෝ පිළිගන්නා යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලයකට බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු යː

එසේ වුව ද, රජයේ සේවකයකු සාමාජිකයකු නොවන අධිකරණයක් ඉදිරියේ හෝ ව්‍යවස්ථාපිත විනිශ්චය සභාවක් ඉදිරියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නීතිඥයකු ලෙස පෙනී සිටීම මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ වරදක් නොවිය යුතු ය.

ඉලෙක්ට්‍රොනික වත්කම් ප්‍රකාශන පද්ධතියට නීති විරෝධීව ප්‍රවේශ වීම වරදක් විය යුතු බව

**95.** මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියට නීති විරෝධීව හෝ නිසි අවසරයක් නොමැතිව ප්‍රවේශයක් ලබාගන්නා යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර වරදකරු කිරීමේ දී රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලසීමාවකට බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

පොලිස් නිලධරයන්, සාම නිලධරයන් සහ වෙනත් රජයේ සේවකයන් අල්ලස් ගැනීම

**96.** (අ) යම් තත්ත්වයකින් සේවයේ නිරත වී ඇති යම් පොලිස් නිලධරයකුට, සාම නිලධරයකුට හෝ වෙනත් රජයේ සේවකයකුට වරදකරුවන්ට එරෙහිව නඩු පැවරීම, රඳවා තබා ගැනීම හෝ දඬුවම් කිරීම සඳහා හෝ අධිකරණයේ යම් නිලධරයකුට එම නිලධරයා විසින්, නිසි පරිදි යුක්තිය පසිඳලීම කෙරෙහි මැදිහත්වීම සඳහා පෙලඹවීමක් හෝ පිරිනැමීමක් ලෙස හෝ යම් වරදක්

සිදු කිරීම සඳහා කුමන්ත්‍රණ කිරීම හෝ පහසුකම් සැලැස්වීම හෝ යම් වරදකරුවකු රඳවා තබා ගැනීමෙන් හෝ දඬුවම් කිරීමෙන් ආරක්ෂා කිරීම සඳහා හෝ යම් තැනැත්තකුට තුවාල සිදු කිරීමක් හෝ හානියක් වන පරිදි ඔහුගේ නිල බලතල අවභාවිතය සඳහා යම් අල්ලස් සපයන තැනැත්තකු; හෝ

(ආ) එවැනි යම් සේවකයකු හෝ නිලධරයකු වෙමින් මේ වගන්තියේ (අ) ඡේදයේ සඳහන් කර ඇති පරිදි යම් මැදිහත් වීමක්, කුට්ටනය කිරීමක්, පහසුකම් සැලසීමක්, ආරක්ෂා කිරීමක් හෝ අයුතු භාවිතයක් සඳහා පෙලඹවීමක් හෝ ප්‍රදානයක් ලෙස යම් තුටු පඬුරක් ඉල්ලා සිටින හෝ පිළිගන්නා තැනැත්තකු,

මේ පනත යටතේ අල්ලස් දීමේ වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලයකට බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

ගිවිසුම්වලට අදාළ ව සහාය ලබාදීමට හෝ බලපෑමක් සිදු කිරීම සඳහා අල්ලස්

**97.** (අ) යම් කාර්යයක් ඉටුකිරීම, යම් සේවාවක් සැපයීම, යම් දෙයක් සිදු කිරීම හෝ යම් ද්‍රව්‍යයක්, උපකරණයක් හෝ දෙයක් සැපයීම සඳහා හෝ එවැනි යම් ගිවිසුමක් ක්‍රියාවේ යෙදවීම සඳහා හෝ එහි නියම කරන ලද මිලක් හෝ ප්‍රතිෂ්ඨාවක් හෝ එහි ඇතුළත් දේ සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් සහනාධාරයක් ගෙවීම සඳහා රජය සමග යම් ගිවිසුමක් ඇති කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ දී යම් රජයේ සේවකයකුගේ සහාය දීම හෝ බලපෑම භාවිත කිරීම සඳහා පෙලඹවීමක් හෝ ප්‍රදානයක් ලෙසට ඒ රජයේ සේවකයාට තුටු පඬුරක් දෙන තැනැත්තකු; හෝ

(ආ) මේ වගන්තියේ (අ) ඡේදයේ සඳහන් කළ පරිදි යම් ඕනෑම ගිවිසුමක් ඇති කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ දී හෝ එවැනි යම් ගිවිසුමක් ක්‍රියාවේ යෙදවීමේ දී හෝ එහි නියම කර ඇති මිලක් හෝ ප්‍රතිෂ්ඨාවක් හෝ ඒ සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් සහනාධාරයක් ගෙවීමේ දී සහාය ලබා දීම සඳහා හෝ ඒ කෙරෙහි බලපෑම් සිදු කිරීම සඳහා පෙලඹවීමක් හෝ ප්‍රදානයක්

ලෙස යම් තුටු පඩුරක් ඉල්ලා සිටින හෝ පිළිගන්නා රජයේ සේවකයකු වන තැනැත්තකු,

වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

ටෙන්ඩර් ඉල්ලා අස්කර ගැනීම සඳහා සපයන අල්ලස්

**98.** (අ) යම් කාර්යක් ඉටු කිරීම, යම් සේවාවක් සැපයීම, යම් දෙයක් සිදු කිරීම හෝ යම් භාණ්ඩ, ද්‍රව්‍ය හෝ සැපයීම සඳහා කොන්ත්‍රාත්තුවක් රජයෙන් ලබාගැනීමට අරමුණු කරන ඒ කොන්ත්‍රාත්තුව සඳහා ටෙන්ඩරයක් ඉදිරිපත් කර ඇති යම් තැනැත්තකුට ඒ ටෙන්ඩරය ඔහු විසින් ඉල්ලා අස්කර ගැනීම සඳහා පෙලඹවීමක් හෝ ප්‍රදානයක් ලෙස තුටු පඩුරක් පිරිනමන යම් තැනැත්තකු; හෝ

(ආ) (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති, ඔහු විසින් ඒ කොන්ත්‍රාත්තුව සඳහා ඉදිරිපත් කළ ටෙන්ඩරය ඔහු විසින් ම ඉල්ලා අස්කර ගැනීම සඳහා පෙලඹවීමක් හෝ ප්‍රදානයක් ලෙස යම් තුටු පඩුරක් ඉල්ලා සිටින හෝ පිළිගන්නා තැනැත්තකු,

මේ පනත යටතේ අල්ලස් වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

රජයේ කටයුතු සම්බන්ධයෙන් අල්ලස්

**99.** (අ) යම් රජයේ සේවකයකුගේ යම් නිල කටයුත්තක් ඉටු කිරීම හෝ ඉටු නොකිරීම හෝ එම රජයේ සේවකයා හෝ වෙනත් යම් රජයේ සේවකයකු විසින් යම් නිල කටයුත්තක් ඉටු කිරීම, කඩිනම් කිරීම, ප්‍රමාද කිරීම, බාධා කිරීම හෝ වැළැක්වීම සඳහා හෝ රජය සමඟ යම් කටයුත්තක දී යම් තැනැත්තකුට සහාය දීම, අනුග්‍රහ ලබා දීම, බාධා කිරීම හෝ ප්‍රමාද කිරීම සඳහා පෙලඹවීමක් හෝ ප්‍රදානයක් ලෙස රජයේ සේවකයකුට යම් තුටු පඩුරක් පිරිනමන යම් තැනැත්තකු;

(ආ) මේ වගන්තියේ (අ) ඡේදයේ සඳහන් කරන ලද පරිදි ඔහුගේ යම් නිල කටයුත්තක් ඉටු කිරීම හෝ ඉටුකිරීමෙන් වැළකීම සඳහා හෝ එවැනි යම් නිල කටයුත්තක් ඉටු කිරීම කඩිනම් කිරීම්, ප්‍රමාද කිරීම්, බාධා කිරීම්, වැළැක්වීම්, සහාය දීම් හෝ අනුග්‍රහ දැක්වීම් සඳහා පෙලඹවීමක් හෝ ප්‍රදානයක් ලෙස යම් තුටු පඬුරක් අයදින හෝ පිළිගන්නා රජයේ සේවකයකු වන යම් තැනැත්තකු; හෝ

(ඇ) යම් තුටු පඬුරක් අයදින හෝ පිළිගන්නා රජයේ සේවකයකු වන තැනැත්තකු,

මේ පනත යටතේ අල්ලස් වරදක් සිදු කරන අතර, වරදකරු කිරීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු යː

එසේ වුව ද, යම් ලිඛිත නීතියකින් හෝ ඔහුගේ සේවා නියමයන්ට අනුව ලබා ගැනීමට බලය දී ඇති යම් තුටු පඬුරක් රජයේ නිලධරයකු විසින් අයදීම හෝ පිළිගැනීම වරදක් නොවිය යුතු යː

එසේම තවදුරටත්, (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 35 වන වගන්තිය යටතේ රජයේ නිලධරයකු වන වෛද්‍ය වෘත්තිකයකුට යම් තුටු පඬුරක් අයදීමට හෝ පිළිගැනීමට අයිතිය ලබා නොදෙන්නේ ය.

හිමිකම් පෑම්, ගෙවීම්, පත්කිරීම්, රැකියා ප්‍රදාන, බදුකර සහ වෙනත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් අල්ලස්

**100.** (අ) (i) යම් තැනැත්තකු ඔහුගේ සහායෙන් යම් හිමිකමක් සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් රජයෙන් ගෙවීම සඳහා;

(ii) පළමුව සඳහන් කළ තැනැත්තා හෝ වෙනත් යම් තැනැත්තකු යම් නිලයකට පත් කිරීමේ දී ඒ තැනැත්තාගේ සහාය හෝ උපකාරය සඳහා;

(iii) වෙනත් යම් තැනැත්තකු යම් නිලයකට පත් කිරීම වැළැක්වීම සඳහා;

(iv) රජයේ යම් දෙපාර්තමේන්තුවක, කාර්යාලයක හෝ ආයතනයක යම් තැනැත්තකුගේ යම් රැකියාවක් සඳහා හෝ පළමුව සඳහන් කළ තැනැත්තාගේ යම් රැකියාවක් සඳහා හෝ සැපයීම, හෝ ලබා ගැනීම සඳහා උපකාර කිරීම සඳහා;

(v) රජයේ දෙපාර්තමේන්තුවක, කාර්යාලයක හෝ ආයතනයක වෙනත් යම් තැනැත්තකු සඳහා රැකියාවක් ලබා දීම වැළැක්වීම සඳහා;

(vi) පළමුව සඳහන් කළ තැනැත්තාට හෝ වෙනත් යම් තැනැත්තකුට රජයෙන් යම් ප්‍රදානයක්, බද්දක්, සේවාවක්, අනුග්‍රහයක්, වාසියක් හෝ වෙනත් ප්‍රතිලාභ ඔහු විසින් සැපයීම හෝ ලබා ගැනීම තහවුරු කිරීම සඳහා උදව් දීම සඳහා; හෝ

(vii) වෙනත් යම් තැනැත්තකු සඳහා එවැනි යම් ප්‍රදාන, බදු දීම්, සේවා, අනුග්‍රහ, වාසි හෝ වෙනත් ප්‍රතිලාභ ලබාදීම වැළැක්වීම සඳහා; හෝ

පෙලඹවීමක් හෝ ප්‍රදානයක් හෝ ලෙස යම් තැනැත්තකුට යම් තුටු පඬුරු පිරිනමන; හෝ

(ආ) මේ වගන්තියේ (අ) ඡේදයේ (i) වන , (ii) වන, (iii) වන, (iv) වන, (v) වන, (vi) වන සහ (vii) වන යන අනුඡේදවල නිශ්චිතව සඳහන් කරන ලද යම් ක්‍රියාවක් ඔහු විසින් කිරීම සඳහා පෙලඹවීමක් හෝ ප්‍රදානයක් ලෙස යම් තුටු පඬුරක් අයදින හෝ පිළිගන්නා,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

රජය සමඟ සම්බන්ධතාවයක් දක්වන තැනැත්තන් විසින් රජයේ සේවකයන්ට දෙන අල්ලස්

**101.** (අ) රජයේ යම් දෙපාර්තමේන්තුවක්, කාර්යාලයක් හෝ ආයතනයක් හරහා රජය සමඟ කවර හෝ ආකාරයක සම්බන්ධතාවක් දක්වන තැනැත්තකු විසින් ඒ දෙපාර්තමේන්තුවේ, කාර්යාලයේ හෝ ආයතනයේ සේවයේ නියුතු යම් රජයේ සේවකයකුට යම් තුටු පඬුරු පිරිනමන;

(ආ) රජයේ යම් දෙපාර්තමේන්තුවක්, කාර්යාලයක් හෝ ආයතනයක් හරහා රජය සමඟ සිදු කරන යම් ආකාරයක ගනුදෙනු කරනු ලැබ එසේ කිරීමට පෙර වසරක් ඇතුළත හෝ එසේ කිරීමෙන් වසරක් තුළ ඒ දෙපාර්තමේන්තුවේ, කාර්යාලයේ හෝ ආයතනයේ සේවයේ නියුතු යම් රජයේ සේවකයකුට යම් තුටු පඬුරක් පිරිනමන; හෝ

(ඇ) මේ වගන්තිය යටතේ වරදක් වන්නා වූ, පිරිනැමීමක් වන යම් තුටු පඬුරක් අයදින හෝ පිළිගන්නා රජයේ සේවකයකු වන යම් තැනැත්තකු,

මේ පනත යටතේ අල්ලස් වරදක් සිදු කරන අතර වරදකරු කිරීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු යඃ

එසේ වුව ද, මේ වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරන ලද රජයේ සේවකයකුට එවැනි තුටු පඬුරක් පිරිනැමීමේ දී ඒ පිරිනමන්නා විසින්, ඒ ඡේදයේ සඳහන් කළ පරිදි එවැනි ගනුදෙනුවලට සම්බන්ධ සහ අදාළ නොවන කාර්යයක් සඳහා සද්භාවයෙන් පිරිනැමූ තුටු පඬුරක් බවට ඔප්පු කරන්නේ නම්, ඒ තුටු පඬුරු පිරිනැමීම මේ වගන්තිය යටතේ වරදක් නොවිය යුතු ය.

පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක, හෝ උපලේඛනගත ආයතනයක පාලන මණ්ඩලයක සාමාජිකයකුගේ අල්ලසක් සහ පළාත් පාලන ආයතනයක හෝ එකී උපලේඛනගත ආයතනයක නිලධරයකුගේ අල්ලසක්

**102.** (අ) (i) යම් පළාත් පාලන ආයතනයක, උපලේඛනගත ආයතනයක, පාලන මණ්ඩලයකට හෝ කමිටුවකට භාරදෙන ලද යම් පියවරකට, යෝජනා සම්මතයකට හෝ ප්‍රශ්නයකට අනුග්‍රහයක් ලෙස හෝ එරෙහිව ඒ පළාත් පාලන ආයතනයේ, උපලේඛනගත ආයතනයේ හෝ පාලන මණ්ඩලයක හෝ එහි කමිටුවක දී යම් සාමාජිකයකු විසින් ඡන්දය දීම හෝ ඡන්දය දීමෙන් වැළකීම සඳහා;

(ii) යම් සාමාජිකයකු විසින් කටයුතු ඉටු කිරීම හෝ ඉටු කිරීමෙන් වැළැක්වීමේ හෝ ඔහුගේ සහායෙන් යම් රාජකාරි කටයුත්තක් ලබා ගැනීම කඩිනම් කිරීම, ප්‍රමාද කිරීම, බාධා කිරීම හෝ ඉටුකිරීමෙන් වැළැකීම සඳහා; හෝ

(iii) ඒ සාමාජිකයාගේ සහායෙන්, යම් තැනැත්තකු වෙනුවෙන් යම් ඡන්දයක් සම්මත කිරීම හෝ යම් කොන්ත්‍රාත්තුවක් හෝ වාසියක් ප්‍රදානය කිරීම සලසනු ලැබීම හෝ වැළැක්වීම සඳහා,

පෙලඹවීමක් හෝ ප්‍රදානයක් ලෙස පළාත් පාලන ආයතනයක හෝ පළාත් සභාවක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලන මණ්ඩලයක යම් සාමාජිකයකුට තුටු පඬුරක් ප්‍රදානය කරන;

(ආ) (i) යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ යම් නිල කටයුත්තක් ඉටුකිරීමේ හෝ ඉටුකිරීමෙන් වැළැක්වීමේ හෝ ඔහුගේ සහායෙන් සැලසීම, කඩිනම් කිරීම, ප්‍රමාද කිරීම, බාධා කිරීම හෝ ඉටුකිරීමෙන් වැළැකීම සඳහා හෝ;

(ii) යම් තැනැත්තකු වෙනුවෙන් යම් කොන්ත්‍රාත්තුවක් හෝ වාසියක් ප්‍රදානය කිරීම හෝ යම් ඡන්දයක් සම්මත කිරීමක දී ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහාය ලබා ගැනීම හෝ වැළැක්වීම සඳහා,

පෙලඹවීමක් හෝ ප්‍රදානයක් ලෙස යම් පළාත් පාලන ආයතනයක හෝ පළාත් සභාවක හෝ යම් උපලේඛනගත ආයතනයක යම් නිලධරයකුට හෝ සේවකයකුට යම් තුටු පඬුරක් ලබා දෙන;

(ඇ) මේ වගන්තියේ (අ) ඡේදයේ සඳහන් සභිකයකුව සිටිමින් ඒ ඡේදයේ (i) වන, (ii) වන සහ (iii) වන අනුඡේදවල සඳහන් කරනු ලැබ ඇති යම් ක්‍රියාවක් කිරීම හෝ නොකර සිටීමක් සඳහා පෙලඹවීමක් හෝ ප්‍රදානයක් ලෙස යම් තුටු පඬුරක් අයදින හෝ පිළිගන්නා; හෝ

(ඈ) (ආ) ඡේදයේ (i) වන, (ii) වන අනුඡේදවල සඳහන් කළ පරිදි යම් ක්‍රියාවක් හෝ යම් නොකර සිටීමක් සඳහා පෙලඹවීමක් හෝ ප්‍රදානයක් ලෙස යම් තුටු පඬුරක් අයදින හෝ පිළිගන්නා මේ වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරනු ලැබ ඇති යම් නිලධරයකු හෝ සේවකයකු වන්නා වූ,

යම් තැනැත්තකු මේ පනත යටතේ අල්ලස් වරදක් සිදු කරන අතර වරදකරු කිරීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

*පළාත් පාලන ආයතනයක, උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලන මණ්ඩලයක සාමාජිකයකුගේ ඡන්දයට බලපෑම් කිරීමට තර්ජන සහ වංචාව යොදා ගැනීම*

**103.** (අ) යම් පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලන මණ්ඩලයක හෝ යම් රැස්වීමකට භාරදෙන ලද යම් වැඩපිළිවෙළකට, මෝසමකට, යෝජනා සම්මතයකට හෝ ප්‍රශ්නයකට පක්ෂව හෝ එරෙහිව තම ඡන්දය දීමට හෝ නොදීමට හෝ ඒ පළාත් පාලන ආයතනයේ, උපලේඛනගත ආයතනයේ, පාලන මණ්ඩලයේ හෝ එහි කමිටුවේ යම් රැස්වීමකට සහභාගී නොවන ලෙසට, ඒ පළාත් පාලන ආයතනයේ හෝ උපලේඛනගත ආයතනයේ හෝ උපලේඛනගත ආයතනයේ පාලන මණ්ඩලයේ යම් සාමාජිකයකුට යම් තර්ජනය කිරීමකින්, රැවටීමකින්, සත්‍ය යටපත් කිරීමකින් හෝ වෙනත් නීත්‍යනුකූල නොවන ආකාරයෙන් බලපෑමක් සිදු කිරීමට තැත්කරනු ලබන තැනැත්තකු; හෝ

(ආ) පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලන මණ්ඩලයක යම් සාමාජිකයකුට හෝ යම් නිලධරයකුට හෝ සේවානියුක්තයකුට යම් ඡන්දයක් ලබා ගැනීමට සහය ලබා දීමට හෝ සම්මත කිරීම වැළැක්වීමට හෝ යම් තැනැත්තකු වෙනුවෙන් යම් කොන්ත්‍රාත්තුවක් හෝ වාසියක් ප්‍රදානය කිරීමට සහය සැලසීමේ දී හෝ, වැළැක්වීමේ දී හෝ, යම් නිල කටයුත්තක් කිරීමට හෝ කිරීමෙන් වැළැකීමට හෝ නිල කටයුත්තක් කිරීමට සැලසීමේ දී, කඩිනම් කිරීමේ දී, ප්‍රමාද කිරීමේ දී, බාධා කිරීමේ දී හෝ වැළැකීමේ දී සහාය දී (අ) ඡේදයේ පරිදි යම් ආකාරයකින් බලපෑම් කිරීමට ප්‍රයත්න දරන යම් තැනැත්තකු,

මේ පනත යටතේ වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලයකට බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

වෙළෙඳාමේ දී බලපෑම

**104.** (1) තමා හෝ අන් අයකු සඳහා රජයේ යම් වරප්‍රසාද හෝ සේවා ලබා ගැනීමේ අරමුණින් රජයේ සේවකයකුට හෝ වෙනත් යම් තැනැත්තකු වෙත බලපෑම් කිරීම පිණිස යම් තුටු පඬුරක් ඍජුව හෝ වක්‍රව එකී රජයේ සේවකයාට හෝ වෙනත් තැනැත්තාට පිරිනමන තැනැත්තකු අල්ලස් වරදක් සිදු කරන අතර වරදකරු කිරීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලයකට බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබ ඇති පරිදි යම් තුටු පඬුරක් ඍජුව හෝ වක්‍රාකාරව ඉල්ලා සිටින හෝ පිළිගන්නා යම් රජයේ සේවකයකු හෝ වෙනත් අන් අයකු අල්ලස් වරදක් සිදු කරන අතර වරදකරු කිරීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලයකට බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

විදේශීය රජයේ සේවකයකුට අල්ලස් දීම

**105.** (1) විදේශීය රජයේ සේවකයකුට-

(අ) ජාත්‍යන්තර ව්‍යාපාර මෙහෙය වීමේ දී කොන්ත්‍රාත්තුවක්, ව්‍යාපාරයක් හෝ වාසියක් ලබාගැනීම හෝ රඳවා ගැනීම පිණිස; සහ

(ආ) යම් විදේශීය රජයේ සේවකයා නිල කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී විදේශීය රජයේ සේවකයා විසින් නිල කාර්යයක් උල්ලංඝනය වන ආකාරයෙන් ක්‍රියාවක් සිදු කිරීම හෝ ක්‍රියා කිරීමෙන් වැළකී සිටීම පිණිස හෝ අදාළ විදේශීය රාජ්‍යයක හෝ ජාත්‍යන්තර සංවිධානයේ යම් කටයුත්තකට හෝ තීරණයකට බලපෑම් කිරීමට එකී විදේශීය රජයේ සේවකයා හෝ වෙනත් තැනැත්තාගේ තත්ත්වය භාවිත කිරීම පිණිස,

තුටු පඬුරක් පිරිනමන තැනැත්තකු, මේ පනත යටතේ අල්ලස් වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලසීමාවකට බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා, ජාත්‍යන්තර ව්‍යාපාර යන්නට, ජාත්‍යන්තර ආධාර සැපයීම ඇතුළත් වේ.

(3) (අ) කටයුතු කළ යුතු හෝ කටයුතු කිරීමෙන් වැළැකිය යුතු නැතහොත් වෙනත් තැනැත්තකු වෙනුවෙන් කටයුතු කළ යුතු හෝ කටයුතු කිරීමෙන් වැළැකිය යුතු විදේශීය රජයේ සේවකයකුගේ ප්‍රතිලාභය සඳහා පිරිනමන ලද තුටු පඬුරක් ද යන්න නොතකා;

(ආ) පිරිනමන ලද තුටු පඬුරක් විදේශීය රජයේ සේවකයා ක්‍රියාවන් හෝ නොකර හැරීම්වලට සත්‍ය වශයෙන් ම බලපා තිබේ ද යන්න නොතකා; හෝ

(ඇ) විදේශීය රජයේ සේවකයාට පිරිනමන ලද තුටු පඬුර එවැනි විදේශීය රජයේ සේවකයකුගේ තත්ත්වයෙන් පොළඹවනු ලැබීම සඳහා ඔහුට අදාළ ලිඛිත නීතිය මගින් අවසර දී ඇති ද හෝ නියමිත ද හෝ යන්න නොතකා,

මේ වගන්තිය යටතේ තුටු පඬුරක් පිරිනමනු ලබන යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබයි.

(4) (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ කාර්යයන් සඳහා විදේශීය රජයේ සේවකයකුට අදාළ වන ලිඛිත නීතිය යන්නෙන්-

(අ) බලපෑම සිදු කිරීමට අදහස් කරන තැනැත්තා බලපෑමට යටත් කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ විදේශීය රජයේ

සේවකයකුගේ යම් කර්තව්‍ය ඉටුකිරීමක් ද එම කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නීතිය අදහස් වේ; සහ

(ආ) (අ) ඡේදය අදාළ නොවන සහ විදේශීය රජයේ සේවකයා යම් ජාත්‍යන්තර සංවිධානයක නිලධරයකු හෝ නියෝජිතයකු වන අවස්ථාවක දී ඒ සංවිධානයේ ලිඛිත රීති අදහස් වේ;

එසේ වුව ද, (අ) සහ (ආ) ඡේද අදාළ නොවන අවස්ථාවක දී විදේශීය රජයේ සේවකයකු විදේශීය රජයේ සේවකයකු වන්නේ යම් රාජ්‍යයක් හෝ භූමි ප්‍රදේශයක් සම්බන්ධයෙන් ද එම රාජ්‍යයේ හෝ භූමි ප්‍රදේශයේ නීතිය,

(i) යම් ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හෝ අදාළ රාජ්‍යයට හෝ භූමි ප්‍රදේශයට අදාළ වන්නා වූ නීතියක් යටතේ හෝ ඒ මගින් සාදන ලද යම් විධිවිධානයක; හෝ

(ii) එසේ අදාළ කර ගත හැකි වන්නා වූ සහ ප්‍රකාශිත ලිඛිත මූලාශ්‍රයක සාක්ෂියක් වන යම් අධිකරණ තීරණයක,

ඇතුළත් වන තාක් දුරට එම නීතිය අදහස් වේ.

පුද්ගලික අංශයේ අල්ලස්

**106.** (1) යම් තැනැත්තකු විසින් යම් ආර්ථික, මූල්‍ය හෝ වාණිජ කටයුතුවල දී පුද්ගලික අංශයේ ආස්ථිත්වයක අධ්‍යක්ෂවරයකු හෝ යම් තත්ත්වයකින් සේවය කරන යම් සේවකයකුට, ඉහත තැනැත්තා වෙනත් තැනැත්තකු වෙනුවෙන් හෝ ඔහුගේ කාර්යයන් ඉටුකිරීම උල්ලංඝනය වන පරිදි යම් ක්‍රියාවක් කිරීම පිණිස හෝ සිදු කිරීමෙන් වැළැක්වීම සඳහා ඍජුව හෝ වක්‍රව තුටු පඬුරක් පිරිනමන විට දී, ඒ තැනැත්තා මේ පනත යටතේ අල්ලස් වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලසීමාවකට බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීම හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) පුද්ගලික අංශයේ ආස්ථිත්වයක යම් තත්ත්වයකින් සේවය කරන යම් තැනැත්තකු විසින් හෝ යම් අධ්‍යක්ෂවරයකු විසින් ආර්ථික, මූල්‍ය හෝ වාණිජ කටයුතුවල දී, ඔහු හෝ වෙනත් තැනැත්තකු වෙනුවෙන් යම් ක්‍රියාවක් කිරීම පිණිස හෝ කාර්යයන් ඉටුකිරීම උල්ලංඝනය වන පරිදි යම් ක්‍රියාවක් සිදු කිරීමෙන් වැළැකී සිටීම පිණිස සෘජුව හෝ වක්‍රව වාසියක් ඉල්ලා සිටින විට හෝ පිළිගනු ලබන විට, ඒ සේවකයා හෝ අධ්‍යක්ෂවරයා මේ පනත යටතේ අල්ලස් වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලසීමාවකට බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

බැඳියාවන් පිළිබඳ සට්ටනයන් ප්‍රකාශ කිරීමට අසමත් වීම

**107.** (1) යම් රජයේ සේවකයකු, සාමාජිකයකු, අධ්‍යක්ෂවරයකු හෝ සේවානියුක්තයකු වනු ලබන පොදු අධිකාරියක් එම රජයේ සේවකයාට හෝ ඒ රජයේ සේවකයා දැනුවත්ව ඒ රජයේ සේවකයාගේ ඥාතියකුට හෝ මිත්‍රයකුට හෝ සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් ඇති යම් තැනැත්තකු, සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් ව්‍යවසායක් සමඟ කටයුතු කිරීමට අරමුණු කරන අවස්ථාවක දී, ඒ රජයේ සේවකයා විසින් නොපමාව නියෝග මගින් නියම කරනු ලබන ආකාරයෙන් ඒ සම්බන්ධතාවයේ ස්වභාවය ඒ අධිකාරියට හෙළිදරව් කළ යුතු ය.

(2) යම් තැනැත්තකු, සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් ව්‍යවසායකට අදාළව පොදු අධිකාරයක් විසින් ගන්නා තීරණයක් සම්බන්ධයෙන් යම් රජයේ සේවකයෙකුට හෝ එකී රජයේ සේවකයාගේ ඥාතියකුට හෝ මිත්‍රයකුට පුද්ගලික සම්බන්ධතාවයක් පවතින අවස්ථාවක දී, ඒ රජයේ සේවකයා විසින් ඒ තීරණයට අදාළ ඒ පොදු අධිකාරියේ යම් කටයුත්තක දී ඡන්දය දීම හෝ ඒ කටයුත්ත සඳහා සහභාගි වීම නොකළ යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන යම් රජයේ සේවකයකු වරදක් සිදු කරන අතර මහාධිකරණය විසින් වරදකරු කිරීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, රජයේ සේවකයන්ගේ බැඳියාවන් පිළිබඳ සට්ටනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ඒවා කළමනාකරණය කිරීම රීති මගින් නිශ්චිතව දැක්විය යුතු ය.

**108.** (1) (අ) (i) ක්‍රීඩාවක් ඇරඹීමට හෝ ක්‍රීඩා ඉසව්වක ප්‍රතිඵලවලට බලපෑම් කරනු ලබන ඕනෑම ආකාරයක් ඇතුළුව යම් ක්‍රීඩා ඉසව්වක සුපිළිපන්නභාවයට හානි කරන හෝ තර්ජනයක් වන යම් ක්‍රියාවක් සංස්ථාපනය වන යම් ක්‍රියාවකට සහභාගී වීම වෙනුවෙන්; හෝ

ක්‍රීඩා ඉසව්වලට අදාළ වැරදි

(ii) මේ වගන්තියේ අරමුණු කරන ලද ක්‍රියාවක් කළමනාකාර අධ්‍යක්ෂවරයාට, ප්‍රධාන විධායක නිලධරයාට හෝ අදාළ ක්‍රීඩා සංගමයක හෝ නියාමන අධිකාරියක සමාන තනතුරක් දරන වෙනත් යම් තැනැත්තකුට හෝ ආසන්නතම පොලිස් ස්ථානයට වාර්තා නොකිරීම වෙනුවෙන්; හෝ

(ආ) (ආ ඡේදයේ (i) වන අනුඡේදයේ අරමුණු කරන ලද පරිදි කටයුතු කිරීම සඳහා ප්‍රදානයක් ලෙස,

තම ප්‍රතිලාභය පිණිස හෝ ඒ අනෙක් තැනැත්තාගේ හෝ වෙනත් තැනැත්තකුගේ ප්‍රතිලාභය පිණිස වෙනත් යම් තැනැත්තකුගෙන් ඍජුව හෝ වක්‍රව යම් තුටු පඬුරක් පිළිගන්නා හෝ පිළිගැනීමට එකඟ වන හෝ අර්පණය කරන, තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) (අ) (i) ක්‍රීඩාවක් ඇරඹීමට හෝ ක්‍රීඩා ඉසව්වක ප්‍රතිඵලවලට බලපෑම් කරනු ලබන ඕනෑම ආකාරයක් ඇතුළුව යම් ක්‍රීඩා ඉසව්වක සුපිළිපන්නභාවයට හානි කරන හෝ තර්ජනයක් වන යම් ක්‍රියාවක් සංස්ථාපනය වන යම් ක්‍රියාවකට සහභාගී වීම වෙනුවෙන්; හෝ

(ii) මේ වගන්තියේ අරමුණු කරන ලද ක්‍රියාවක් කළමනාකාර අධ්‍යක්ෂවරයාට, ප්‍රධාන විධායක නිලධරයාට හෝ අදාළ ක්‍රීඩා සංගමයක හෝ

නියාමන අධිකාරියක සමාන තනතුරක් දරන වෙනත් යම් තැනැත්තකුට හෝ ඒ තැනැත්තාගේ ආසන්නතම පොලිස් ස්ථානයට වාර්තා නොකිරීම වෙනුවෙන්; හෝ

(ආ) (අ) ඡේදයේ අරමුණු කරන ලද පරිදි කටයුතු කිරීම සඳහා ප්‍රදානයක් ලෙස,

ඒ අනෙක් තැනැත්තාගේ හෝ වෙනත් තැනැත්තකුගේ ප්‍රතිලාභය පිණිස වෙනත් යම් තැනැත්තකුට ඍජුව හෝ වක්‍රව යම් තුටු පඬුරක් ලබාදෙන හෝ ලබාදීමට එකඟ වන හෝ අර්පණය කරන, තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) ක්‍රීඩාවක ඇරඹුමට හෝ ක්‍රීඩා ඉසව්වක ප්‍රතිඵලවලට බලපෑම් කරන යම් ඕනෑම ආකාරයක් ඇතුළුව යම් ක්‍රීඩා ඉසව්වක සුළිපන්නභාවයට හානි කරනු ලබන හෝ ඊට තර්ජනයක් සංස්ථාපනය වන යෝජනා ක්‍රමයක් ඍජුව හෝ වක්‍රව පවත්වාගෙන යන, යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර මහාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

අල්ලස්වලින් ධනය රැස්කිරීම

**109.** (1) යම් තැනැත්තකු යම් දේපළක් අත්කරගෙන තිබෙන අවස්ථාවක දී හෝ අත්කර ගෙන තිබූ අවස්ථාවක දී, එකී දේපළ-

(අ) (i) ඒ තැනැත්තාගේ දැනුවත් ආදායමේ හෝ ලැබීම්වල කොටසක්; හෝ

(ii) ඔහුගේ දැනුවත් ලැබීම්වල යම් කොටසක් මාරු කර ඇති හෝ මාරු කරනු ලැබ ඇති මුදලක්,

විය නොහැකි හෝ නොවූ මුදලක් වීමේ දී; හෝ

(ආ) (i) ඒ තැනැත්තාගේ දැනුවත් ආදායමේ යම් කොටසක් භාවිත කිරීමෙන් අත්කරගත් දේපළක්;

(ii) ඒ තැනැත්තාගේ දැනුවත් ලැබීම්වල කොටසක් වන හෝ කොටසක් වූ දේපළක්; හෝ

(iii) ඒ තැනැත්තාගේ දැනුවත් ආදායමේ යම් කොටසක් මාරු කර ඇති හෝ මාරු කරනු ලැබ ඇති දේපළක්,

විය නොහැකි හෝ නොවූ මුදල් නොවන දේපළක් වීමේ දී,

එවිට, මේ වගන්තිය යටතේ යම් නඩු පැවරීමේ කාර්ය සඳහා ඒ තැනැත්තා විසින් පටහැනි තත්ත්වයක් ඔප්පු කරන තෙක් ඒ දේපළ මේ පනතේ මේ පරිච්ඡේදය යටතේ යම් වැරදි සිදු කිරීමෙන් ඒ තැනැත්තා සතු කරගෙන තිබෙන හෝ තිබුණ දේපළක් වන බවට හෝ වූ බවට හෝ ඒ තැනැත්තා විසින් යම් අල්ලස් ක්‍රියාවක් සිදු කරමින් අත්කරගත් යම් දේපළක් මාරු කිරීමෙන් ලැබූ දේපළක් වන බවට හෝ වූ බවට සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ "ආදායම" යන්නට, අල්ලසකින් ගත් ආදායමක් ඇතුළත් නොවන අතර, "ලැබීම්" යන්නට අල්ලසකින් ගත් ලැබීම් ඇතුළත් නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ, යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් සිදු කරමින් අත්කරගෙන තිබෙන හෝ තිබුණ දේපළක් විය යුතු හෝ මේ පනත යටතේ යම් වරදක් සිදු කරමින් ඒ තැනැත්තා විසින් අත්කරගත් යම් දේපළක් ඒ තැනැත්තා මාරු කර තිබෙන හෝ තිබූ බවට සලකනු ලබන යම් දේපළක අයිතිකරුවකු වන හෝ අයිතිකරුවකුව සිටිනු ලැබ ඇති තැනැත්තකු වරදක් සිදු කරන අතර මහාධිකරණය මගින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ වසර හතක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු යඃ

එසේ වුව ද, ඒ දේපළ ඒ තැනැත්තාගේ යම් බැංකු ගිණුමක ඒ තැනැත්තාගේ බැරට තැන්පත් කළ මුදලක් වන හෝ වූ අවස්ථාවක දී, ඒ තැනැත්තාගේ එකඟත්වය හෝ දැනුමකින් තොරව වෙනත් යම්

තැනැත්තකු විසින් ඒ තැන්පතුව සිදු කර ඇති බවට හෝ සිදු කරනු ලැබ ඇති බවට ඒ තැනැත්තා අධිකරණය සෑහීමට පත් කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් මේ උපවගන්තියේ පූර්වයෙන් වූ විධිවිධාන යටතේ වරදක් සිදු කරන ලෙස හෝ වරදක් සිදු කර ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, යම් තැනැත්තකුට යම් වරදක් සඳහා ඔහුට එරෙහිව නඩු පවරනු නොලැබිය යුත්තේ ඇයි ද යන්න පිළිබඳව කරුණු දැක්වීමට ඒ තැනැත්තාට අවස්ථාවක් දී ඇත්නම් මිස මේ වගන්තිය යටතේ වන යම් වරදක් සඳහා කිසිදු නඩු පැවරීමක් ඒ තැනැත්තාට එරෙහිව සිදු නොකළ යුතු අතර, ඒ ලෙසට ඒ තැනැත්තා කරුණු දැක්වීමට අපොහොසත් වී ඇති අවස්ථාවක දී හෝ කොමිෂන් සභාවේ මතය අනුව ඒ තැනැත්තා විසින් පෙන්වා දෙන ලද කරුණු පිළිබඳ සෑහීමට පත්විය නොහැකි අවස්ථාවක දී ඒ තැනැත්තාට එරෙහිව මේ වගන්තිය යටතේ නඩු කටයුත්තක් පවරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා, මේ පනත ආරම්භ වන දින හෝ ඉන්පසුව යම් චංචල හෝ නිශ්චල දේපළක් යම් තැනැත්තකුගේ කලත්‍රයකු හෝ ඒ තැනැත්තාගේ වයස අවුරුදු දහඅටට අඩු අවිවාහක ළමයකු අත්කරගෙන ඇති හෝ අත්කරගෙන තිබුණ අවස්ථාවක දී ඊට පටහැනි තත්ත්වයක් ඔප්පු කරනු ලබන තෙක් ඉහත කී ඒ තැනැත්තා විසින් එකී දේපළ අත්කරගනු ලැබූ බවට සහ ඒ කලත්‍රයා හෝ අවිවාහක ළමයා විසින් එය අත්කරගෙන නොමැති හෝ අත්කරගෙන නොතිබූ බවට පූර්ව නිගමනය කළ යුතු ය.

(6) (අ) මේ වගන්තිය යටතේ වරදක් සඳහා වන යම් නඩු කටයුත්තක දී යම් නිශ්චල දේපළක වටිනාකම හෝ ඒ දේපළ මත යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ පිරිවැය සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරුගේ සහතිකය ඊට පටහැනි තත්ත්වයක් ඔප්පු කර ඇත්නම් මිස ඒ වටිනාකම සහ ඒ ඉදිකිරීම පිළිබඳ පිරිවැය පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(ආ) මේ උපවගන්තියේ "ප්‍රධාන තක්සේරුකරු" යන්නෙන්, රජයේ ප්‍රධාන තක්සේරුකරු අදහස් වන අතර රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ යම් ජ්‍යෙෂ්ඨ සහකාර තක්සේරුකරුවකු හෝ සහකාර තක්සේරුකරුවකු ඊට ඇතුළත් වේ.

(7) මේ වගන්තියේ කාර්ය සඳහා "තැනැත්තකු" යන්නෙන්, මේ පරිච්ඡේදයේ සඳහන් කළ යම් ක්‍රියාවකට ඒ තැනැත්තා සම්බන්ධ වී ඇති බවට පෙන්වනු ලැබිය හැකි වුව ද නොවූව ද නැතහොත් මේ පනතේ අර්ථානුකූලව ඔහු රජයේ සේවකයකු වුව ද නොවූව ද කවර හෝ යම් ඕනෑම තැනැත්තකු අදහස් විය යුතු ය.

(8) මේ කොටසේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිකරණය විසින් මේ කොටස යටතේ වරදකට යම් තැනැත්තකු වරදකරු කරන අවස්ථාවක දී, අධිකරණය විසින් දඬුවමක් හෝ දඩයක් පැනවීම වෙනුවට අල්ලසක් මගින් හෝ අල්ලසක් මගින් ලබා ගෙන ඇති මුදල් මගින් ඇති කර ගෙන ලැබ ඇති බවට සොයාගත් යම් චංචල හෝ නිශ්චල දේපළක් සියලු බැඳීම්වලින් නිදහස්ව රජය සතු කරනු ලැබීමට නියෝග කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, රජය සතු කිරීමේ නියෝගයක් කළ යුතු ද යන්න තීරණය කිරීමේ දී අධිකරණයට, එවැනි නියෝගයක් කිරීමෙන් වටිනාකම ගෙවීම මත මිල දී ගන්නා සද්භාවයෙන් යුත් ගැනුම්කරුවකුගේ හෝ ඒ දේපළේ සද්භාවී සම්බන්ධතාවයක් වටිනාකමට අත්කර ගනු ලබන වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට ඉන් අගතියක් විය හැක්කේ ද යන්න සැලකිල්ලට ගැනීමට අයිතියක් තිබිය යුතු ය.

(9) (8) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියෝගයක්-

(අ) ඒ රජය සතු කිරීමේ නියෝගයට එරෙහිව අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ රජය සතු කිරීමේ නියෝගය ස්ථිර කරමින් හෝ පිළිගනිමින් ඒ අභියාචනය පිළිබඳ තීරණය කරනු ලැබූ විට; හෝ

(ආ) රජය සතු කිරීමේ නියෝගයට එරෙහිව අභියාචනාධිකරණය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට කිසිදු අභියාචනයක් යොමු කරනු ලැබ නොමැති අවස්ථාවක, ඒ නියෝගයට එරෙහිව අභියාචණාධිකරණයට හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වන්නේ යම් කාලයක් තුළ ද ඒ කාලසීමාව ඉකුත් වීමෙන් පසුව,

බලාත්මක වීම ආරම්භ විය යුතු ය.

තුටු පඬුරු

**110.** (1) යම් තැනැත්තකු හෝ ඔහුගේ දැනුම ඇතිව හෝ එකඟත්වය ඇතිව කටයුතු කරන වෙනත් යම් තැනැත්තකු විසින් වෙනත් යම් තැනැත්තකු වෙත පවරාදීමක් හෝ ප්‍රතිලාභය සඳහා කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් යම් තුටු පඬුරක් දෙන, සපයන හෝ වැළකී සිටින හෝ තුටු පඬුරක් දීමට, සැපයීමට හෝ වැළකී සිටීමට එකඟ වන, භාරගනු ලබන හෝ පොරොන්දුව වන යම් තැනැත්තකු තුටු පඬුරක් පිරිනමනු ලබයි.

(2) යම් තැනැත්තකු හෝ ඔහුගේ දැනුම ඇතිව හෝ එකඟත්වය ඇතිව කටයුතු කරන වෙනත් යම් තැනැත්තකු විසින්, පළමුව සඳහන් කරන ලද තැනැත්තා සඳහා නැතහොත් වෙනත් යම් තැනැත්තකු සඳහා කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් යම් තුටු පඬුරක් ඉල්ලා, සුහදව ඉල්ලා, විමසා හෝ ලබා ගැනීමට කැමැත්ත පෙන්නුම් කර ඇත්නම් එකී යම් තැනැත්තා තුටු පඬුරක් ඉල්ලා සිටිනු ලබයි.

(3) යම් තැනැත්තකු හෝ ඔහුගේ දැනුම ඇතිව හෝ එකඟත්වය ඇතිව කටයුතු කරන අන් තැනැත්තකු විසින් පළමුව සඳහන් කරන ලද තැනැත්තා සඳහා නැතහොත් වෙනත් යම් තැනැත්තකු සඳහා කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් යම් තුටු පඬුරක් ගන්නේ නම්, භාර ගන්නේ නම් හෝ ලබා ගන්නේ නම් හෝ ගැනීමට, භාර ගැනීමට හෝ ලබා ගැනීමට එකඟ වන්නේ නම්, එකී තැනැත්තා තුටු පඬුරක් භාරගනු ලබයි.

(4) මේ පනත යටතේ වරදක් වන තුටු පඬුරක් පිරිනැමීම, ඉල්ලා සිටීම හෝ පිළිගැනීම කරනු ලබන යම් තැනැත්තකු එකී පිරිනැමීම, ඉල්ලා සිටීම හෝ පිළිගැනීම සිදු වූයේ ශ්‍රී ලංකාවෙන් බැහැර ස්ථානයක දී නම්, ඒ වරද ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු අතර, වෙනත් යම් ලිඛිත නීතියක ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ වරද විභාග කිරීමට කොළඹ දී පැවැත්වෙන මහාධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

දූෂණ

**111.** රජයට වැරදි සහගත හෝ නීති විරෝධී අලාභයක් කිරීමේ හෝ තමන් වෙත හෝ වෙනත් යම් තැනැත්තකු වෙත යම් වැරදි සහගත හෝ නීති විරෝධී ප්‍රතිලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් ප්‍රදානය කරනු ලැබීමේ යම් වැරදි සහගත හෝ නීති විරෝධී අලාභයක් සිදු කිරීමේ අදහසින් හෝ එසේ වන බවට දැනුමැති ව, යම් වැරදි සහගත හෝ නීති විරෝධී ප්‍රතිලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් යම් තැනැත්තකු හට ප්‍රදානය වනු ලැබීමේ අදහසින් හෝ එසේ වන බව දනිමින්,-

(අ) රජයේ සේවකයකු ලෙස ස්වකීය තනතුර ප්‍රකාරව හෝ ඒ සේවකයාට පවරන ලද යම් බලතල ඇතිව හෝ නොමැතිව ඒ නිලය භාවිත කරමින් යම් ක්‍රියාවක් සිදු කරන හෝ සිදු කිරීම වළක්වන;

(ආ) රජයේ සේවකයකු ලෙස ස්වකීය තනතුර ප්‍රකාරව යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වළකින ලෙසට වෙනත් රජයේ සේවකයකු පොළඹවන;

(ඇ) රජයේ සේවකයකු ලෙස ස්වකීය ධුරය ප්‍රකාරව ඔහුට දැනගැනීමට ලැබෙන යම් තොරතුරු භාවිත කරන;

(ඈ) රජයේ සේවකයකු ලෙස ස්වකීය තනතුර ප්‍රකාරව යම් තීරණ ගැනීමේදී සහභාගී වන; හෝ

(ඉ) යම් ක්‍රියාවක් සිදු කිරීමට හෝ සිදු කිරීමෙන් වැළකීමට යම් රජයේ සේවකයකු ලෙස තම ධුරය කෙලින්ම හෝ අන්‍යාකාරයකින් භාවිත කරමින් වෙනත් යම් තැනැත්තකු පොළඹවන,

යම් රජයේ සේවකයකු දූෂණ වරද සිදු කරන අතර මහාධිකරණයක් විසින් නඩු විභාගයක් පවත්වා වරදකරු කිරීමෙන් පසු හෝ ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමේ දී වසර දහයක් නොඉක්මවන කාලයකට බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

*මේ පනත යටතේ වරදකරුවකුට මුදල් විශුද්ධිකරණ වරද යටතේ චෝදනා කළ හැකි බව*

**112.** (1) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ සඳහන් කරන ලද නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ සිදු කරන ලද අවස්ථාවක දී, ඒ වරද සිදු කරන තැනැත්තාට එරෙහිව මේ පනත යටතේ සිදු කරන ලද වරදට අමතරව, මුදල් විශුද්ධිකරණ වරද සඳහා ද චෝදනා ගොනු කරනු ලැබිය යුතු ය.

(2) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මෙම මුදල් විශුද්ධිකරණ වරද මත වන නඩු කටයුතු සඳහා අදාළ කරගත යුතු අතර, සහකාර පොලිස් අධිකාරිවරයකුට හෝ වෙනත් යම් පොලිස් නිලධරයකුට එකී පනතේ සිදු කරන ලද යම් සඳහනක්, මේ පනත යටතේ වන කොමිෂන් සභාව මගින් බලය පවරන ලද යම් නිලධරයකුට කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

*බලතල නොමැතිව තුටු පඬුරක් පිළිගැනීම*

**113.** (1) මේ පනත යටතේ යම් වරදකට යම් තැනැත්තකුට එරෙහිව යම් නඩු කටයුත්තක් පවතින අවස්ථාවක දී, ඒ වගන්තියේ සඳහන් කරන ලද යම් ක්‍රියාවක් ඒ තැනැත්තා විසින් සිදු කිරීම හෝ සිදු කිරීම වැළැක්වීම සැලකිල්ලට ගෙන පිරිනැමූ තුටු පඬුරක් බවට විශ්වාස කිරීමට හෝ සැක කිරීමට හේතු ඇතිව ඒ තැනැත්තා යම් තුටු පඬුරක් ඉල්ලා සිටින ලද බවට හෝ පිළිගත් බවට ඔප්පු වන අවස්ථාවක, ඒ තැනැත්තාට එසේ කිරීමට හෝ වැළැක්වීමට සත්‍ය වශයෙන් ම බලතල, අයිතිවාසිකම් හෝ අවස්ථාවක් නොතිබුණ ද, නැතහොත් එසේ කිරීමේ හෝ වැළැක්වීමේ අරමුණින් තොරව ඒ තැනැත්තා තුටු පඬුර පිළිගත්ත ද නැතහොත් එසේ කිරීම හෝ වැළැක්වීම සත්‍ය වශයෙන් ම ඒ තැනැත්තා සිදු නොකළ ද ඒ තැනැත්තා විසින් ඒ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබයි.

(2) මේ පනතේ 111 වන වගන්තිය යටතේ යම් වරදක් සඳහා යම් තැනැත්තකුට එරෙහිව යම් නඩු කටයුත්තක් පවතින අවස්ථාවක දී, ඒ තැනැත්තා රජයට අයුතු සහගත හෝ නීති විරෝධී අලාභයක් සිදු කිරීමට හෝ තමා වෙත හෝ වෙනත් යම් තැනැත්තකු වෙත අයුතු සහගත හෝ නීති විරෝධී ප්‍රතිලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් ලබා ගැනීමට අරමුණු කළ බවට හෝ යම් අයුතු සහගත හෝ නීති විරෝධී අලාභයක් යම් තැනැත්තකුට හෝ රජයට සිදුවන

බවට ඔහු වෙත දැනුමක් තිබූ බවට හෝ ඒ වගන්තියේ සඳහන් කරන ලද යම් ක්‍රියාවක් ඒ තැනැත්තා විසින් සිදු කිරීමකින් හෝ සිදු කිරීම වැළැක්වීමකින් යම් අයුතු සහගත හෝ නීති විරෝධී ප්‍රතිලාභයක්, අනුග්‍රහ හෝ වාසි යම් තැනැත්තකු වෙත ප්‍රදානය කළ හැකි බවට, දැන සිටි බවට ඔප්පු වන්නේ නම්, ඒ තැනැත්තාට එසේ කිරීමට හෝ වැළැක්වීමට සත්‍ය වශයෙන් ම බලතල, අයිතිවාසිකම් හෝ අවස්ථාවක් නොතිබුණද නැතහොත් එසේ සිදු කිරීම හෝ වැළැක්වීම ඒ තැනැත්තා විසින් සත්‍ය වශයෙන් සිදු නොකළ ද, ඒ තැනැත්තා විසින් ඒ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබයි.

අමතර දඬුවම්

**114.** (1) මේ පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය වන යම් තුටු පඬුරක් පිරිනැමීමෙන් හෝ පිළිගැනීමෙන් සිදු කරන වරදක් සඳහා අධිකරණය යම් තැනැත්තකු වරදකරු කරන අවස්ථාවක දී, ඒ තුටු පඬුර මුදලකින් වේ නම් හෝ ඒ තුටු පඬුරේ වටිනාකම තක්සේරු කළ හැකි නම් අධිකරණය විසින්, ඒ තැනැත්තා වෙත පනවන වෙනත් යම් දඬුවමකට අමතරව ඒ තුටු පඬුරේ ප්‍රමාණයට සමාන මුදලක් හෝ අධිකරණයේ මතය පරිදි ඒ තුටු පඬුරේ වටිනාකම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි යම් කාලසීමාවක් තුළ දණ්ඩනයක් ලෙස ගෙවීමට අධිකරණය විසින් ඔහුට නියෝග කළ යුතු ය.

(2) 109 වන වගන්තිය යටතේ වරදක් සිදු කිරීම සඳහා මහාධිකරණය විසින් යම් තැනැත්තකු වරදකරු කරන අවස්ථාවක දී, මේ පනත යටතේ පැනවීමට නියම කරනු ලබන වෙනත් යම් දණ්ඩනයකට අමතරව අධිකරණය විසින් අදහස් කරනු ලබන සොයා ගෙන ඇති අල්ලසකින් හෝ අල්ලසකින් ලබා ගත් මුදලින් ලබා ගත් බවට හෝ අල්ලසකින් දේපළ බවට පත් කරනු ලැබූ බවට අධිකරණය විසින් අදහස් කරනු ලබන යම් මුදලකට නොඅඩු මුදලක් දඩයක් වශයෙන් පනවනු ලැබිය යුතු අතර, නියම කරනු ලබන මුදල එම මුදලට වඩා තුන් ගුණයකට වඩා වැඩි නොවිය යුතු ය.

(3) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම සඳහා යම් තැනැත්තකුට අධිකරණයක් විසින් පනවනු ලබන යම් දඩයක හෝ දණ්ඩනයක දී, ඒ දඩය හෝ දණ්ඩනය රුපියල් මිලියන එකකට

වැඩි වන අවස්ථාවක දී සහ ඒ දඩය හෝ දණ්ඩනය ගෙවීමට නියම කරනු ලැබ ඇති තැනැත්තා ඒ දඩය හෝ දණ්ඩනය ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක එම දඩය හෝ දණ්ඩනය පනවනු ලබන අධිකරණ නියෝගය රජය වෙනුවෙන් සහ ඒ තැනැත්තාට එරෙහිව දිස්ත්‍රික් අධිකරණයකින් එළඹුණ තීන්දු ප්‍රකාශයක් මගින් පැන වූ දඩයක් හෝ දණ්ඩනයක් ලෙසින් අය කරගනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ කලින් වූ විධිවිධානවල සඳහන් කළ දඩ මුදලක් හෝ දණ්ඩන මුදලක් ගෙවීමට යටත් තැනැත්තා දඩ මුදල හෝ දණ්ඩන මුදල පනවනු ලැබූ වරද සිදු කරන දිනයේ දී රජයේ සේවකයකුව සිටි අවස්ථාවක දී, එවිට, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ තැනැත්තාගේ චංචල සහ නිශ්චල දේපළට අමතරව, එකී දිනයෙන් පසුව ඒ තැනැත්තා විසින් නඩත්තු කරනු ලැබූ කලත්‍රයා හෝ පුත්‍රයකු හෝ දියණියක විසින් අත්කර ගත් යම් චංචල හෝ නිශ්චල දේපළක් අමතරව, දේපළ-

(අ) ඒ කලත්‍රයා, පුතා හෝ දුව විසින් මිල දී ගනු ලැබුවේ නම්;

(ආ) ඒ දඩය සහ දණ්ඩන මුදල ගෙවීමට යටත් වන තැනැත්තා විසින් ඒ කලත්‍රයාගේ, පුතාගේ හෝ දුවගේ නමට මිල දී ගනු ලැබුවේ නම්;

(ඇ) ඒ දඩය හෝ දණ්ඩන මුදල ගෙවීමට යම් තැනැත්තකු යටත් වූයේ යම් තුටු පඬුරක් පිළිගැනීම සඳහා ද එම තුටු පඬුර පිරිනැමූ තැනැත්තාගෙන් ඒ කලත්‍රයා, පුත්‍රයා හෝ දියණිය විසින් මිල දී ගැනීමෙන්, ත්‍යාගයක් මගින් හෝ අන්‍යාකාරයකින් අත්කර ගනු ලැබුවේ නම්; හෝ

(ඈ) ඒ දඩය හෝ දණ්ඩන මුදල ගෙවීමට යටත් වන තැනැත්තාගෙන් තෙස්තමේන්තුවකින් හෝ තෙස්තමේන්තු රහිත අනුප්‍රාප්තියකින් අත්කර ගනු ලැබූ දේපළක් වූයේ නම්,

ඒ දේපළ, ඒ දඩය හෝ දණ්ඩන මුදල අයකර ගැනීම සඳහා තහනමට ගෙන විකිණීමකට යටත් විය යුතු ය.

(5) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිකරණය යම් තැනැත්තකු වරදකරු කරන අවස්ථාවක දී, අධිකරණය විසින්, මේ පනත යටතේ වූ කවර හෝ වරදක් සම්බන්ධයෙන් ඒ වරද සිදු කිරීමෙන් හෝ වරද සිදු කිරීමෙන් සොයා ගත් මුදල්වලින් අත්කර ගනු ලැබූ බවට අදහස් කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් සියලු බැඳීම්වලින් තොරව රජය සතු වන බවට නියෝගයක් සිදු කළ හැකි යඃ

එසේ වුව ද, රජය සතු කිරීමේ නියෝගයක් සිදුකළ යුතු ද නැද්ද යන්න තීරණය කිරීමේ දී, එවැනි යම් නියෝගයකින් වටිනාකම මත මිල දී ගත් සද්භාවී ගැනුම්කරුවකුගේ හෝ එම දේපළ පිළිබඳ සද්භාවී සම්බන්ධකමක් වටිනාකමක් මත අත්කර ගත් වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට අගතියක් විය හැකි ද යන්න සලකා බැලීමට අධිකරණයට හිමිකමක් තිබිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද නියෝගයක්-

(අ) රජය සතු කිරීමේ නියෝගයට එරෙහිව අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, රජය සතු කිරීමේ නියෝගය ස්ථිර කරමින් හෝ පිළිගනිමින් ඒ අභියාචනය පිළිබඳ තීරණය කිරීමෙන් පසුව; හෝ

(ආ) රජය සතු කිරීමේ නියෝගයට එරෙහිව අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාලසීමාව ඉකුත්වීමෙන් පසුව රජය සතු කිරීමේ නියෝගයට එරෙහිව අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට කිසිදු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක එකී කාලසීමාව ඉකුත් වීමෙන් පසු,

බලාත්මක විය යුතු ය.

(7) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන වගන්තියේ (7) වන සහ (8) වන උපවගන්තිවල පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ කොටසේ මේ පරිච්ඡේදය යටතේ යම්

තැනැත්තකු වරදක් සඳහා වරදකරු කරනු ලබන අවස්ථාවක දී, එවිට, එම වරදකරු කිරීමේ හෝ තීරණය කිරීමේ හේතුව මත-

(අ) (i) එසේ වරදකරු කරනු ලැබූ හෝ තීරණය කරනු ලැබූ දිනයේ සිට වසර හතක කාලසීමාවක් සඳහා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ සහ 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම් පනත යටතේ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට හෝ ඡන්දහිමියකු වශයෙන් ලියාපදිංචි වීමට හෝ එසේ වරදකරු කරනු ලැබූ හෝ තීරණය කරනු ලැබූ දිනයේ සිට වසර පහක කාලසීමාවක් සඳහා 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත යටතේ හෝ (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට හෝ ඡන්දහිමියකු වශයෙන් ලියාපදිංචි වීමට හෝ එකී තැනැත්තා අසමත් බවට පත් විය යුතු ය; හෝ

(ii) ඒ තැනැත්තාට එසේ වරදකරු කරනු ලැබූ දිනයේ සිට හෝ තීරණයේ දින සිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස හෝ පළාත් පාලන ආයතනයක හෝ පළාත් සභාවක සභිකයකු ලෙස තෝරා පත් කරනු ලැබීමට හෝ පත් කරනු ලැබීමට නොහැකි විය යුතු අතර, එකී දිනය වන විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස හෝ පළාත් පාලන ආයතනයක හෝ පළාත් සභාවක සභිකයකු ලෙස තෝරා පත් කරනු ලැබ ඇත්නම් එසේ මන්ත්‍රීවරයකු ලෙස හෝ සභිකයකු ලෙස ඒ තැනැත්තාගේ තෝරාපත් කිරීම හෝ පත් කිරීම ඒ දින සිට පුරප්පාඩු විය යුතු ය;

(ආ) එවැනි තැනැත්තකු රජයේ සේවකයකු ලෙස සේවයේ නිරතවීම සඳහා හෝ උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලන මණ්ඩලයට තෝරා පත් කර ගනු ලැබීම සඳහා හෝ පත් කරනු ලැබීම සඳහා ජීවිත කාලයට ම නුසුදුස්සකු විය යුතු ය;

(ඇ) එම තැනැත්තා උපලේඛනගත ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක පාලන මණ්ඩලයේ සාමාජිකයකු නම්, එකී වරදකරු කරනු ලැබීමේ හෝ තීරණයේ දින සිට එම තැනැත්තා එම ආයතනයේ සාමාජිකයකු වීම අවසන් විය යුතු ය; සහ

(ඈ) එම තැනැත්තා රජයේ නිලධරයකු නම්, එම වරදකරු කරනු ලැබීමේ හෝ තීරණයේ දින සිට එම තැනැත්තා රජයේ නිලධරයකු වීම අවසන් විය යුතු අතර, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඔහු සේවයෙන් පහකිරීම සඳහා නීතියෙන් බලය දී ඇති අධිකාරිය විසින් ඒ දින සිට ඔහු සේවයෙන් පහකරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

වරදකරු නොකිරීම මත පදනම් වූ දේපළ රජය සතු කිරීම

**115.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කොමිෂන් සභාව මගින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් සිදු කරනු ලබන ඉල්ලීක් මත, බැලූබැල්මට පෙනෙන පරිදි වැඩි බර සාක්ෂි මත එකී දේපළ මේ පනත යටතේ සිදු කරන ලද වැරදි කිසිවකින් ලබා ගත් දේපළක් බවට හෝ එසේ ලබා ගනු ලැබූ දේපළක් නියෝජනය වන යම් දේපළක් බවට හෝ මේ පනත යටතේ යම් වැරදි සිදු කිරීම සඳහා භාවිත කිරීමට අදහස් කළ දේපළක් බවට මහාධිකරණය සෑහීමට පත් වූ අවස්ථාවක, මහාධිකරණය විසින්, සාධාරණ කාලසීමාවක් තුළ එහි අධිකරණ බලය තුළ වන යම් දේපළක් සම්බන්ධයෙන් වරදකරු නොකිරීම මත පදනම් වූ රජය සතු කිරීමේ නියෝගයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් දේපළක් (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් දේපළක් බවට සෑහීමට පත්වීම සඳහා-

(අ) එකී දේපළ කෙලින්ම හෝ අන්‍යාකාරයකින් සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් හෝ මේ පනත යටතේ වන යම් නිශ්චිත වරදක් සිදු කිරීමෙන් ලබාගත් බවට; හෝ

(ආ) එවැනි යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව අපරාධ නඩු පවරා ඇති බවට හෝ එම තැනැත්තා වරදකරු කරනු ලැබ ඇති බවට,

පෙන්වීම අවශ්‍ය නොවන අතර, අවශ්‍ය වනුයේ එය මේ පනත යටතේ වන යම් වරදක් මගින් උපයාගත් දෙයක් බවට හෝ මේ

පනත යටතේ වරදක් සිදු කිරීම සඳහා එය යොදා ගත් බවට හෝ යොදා ගැනීමට අදහස් කළ බවට පෙන්වීම පමණක් ප්‍රමාණවත් වන්නේ ය.

(3) රජය සතු කිරීම සඳහා වන ඉල්ලීමක්, මේ පනත යටතේ යම් වරදක් කිරීමෙන් ලබා ගත් මුල් මුදල්, විකුණුමක් මගින් හෝ අන්‍යාකාරයෙන් පරිවර්තනය කර ඇත්තේ යම් දේපළකට ද, එම දේපළ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) අධ්‍යක්ෂවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වන දැන්වීමක්, එකී ඉල්ලීමේ විෂයය කරුණ වන දේපළට බැඳියාවක් ඇති බවට හිමිකම් කියන යම් තැනැත්තකු වෙත, හෝ එකී දේපළේ බැඳියාවක් ඇති බවට හඳුනන යම් තැනැත්තකු වෙත, හෝ එකී දේපළට බැඳියාවක් ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සාධාරණව විශ්වාස කරනු ලබන තැනැත්තකුට, එකී ඉල්ලීම සිදු කිරීමෙන් දින තිහක කාලසීමාවක් ඉකුත්වීමට පෙර ලිඛිතව ලබා දිය යුතු යඃ

එසේ වුව ද, එකී තැනැත්තා නඩු කටයුතුවලින් සැඟවී සිටින්නේ නම්, දැන්වීම අතහැර දැමීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමේ විෂය කරුණ වන දේපළ පිළිබඳ බැඳියාව සඳහා හිමිකම් කියනු ලබන යම් තැනැත්තකු විසින් එකී ඉල්ලීම විමසීමේ දී පෙනී සිට සාක්ෂි ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(6) අධිකරණය විසින්, (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් යම් තීන්දුවක් ලබා දීමට පෙර ඕනෑම අවස්ථාවක, අධිකරණයේ මතය අනුව, එකී ඉල්ලීම සම්බන්ධයෙන් බැඳියාවක් ඇති බවට පෙනී යන යම් තැනැත්තකුගේ යහපත සඳහා, එකී ඉල්ලීම පිළිබඳ දැන්වීමක්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් පළවන ශ්‍රී ලංකාවේ දිනපතා පුවත්පතක පළ කරන ලෙසට අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියම කළ හැකි ය.

(7) (1) වන උපවගන්තිය යටතේ යම් ඉල්ලීමක විෂය කරුණ වන යම් දේපළක් පිළිබඳ බැඳියාවක් සඳහා යම් තැනැත්තකු විසින් හිමිකම් කියනු ලබන අවස්ථාවක දී, එකී තැනැත්තා විසින්-

(අ) එකී දේපළ පිළිබඳ බැඳියාව අත්පත් කරගෙන ඇත්තේ මේ පනත යටතේ එකී දේපළට අදාළ වරද කිරීමට පෙරාතුව බව; හෝ

(ආ) සාධාරණ වටිනාකමක් සඳහා එකී දේපළ පිළිබඳ හිමිකම අත්පත් කරගෙන ඇත්තේ මේ පනත යටතේ එකී දේපළට අදාළ වරද සිදු කිරීමෙන් පසුව වුව ද, එකී දේපළ මේ පනත යටතේ සිදු කළ යම් වරදකින් ලබා ගත් දෙයක් බවට නොදැන සිටි බව හෝ එම හිමිකම ලබා ගැනීම ඒ පිළිබඳව දැනගැනීමට සාධාරණ ලෙස හැකියාවක් නොවූ බවට,

අධිකරණය සෑහීමට පත් කරනු ලබන්නේ නම්, එකී ආකාරයට එකී හිමිකම සම්බන්ධයෙන් රජය සතු කිරීමේ නියෝගය බල නොපාන බව ප්‍රකාශ කරමින් ආඥාවක් නිකුත් කිරීමට අධිකරණයට හැකි ය.

(8) අධිකරණය විසින්, මේ වගන්තිය යටතේ හෝ ඉන්පසු ඕනෑම අවස්ථාවක දී රජය සතු කිරීමේ නියෝගයක් සිදු කරනු ලබන විට, එකී දේපළ පැවරීමට පහසුකම් සැලසීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් වන නියෝග ඇතුළුව අධිකරණයට සුදුසු යැයි සලකනු ලැබිය හැකි වෙනත් යම් නියෝගයක් සිදු කළ හැකි ය.

(9) මේ වගන්තිය යටතේ සිදු කරනු ලබන යම් නියෝගයක්, මේ ඉල්ලීමේ විෂය කරුණ වන දේපළ සම්බන්ධයෙන්, යම් අපරාධය නඩු කටයුත්තක් පැවරීමක දී හෝ යම් අපරාධ නඩු කටයුත්තක් පැවරිය යුතු ද නොමැති ද යන්න තීරණය කිරීම සඳහා මෙහෙයවනු ලබන විමර්ශනයක දී, ගනු ලබන තීරණයක් මගින් බලපෑමට ලක් නොවිය යුතු ය.

(10) රජය සතු කිරීමේ නියෝගයට අදාළ 114 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ වගන්තිය යටතේ වන රජය සතු කිරීමේ නියෝගයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරන වැරදි

**116.** මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් පුද්ගල මණ්ඩලයක් වරදකරු කරනු ලැබූ අවස්ථාවක-

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන මණ්ඩලයක් හෝ සංස්ථාවක් නම්, එහි

සෑම අධ්‍යක්ෂවරයකු ම හෝ නිලධරයකු ම හෝ අනුයෝජිතයකු ම; සහ

(ආ) එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, එහි සෑම හවුල්කරුවකු ම,

අදාළ වරද සම්බන්ධයෙන් නිශ්චිතව දක්වා ඇති දඩයකට යටත් විය යුතු ය:

එසේ වුව ද, ඔහුගේ අනුදැනුමෙන් තොරව එම වරද සිදු කළ බවට නැතහොත් එම වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඔහු විසින් නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බවට ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, එකී සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන මණ්ඩලයේ හෝ එකී සංස්ථාවේ යම් අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ අනුයෝජිතයකු හෝ එම ව්‍යාපාර ආයතනයේ යම් හවුල්කරුවකු එකී වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

සේවා නියුක්තයකු යන්නට හිටපු සේවා නියුක්තයකු ඇතුළත් වීම ආදිය

**117.** මේ කොටසේ කාර්ය සඳහා, රජයේ සේවකයකු හෝ පෞද්ගලික අංශයේ ආස්ථිත්‍යයක සේවානියුක්තයකු යන්නට-

(අ) හිටපු සේවානියුක්තයකු;

(ආ) පොදු අධිකාරියක් හෝ පෞද්ගලික අංශයේ ආස්ථිත්‍යයක් වෙත ද්විතීයනය කරන ලද තැනැත්තකු;

(ඇ) පොදු අධිකාරියක් හෝ පෞද්ගලික අංශයේ ආස්ථිත්‍යයක් වෙනුවෙන් රාජකාරි කිරීමෙහි නිරත වන හෝ සේවා කොන්ත්‍රාත්තුවක් යටතේ ගිවිසුම් ගත පුද්ගලයකු;

(ඈ) (පොදු අධිකාරියේ හෝ පෞද්ගලික අංශයේ ආස්ථිත්‍යයේ, මණ්ඩලයේ හෝ පාලන මණ්ඩලයේ සාමාජිකයකු වන තැනැත්තකු ඇතුළු) පොදු අධිකාරිය හෝ පෞද්ගලික අංශයේ ආස්ථිත්‍යය කළමනාකරණය කිරීමට අදාළ තැනැත්තකු;

(ඉ) යම් රාජකාරියක් සඳහා ත්‍යාගයක් හෝ ත්‍යාගයක් පිළිබඳ අපේක්ෂාවක් හෝ නොමැතිව ස්වේච්ඡා සේවකයකු ලෙස පොදු අධිකාරිය හෝ පෞද්ගලික අංශයේ ආස්ථිත්‍යය වෙනුවෙන් රාජකාරි කරන යම් තැනැත්තකු; හෝ

(ඊ) පොදු අධිකාරියේ හෝ පෞද්ගලික අංශයේ ආස්‍රිත්‍යයේ පුහුණුව ලබන්නකු හෝ ආධුනිකයකු,

ඇතුළත් වේ.

II වන පරිච්ඡේදය

**කාර්ය පටිපාටිය වැරදි**

අපහාස කිරීම

**118.** (1) කොමිෂන් සභාවේ අධිකාරයට එරෙහිව හෝ ඊට අගෞරව වන පරිදි සිදු කරන ලද සෑම අපහාස කිරීමේ වරදක් සඳහා ම, ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, එහි අධිකාරයට එරෙහිව හෝ ඊට අගෞරව වන පරිදි සිදු කරන ලද අපහාස කිරීමේ වරදක් මෙන් දඬුවම් කරනු ලැබිය යුතු අතර, එකී සෑම වරදක් ම නඩු විභාග කිරීම සඳහා වන අධිකරණ බලය මෙයින් ශ්‍රේෂ්ඨාධිකරණය සතු වන්නේ ය.

(2) එකී ක්‍රියාව ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් කරන ලද්දේ නම් නැතහොත් නොකර හරින ලද්දේ නම්, එමගින් එකී අධිකරණයේ අධිකාරයට එරෙහිව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස කිරීමේ වරදක් සංස්ථාපනය වන්නේ නම්, කොමිෂන් සභාව ඉදිරිපිට වුව ද, අන්‍යාකාරයකින් වුව ද, කොමිෂන් සභාව සම්බන්ධයෙන් කරන ලද හෝ නොකර හරින ලද එවැනි යම් ක්‍රියාවක් මගින් කොමිෂන් සභාවේ අධිකාරයට එරෙහිව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස කිරීමේ වරදක් සංස්ථාපනය විය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින්-

(අ) මේ පනත යටතේ භාරදෙනු ලබන සිතාසියක සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී, කොමිෂන් සභාවේ මතය අනුව ප්‍රමාණවත් පරිදි සාධාරණ වූ හේතුවකින් තොරව, කොමිෂන් සභාව ඉදිරියෙහි පෙනී සිටීම පැහැර හරිනු ලැබුවහොත්;

(ආ) ප්‍රතිඥාවක් දීමට හෝ දිවිරුමක් දීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ යථා පරිදි ප්‍රතිඥාවක් හෝ දිවිරුමක්

දුන් පසු කොමිෂන් සභාවේ මතය අනුව ප්‍රමාණවත් පරිදි සාධාරණ වූ හේතුවකින් තොරව, කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලබන කාරණා සම්බන්ධයෙන් එකී තැනැත්තා වෙත යොමු කරන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත්;

(ඇ) කොමිෂන් සභාවේ මතය අනුව ප්‍රමාණවත් පරිදි සාධාරණ වූ හේතුවකින් තොරව, කොමිෂන් සභාව විසින් එම තැනැත්තා වෙත නිකුත් කරනු ලබන හෝ කරනු ලබන දැන්වීමක හෝ ලිඛිත නියෝගයක නියමයන්වලට අනුකූලවී කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත්; හෝ

(ඈ) මේ පනත යටතේ සිතාසියක් භාරදීමෙන් පසු, කොමිෂන් සභාවේ මතය අනුව ප්‍රමාණවත් පරිදි සාධාරණ වූ හේතුවකින් තොරව, එකී තැනැත්තාගේ සන්තකයේ හෝ පාලනයේ ඇත්තා වූ ද, කොමිෂන් සභාවේ මතය අනුව, විමර්ශනය කරනු ලබන කාරණාවල සත්‍යතාව පිළිබඳ නිගමනය කිරීමට අවශ්‍ය වන්නා වූ ද යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම හෝ පෙන්වීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත්,

එකී තැනැත්තා, කොමිෂන් සභාවේ අධිකාරයට එරෙහිව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස කිරීමේ වරද සිදු කරනු ලබන්නේ ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලබන කාරණා යම් අධිකරණයක දී පවත්වනු ලබන යම් නඩු කටයුත්තක, විෂයය වූ නැතහොත් යම් පරීක්ෂණයක විෂයය කාරණ වීමට ඉඩ ඇති කාරණාම වීම හෝ ඊට සැලකිය යුතු ලෙස සමාන කාරණයක් වීම යන හේතුව හෝ එකී ප්‍රශ්නයට පිළිතුරු දීම හෝ එම ලේඛනය හෝ වෙනත් දෙය ඉදිරිපත් කිරීම හෝ පෙන්වීම මගින් වෙනත් යම් නඩු කටයුත්තක දී එම තැනැත්තාට කෙලින් ම හෝ අන්‍යාකරයකින් බලපෑමක් ඇති විය හැකි වීම හෝ අගතියක් සිදුවිය හැකි වීම යන හේතුව යම් තැනැත්තකු විසින් යම්

ප්‍රශ්නයකට පිළිතුරු දීම හෝ යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම හෝ පෙන්වීම ප්‍රතික්ෂේප කිරීම හෝ පැහැර හැරීම සඳහා වූ සාධාරණ හේතුවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(5) යම් තැනැත්තකු විසින් (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ එකී ස්වකීය අධිකාරයට එරෙහිව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස කිරීමේ යම් වරදක් සිදු කර ඇති බවට කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම නිශ්චය කිරීම දක්වමින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත සහතිකයක් යොමු කරනු ලැබීම සඳහා කොමිෂන් සභාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, එම සහතිකය කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, සැලකිල්ලට ගනු ලැබීමට සුදුසු යැයි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සලකනු ලැබිය හැකි වූ අපහාස කිරීමේ වරදකට දඬුවම් කිරීම සඳහා වන යම් නඩු කටයුත්තක දී, (5) වන උපවගන්තිය යටතේ අත්සන් කර අධිකරණය වෙත යොමු කරන ලදැයි උද්දේශිත යම් ලේඛනයක්-

(අ) සාක්ෂි වශයෙන් භාරගනු ලැබිය යුතු අතර, පටහැනි බව ඔප්පු කරනු ලබන්නේ නම් මිස, වැඩිදුර සාක්ෂිවලින් තොරව එවැනි සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) සහතිකයේ දක්වා ඇති නිශ්චය කිරීම කොමිෂන් සභාව විසින් ගනු ලැබූ බවට ද එම නිශ්චය කිරීමේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ද වන සාක්ෂියක් විය යුතු ය.

(7) මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි කොමිෂන් සභාවේ අධිකාරයට එරෙහිව හෝ ඊට අගෞරව වන පරිදි සිදු කර ඇතැයි උද්දේශිත යම් වරදකට දඬුවම් කිරීම සඳහා ගනු ලබන යම් නඩු කටයුත්තක දී, මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වූව ද, කොමිෂන් සභාවේ කිසිදු සාමාජිකයකු, එකී තැනැත්තාගේම කැමැත්ත මත මිස, සාක්ෂිකරුවකු ලෙස කැඳවනු නොලැබිය යුතු ය; සාක්ෂිකරුවකු ලෙස එකී තැනැත්තාගෙන් ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

අසත්‍ය චෝදනා

**119.** එකී චෝදනාව අසත්‍ය බව දැනදැනම හෝ එම චෝදනාවෙන් මේ පනත යටතේ වරදක් සංස්ථාපනය නොවන බව විශ්වාස කිරීමට හේතු ඇතිව, 43 වන වගන්තිය යටතේ ඔහු විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන යම් තොරතුරක දී හෝ පැමිණිල්ලක දී යම් අසත්‍ය චෝදනාවක් කරන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ වසර දහයක් නොඉක්මවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු අතර, ඊට අමතරව, එම චෝදනාව සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එම තැනැත්තාට අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි යම් මුදලක් වන්දියක් ලෙස ගෙවීමට ද යටත් විය යුතු ය.

රහස්‍යභාවය කඩකිරීම

**120.** 28 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති යටතේ ඔහු වෙත නියම කර ඇති රහස්‍යභාවය පවත්වාගෙන යාමේ වගකීම කඩකරමින් කටයුතු කරන සෑම තැනැත්තකු ම වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ වෙනත් නිලධරයකුගේ කාර්යවලට විරෝධය පෑම හෝ බාධා කිරීම

**121.** (අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කොමිෂන් සභාවට සහාය වීම සඳහා පත් කරන ලද යම් නිලධරයකු විසින් යම් ස්ථානයකට ඇතුළු වීම, යම් ස්ථානයක් සෝදිසි කිරීම හෝ යම් ස්ථානයකට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කරනු ලබන;

(ආ) මේ පනත යටතේ සිදු කිරීමට හිමිකම් ලබා ඇති යම් ඇතුළු වීමක් සිදු කිරීමේ දී හෝ මේ පනත යටතේ නියම කරන ලද යම් කාර්යයක් නැතහොත් පිරිනමන ලද යම් බලයක් ක්‍රියාවේ යෙදවීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ කොමිෂන් සභාවට සහාය වීම

සඳහා පත් කරන ලද යම් නිලධරයකුට පහර දෙන, බාධා කරන, එවැනි යම් නිලධරයකු වළක්වන හෝ ප්‍රමාද කරන;

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කොමිෂන් සභාවට සහාය වීම සඳහා පත් කරන ලද යම් නිලධරයකු විසින් මේ පනත යටතේ එකී තැනැත්තාගේ කාර්යය ක්‍රියාවේ යෙදවීමේ දී කරනු ලබන යම් නීත්‍යනුකූල ඉල්ලීමකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින;

(ඈ) එකී තැනැත්තා විසින් සාධාරණ ලෙස ලබාදීමට අවශ්‍ය කරනු ලැබිය හැකි වූ ද, එකී තැනැත්තා විසින් ලබාදීමට එකී තැනැත්තාට බලය ඇත්තා වූ ද, යම් තොරතුරක් ලබාදීම ප්‍රතික්ෂේප කරන හෝ නොසලකා හරින; හෝ

(ඉ) මේ පනතේ විධිවිධාන යටතේ යම් නිලධරයකුගේ කාර්යය ඉටු කිරීමේ දි එකී නිලධරයාට විරෝධය පාන හෝ බාධා කරන,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

අසත්‍ය ප්‍රකාශ, තොරතුරු ආදිය

**122.** දැන දැනම-

(අ) මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වූ ද, යම් තැනැත්තකු විසින් යම් වරදක් සිදු කර ඇති බව විමර්ශනයක් මගින් හෙළිදරව් වන්නේ නම් අසත්‍ය හෝ නොමඟ යවනසුලු තොරතුරක් සම්බන්ධයෙන් ද, එවැනි යම් අසත්‍ය හෝ නොමඟ යවන සුලු තොරතුරක් වූ ද, තොරතුරක් ලබා දෙන හෝ ලබා දීමට කටයුතු සලස්වන; හෝ

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කොමිෂන් සභාවට සහාය වීම සඳහා පත් කරන ලද වෙනත් යම් නිලධරයකුට අසත්‍ය හෝ නොමඟ යවන සුළු තොරතුරක් ලබා දෙන හෝ ලබා දීමට කටයුතු සලස්වන,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

අසත්‍ය සාක්ෂි ලබා දීම

**123.** (1) මේ පනත යටතේ යම් නඩු කටයුත්තක දී අසත්‍ය සාක්ෂි ලබා දෙන යම් තැනැත්තකු සම්බන්ධයෙන් (19 වන අධිකාරය) දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 135 වන වගන්තිය යටතේ ලබාගත යුතු යැයි නියම කර ඇති නීතිපතිවරයාගේ පූර්ව අනුමතය මේ වගන්තිය යටතේ වන යම් අපරාධ නඩු කටයුත්තක් පැවරීම සඳහා අදාළ නොවිය යුතු ය.

නිලධරයකු බවට ව්‍යාජ ලෙස පෙන්වීම

**124.** තමා නිලධරයකු බවට, කොමිෂන් සභාවේ සේවා නියුක්තයකු බවට හෝ 27 වන වගන්තිය යටතේ සේවය ලබාගනු ලැබ සිටින තැනැත්තකු හෝ මේ පනත යටතේ එවැනි නිලධරයකු, සේවානියුක්තයකු හෝ තැනැත්තකු සතු බලතල කිසිවක් තමා සතු බවට හෝ එවැනි නිලධරයකු, සේවානියුක්තයකු හෝ තැනැත්තකුට බලපෑම් එල්ල කිරීමේ හැකියාව තමන් සතු වන බවට හෝ මේ පනත යටතේ එම නිලධරයාගේ, සේවානියුක්තයාගේ හෝ තැනැත්තාගේ කාර්යයට අදාළ කිසියම් දෙයක් එකී නිලධරයා, සේවානියුක්තයා හෝ තැනැත්තා විසින් කරනු ලැබීමට හෝ කිරීමෙන් වැළකීමට කටයුතු සැලැස්වීමට තමාට හැකි බවට ව්‍යාජ ලෙස පෙන්වන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

යුක්තියට බාධා කිරීම

**125.** (1) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කොමිෂන් සභාවේ නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ 27 වන වගන්තිය යටතේ සේවය ලබා ගනු ලැබ සිටින තැනැත්තකු විසින් ස්වකීය කාර්යය කිරීමේ දී එකී සාමාජිකයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා, නිලධරයා හෝ සේවානියුක්තයා හෝ තැනැත්තාට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් බලපෑම් කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස්දහසක දඩයකට යටත් විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කොමිෂන් සභාවේ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ 27 වන වගන්තිය යටතේ සේවය ලබා ගනු ලැබ සිටින තැනැත්තකුට, මේ පනත යටතේ එකී සාමාජිකයාගේ, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ, හෝ වෙනත් යම් නිලධරයාගේ හෝ සේවානියුක්තයාගේ හෝ තැනැත්තාගේ කාර්යය කිරීමෙන් වැළැක්වීම සඳහා, එකී සාමාජිකයාගේ, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ, හෝ වෙනත් යම් නිලධරයාගේ හෝ සේවානියුක්තයාගේ හෝ තැනැත්තාගේ ශරීරයට, මනසට හෝ කීර්තියට යම් හානියක් සිදු කරන බවට ලිඛිත හෝ වාචික වචන මගින් හෝ යම් ක්‍රියාවක් මගින් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් තර්ජනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර, මේ උපවගන්තිය යටතේ වන වරදක් සම්බන්ධයෙන් දෙවන හෝ තදනන්තර වරදකරු කරනු ලැබීමක දී, එම දඩයට අමතරව, වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට ද යටත් විය යුතු ය.

(3) මේ පනත යටතේ කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොමිෂන් සභාවේ වෙනත් යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ 27 වන වගන්තිය යටතේ සේවය ලබා ගනු ලැබ සිටින තැනැත්තකුගේ කාර්යය කිරීමෙන් වැළැක්වීම සඳහා එකී සාමාජිකයාගේ, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ, හෝ වෙනත් යම් නිලධරයාගේ හෝ සේවානියුක්තයාගේ හෝ 27 වන වගන්තිය යටතේ

සේවය ලබා ගනු ලැබ සිටින තැනැත්තාගේ ශරීරයට, මනසට හෝ කීර්තියට හානියක් සිදු කරන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහකට නොඅඩු වූ ද, රුපියල් මිලියනයකට නොවැඩි වූ ද, දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා වූ බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතු ය.

*කොමිෂන් සභාවේ නියෝගයක් ක්‍රියාත්මක කිරීම, ප්‍රතික්ෂේප කිරීම, නොසලකා හැරීම හෝ නොකර හැරීම*

**126.** (1) මේ පනත යටතේ වන බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී කොමිෂන් සභාව, එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ නිලධරයන් විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට, දැන්වීමකට, නියෝගයකට, විධානයකට හෝ ඉල්ලීමකට අනුකූලව කටයුතු කිරීම සාධාරණ හේතුවකින් තොරව පැහැර හරින හෝ නොසලකා හරින යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා වූ බරපතළ වැඩ ඇතිව බන්ධානාගාරගත කිරීමකට හෝ යටත් විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට (1) වන උපවගන්තිය යටතේ වන වරදක් සඳහා එකී මහෙස්ත්‍රාත් අධිකරණයේ අපරාධ නඩුවක් පැවරිය හැකිය.

*විවිධ වැරදි*

**127.** (1) (අ) කොමිෂන් සභාව විසින් පරීක්ෂා කිරීමට නියමිත හෝ පරීක්ෂා කරනු ලැබූ යම් තැනැත්තකුට බාධා කරන;

(ආ) මේ පනත යටතේ පවරනු ලබන යම් නඩු කටයුත්තක දී, අධිකරණයක දී හෝ අධිකරණයක් ඉදිරියෙහි පෙනී සිටින ලෙස සිතාසි නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකුට බාධා කරන;

(ඇ) මේ පනත යටතේ වන යම් නඩු කටයුත්තක දී, යම් අධිකරණයක දී සාක්ෂි ලබා දීමෙන් වැළකීමට යම් තැනැත්තකු පොළඹවන;

(ඈ) මේ පනත යටතේ වන යම් නඩු කටයුත්තක දී, යම් අධිකරණයක දී යම් තැනැත්තකු සාක්ෂි

ලබා දීමෙන් වැළැක්වීම සඳහා එම තැනැත්තාගේ ශරීරයට, මනසට හෝ කීර්තියට හානියක් සිදු කරන බවට තර්ජනය කරන;

(ඉ) මේ පනත යටතේ වන යම් නඩු කටයුත්තක දී, යම් අධිකරණයක දී යම් තැනැත්තකු සාක්ෂි ලබා දීමෙන් වැළැක්වීම සඳහා එම තැනැත්තාගේ ශරීරයට, මනසට හෝ කීර්තියට හානි සිදු කරන;

(ඊ) මේ පනත යටතේ වන යම් නඩු කටයුත්තක දී, යම් අධිකරණයක දී සාක්ෂි ලබා නොදෙන ලෙස යම් තැනැත්තකුට බල කරන;

(උ) මේ පනත යටතේ භාර දෙනු ලබන ඉල්ලීමක සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී කොමිෂන් සභාව ඉදිරියෙහි පෙනී සිටීම සාධාරණ හේතුවකින් තොරව පැහැර හරින;

(ඌ) සාධාරණ හේතුවකින් තොරව, ප්‍රතිඥාවක් දීම හෝ දිව්රුමක් දීම ප්‍රතික්ෂේප කරන හෝ යථා පරිදි ප්‍රතිඥාවක් දීමෙන් හෝ දිව්රුමක් දීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලබන කාරණා සම්බන්ධයෙන් එම තැනැත්තා වෙත යොමු කරන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින;

(එ) සාධාරණ හේතුවකින් තොරව, කොමිෂන් සභාව විසින් එකී තැනැත්තා වෙත නිකුත් කරනු ලබන හෝ කරනු ලබන දැන්වීමක හෝ ලිඛිත නියෝගයක නියමයන්ට අනුකූලව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින;

(ඒ) මේ පනත යටතේ වන යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම සඳහා අදාළ වන හෝ අදාළ වීමට ඉඩ ඇති යම් ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් හෝ දෙයක්

හෝ අසත්‍යනය කරන, සඟවන, විනාශ කරන හෝ අන්‍යාකාරයකින් බැහැර කරන හෝ අසත්‍යනය කිරීම, සැඟවීම, විනාශ කිරීම හෝ බැහැර කිරීම සඳහා කටයුතු සලස්වන හෝ අවසර දෙන;

(ඔ) මේ පනතේ විධිවිධානවල අනුකූලව කරනු ලබන යම් නියෝගයක් ක්‍රියාවේ යෙදවීමට අදාළ වන හෝ අදාළ වීමට ඉඩ ඇති යම් ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් හෝ දෙයක් අසත්‍යනය කරන, සඟවන, විනාශ කරන හෝ අන්‍යාකාරයකින් බැහැර කරන හෝ අසත්‍යනය කිරීම, සැඟවීම, විනාශ කිරීම හෝ බැහැර කිරීම සඳහා කටයුතු සලස්වන හෝ අවසර දෙන;

(ඕ) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත හෝ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ වන යම් විමර්ශනයකට අදාළ බව එකී තැනැත්තා දන්නා හෝ විශ්වාස කිරීමට හේතු ඇති යම් ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් විනාශ කරන හෝ අන්‍යාකාරයකින් බැහැර කරන; හෝ

(ක) මේ පනතේ යම් විධිවිධානයක් ප්‍රකාර වාර්තාවක් සකස් කර ඇති බව නැතහොත් කොමිෂන් සභාව වෙත යම් තොරතුරක් ලබා දී ඇති බව හෝ වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරන බව නැතහොත් සිදු කිරීමට නියමිත බව හෙළිදරව් කරන හෝ එකී විමර්ශනයට අගතියක් සිදුවීමට ඉඩ ඇති වෙනත් තොරතුරක් වෙනත් යම් තැනැත්තකුට හෙළිදරව් කරන,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන -

(අ) ඒ තැනැත්තාගේ කාර්ය කිරීමට අදාළ යම් කාර්යයක් සඳහා මේ පනත යටතේ වාර්තාවක් සකස් කරන තැනැත්තාගේ නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ අනුයෝජිතයකු;

(ආ) යම් කාරණයක් සම්බන්ධයෙන් නීති උපදෙස් හෝ නියෝජනය ලබා ගැනීමේ කාර්යය සඳහා නීතිඥවරයකු හෝ නීති උපදේශකවරයකු; හෝ

(ඇ) එය අධීක්ෂණ අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමට අදාළ වන තාක් දුරට, අදාළ ආයතනයේ අධීක්ෂණ අධිකාරිය,

වෙත කරනු ලබන හෙළිදරව් කිරීම සඳහා අදාළ නොවිය යුතු ය.

(3) යම් තොරතුරක් එකී තැනැත්තා වෙත හෙළිදරව් කරනු ලැබ ඇති (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කිසිම තැනැත්තකු විසින්, එය -

(අ) ඉහත පළමුව කී තැනැත්තාගේ කාර්ය කිරීමට; හෝ

(ආ) එම කාරණය සම්බන්ධයෙන් නීති උපදෙස් හෝ ලබා ගැනීමට,

අවශ්‍ය තාක් දුරට, එහි සඳහන් තැනැත්තකු වෙත හැර වෙනත් යම් තැනැත්තකු වෙත ඒ තොරතුරු හෙළිදරව් කරනු නොලැබිය යුතු ය.

(4) යම් තොරතුරක් හෙළිදරව් කරනු ලැබ ඇත්තේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු වෙත ද එවැනි කිසිම තැනැත්තකු විසින් ඒ උපවගන්තියේ සඳහන් කාර්යය සඳහා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා ගැනීමේ හෝ 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාර පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය වෙත කාරණය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා මිස, ඒ තොරතුර හෙළිදරව් කරනු නොලැබිය යුතු ය.

**128.** මේ පනතේ 146 වන වගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතු ය.

තොරතුරු ලබා දීම සඳහා වන නෛතික බැඳීම කඩ කිරීම

**129.** මේ පනතින් හෝ වෙනත් අදාළ නීතියක් විසින් විධිවිධාන සලසා ඇති පරිදි කිසිදු දණ්ඩනයක් නියම කර නොමැති, 41 වන වගන්තියේ සඳහන් වන ආකාරයේ වරදක් සිදු කරන යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

සාමාන්‍ය වැරදි

## IV වන කොටස

### සාමාන්‍ය

**130.** කොමිෂන් සභාවේ නියමය මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නඩු පවරනු ලබන්නේ නම් මිස, මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් නඩු කටයුතු පැවරීමක් භාරගනු නොලැබිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ නියමය මත මහෙස්ත්‍රාත් අධිකරණවල නඩු කටයුතු පැවරීම ආරම්භ කළ යුතු බව

**131.** (1) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිකරණය විසින්, වන්දි ලෙස යම් මුදලක් කොමිෂන් සභාවේ අරමුදලට හෝ එම වරදින් බලපෑමට ලක් වූ යම් තැනැත්තකුට ගෙවන ලෙස මේ පනත යටතේ වන යම් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

වන්දි

(2) (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන වන්දිය, අධිකරණය විසින් නියම කරනු ලැබූ දඩයක් මෙන් අයකර ගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වන්දියක් ලෙස නියම කරනු ලබන එකී මුදල, අධිකරණයක් මගින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ යම් කාලසීමාවක දී හෝ වාරික වශයෙන් හෝ ගෙවන ලෙස අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි ය.

සංඥෙය වැරදි

**132.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්යය සඳහා, මේ පනත යටතේ වන සියලු වැරදි සංඥෙය වැරදි විය යුතු ය.

වරදක් සිදු කිරීම සඳහා අනුබල දීම

**133.** (අ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පදිංචි ප්‍රධානියකුගේ කටයුතු හෝ ව්‍යාපාරය සම්බන්ධයෙන් හෝ එහි ප්‍රධානියා වෙනුවෙන් වූ ද, ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලැබුවේ නම් මේ පනත යටතේ වරදක් වන්නා වූ ද, යම් ක්‍රියාවක් ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කිරීම,

සඳහා අනුබල දෙන කවර වූ හෝ තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, පළමුව කී වරද සම්බන්ධයෙන් මේ පනතින් නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් ම එකී තැනැත්තා සම්බන්ධයෙන් නඩු විභාග කරනු ලැබිය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට එකී තැනැත්තා එම දඬුවමට ම යටත් විය යුතු ය.

මේ වගන්තියේ "අනුබල දීම" යන යෙදුමට (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන සහ 101 වන වගන්තිවල ඇති අර්ථය ම තිබිය යුතු ය.

තැත් කිරීම

**134.** මේ පනත යටතේ වරදක් සිදු කිරීමට හෝ වරදක් සිදු කිරීමට කටයුතු සැලැස්වීමට තැත් කරන්නා වූ ද, එසේ තැත්කිරීමේ දී ඒ වරද සිදු කිරීම සඳහා වූ වෙනත් යම් ක්‍රියාවක් කරන්නා වූ ද, යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, පළමුව කී වරද සම්බන්ධයෙන් මේ පනතින් නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් ම එකී තැනැත්තා සම්බන්ධයෙන් නඩු විභාග කරනු ලැබිය යුතු අතර,

වරදකරු කරනු ලැබූ විට එකී තැනැත්තා එම දඬුවමට ම යටත් විය යුතු ය.

කුමන්ත්‍රණය කිරීම

**135.** මේ පනත යටතේ වරදක් සිදු කිරීම සඳහා වන සාපරාධී කුමන්ත්‍රණයක පාර්ශ්වකරුවකු වන කවර වූ හෝ තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, පළමුව කී වරද සම්බන්ධයෙන් නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් ම එකී තැනැත්තා සම්බන්ධයෙන් නඩු විභාග කරනු ලැබිය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට එකී තැනැත්තා එම දඬුවමට ම යටත් විය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා, "කුමන්ත්‍රණය කිරීම" යන්නට, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 113අ වගන්තිය යටතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනත ආදිය අදාළ වීම

**136.** (1) මේ පනතේ විධිවිධාන මගින් බැහැර කර නොමැති නැතහොත් මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ යම් විධිවිධාන මේ පනත සඳහා සාමාන්‍යයෙන් අදාළ කර ගත යුතු ය.

(2) මේ පනතේ විධිවිධානවලින් ප්‍රකාශිතව ම බැහැර නොකළ හෝ මේ පනතේ විධිවිධාන හා අනනුකූල නොවන 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ විධිවිධාන මේ කොටසට අදාළ කර ගත යුතු ය.

(3) අ උපලේඛනය සහ ආ උපලේඛනය යටතේ ඇති වරදවල් සඳහා (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ හෝ 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනතට හෝ 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතට එරෙහිව ඇති වරදවල් සඳහා අදාළ වගන්තිවල ඇති අර්ථය ම තිබිය යුතු අතර, අදාළ වගන්තිවල නිශ්චිතව දක්වා ඇති දඬුවම් ම අවස්ථාවෝචිත පරිදි ලබා දිය යුතුය.

වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන සලස්වා නොමැති අවස්ථා

**137.** මේ පනත මගින් හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක් මගින් විශේෂ විධිවිධාන සලස්වා නොමැති කාර්ය පටිපාටිය කාරණා සම්බන්ධයෙන් වන විට, අදාළ අවස්ථාවේ දී, යුක්තිය උදෙසා අවශ්‍ය විය හැකි වූ ද, මේ පනතට අනනුකූල

නොවන්නා වූ ද යම් කාර්ය පටිපාටියක් අනුගමනය කරනු ලැබිය හැකි ය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 වන වගන්තිය අදාළ නොවීම

**138.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 වන වගන්තිය මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයේ පවත්වනු ලබන නඩු කටයුතු සඳහා අදාළ නොවිය යුතු ය.

සහකාර පොලිස් අධිකාරිවරයකුට කරන ලද සඳහනක් ආදිය

**139.** මේ පනතේ කාර්ය සඳහා, මේ පනතේ සඳහන් වෙනත් නීති කිසිවක් යටතේ-

(අ) සහකාර පොලිස් අධිකාරිවරයකුට කරන ලද සෑම සඳහනකින් ම, කොමිෂන් සභාව විසින් විශේෂයෙන් බලය දෙන ලද බලයලත් නිලධරයකුහට කරන ලද සඳහනක් ලෙස අදහස් විය යුතු ය; සහ

(ආ) පොලිස් නිලධරයකුට කරන ලද සෑම සඳහනක් ම, කොමිෂන් සභාවේ බලයලත් නිලධරයකුහට කරන ලද සඳහනක් ලෙස අදහස් විය යුතු ය.

යම් නඩු විභාගයකට හෝ පරීක්ෂණයකට සහභාගී වන තැනැත්තන්ගේ වියදම්

**140.** මේ පනත යටතේ කොමිෂන් සභාවේ යම් නඩු විභාගයකට හෝ පරීක්ෂණයකට සාක්ෂි දීම සඳහා සහභාගී වන යම් තැනැත්තකුට කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි යම් අනුප්‍රමාණ මත සහ යම් කොන්දේසිවලට යටත්ව, එකී නඩු විභාගයට හෝ පරීක්ෂණයට සහභාගී වීමට අදාළ වියදම් අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන නඩු කටයුත්තක් අධිකරණයේ වෙනත් යම් කටයුත්තකට පෙර විභාගයට ගනු ලැබිය යුතු බව

**141.** එකී වෙනත් කටයුත්තේ ඇති හදිසි ස්වභාවයෙන් යුතු විශේෂ අවස්ථානුගත කාරණා හේතුවෙන් එසේ කිරීමට නොහැකි වන්නේ නම් මිස, මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් අධිකරණයක පැවැත්වෙන නඩු කටයුත්තක් එකී අධිකරණයේ වෙනත් යම් කටයුත්තකට පෙර විභාගයට ගනු ලැබිය යුතු ය.

රහසිගත නඩු කටයුතු

**142.** කොමිෂන් සභාව හෝ එමගින් බලය ලබා දුන් යම් නිලධරයකු විසින් තත්කාර්ය සඳහා සාදන ලද අයදුමක් මත, මේ පනත යටතේ වන වරදක් සඳහා වන සම්පූර්ණ නඩු කටයුතු හෝ ඒවායේ කොටසක් යම් අධිකරණයක දී රහසේ පැවැත්විය හැකි ය.

තුටු පඬුරක් දෙන තැනැත්තා ශක්නුවත් සාක්ෂිකරුවකු විය යුතු බව

**143.** මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් යම් අධිකරණයක පවත්වනු ලබන යම් නඩු කටයුත්තක දී, තුටු පඬුරක් දෙන තැනැත්තා තුටු පඬුර ලබාගත් බවට චූදිත තැනැත්තාට විරුද්ධව වූ ශක්නුවත් සාක්ෂිකරුවකු විය යුතු අතර, අපසහායකයකු ලෙස සලකනු නොලැබිය යුතු ය. තව ද, එකී අධිකරණයේ හෝ කොමිෂන් සභාවේ තීන්දුව හෝ තීරණය, එය හුදෙක් ම එකී තුටු පඬුරක් දෙන තැනැත්තාගේ තහවුරු නොකළ සාක්ෂිය මත පදනම්ව ගනු ලැබීම හේතුවෙන් ම පමණක් නීති විරෝධී නොවිය යුතු ය.

කලත්‍රයා ශක්නුවත් සාක්ෂිකරුවකු විය යුතු බව

**144.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ යම් තැනැත්තකුට විරුද්ධව පවත්වනු ලබන යම් නඩු කටයුත්තක දී, ඒ තැනැත්තාගේ කලත්‍රයා ශක්නුවත් සාක්ෂිකරුවකු විය යුතු ය.

තොරතුරු ලබාදීම සඳහා වන නීතිමය බැඳීම

**145.** (1) මේ පනත යටතේ පරීක්ෂා කිරීම කොමිෂන් සභාවේ කාර්යය වන්නේ යම් කාරණයක් සම්බන්ධයෙන් එවැනි යම් කාරණයක් සම්බන්ධයෙන් යම් තොරතුරක් ලබා දෙන ලෙස කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබ ඇත්තා වූ ද එකී තොරතුර ලබාදීම තම බලයේ පවත්නා වූ ද සෑම තැනැත්තකු ම ඒ තොරතුර ලබාදීමට නීතියෙන් බැඳී සිටින්නේ ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක්, එකඟතාවයක්, ගිවිසුමක් මගින් හෝ අන්‍යාකාරයකින් නියම කරන ලද රහස්‍යභාවය සම්බන්ධයෙන් වන යම් බැඳීමක් හෝ තොරතුරු හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් වන වෙනත් යම් සීමාවක් නොතකා, යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ නියෝගවලට අනුකූලව කටයුතු කිරීමේ වගකීම

**146.** යම් තැනැත්තකු විසින්, කිසිම ව්‍යතිරේකයකින් තොරව, මේ පනත යටතේ වන බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී කොමිෂන් සභාව, එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ නිලධරයන්

විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට, දැන්වීමකට, නියෝගයකට, විධානයකට හෝ ඉල්ලීමකට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

**අසත්‍ය කරුණු ප්‍රකාශ නොකිරීම සඳහා වන ව්‍යවස්ථාපිත බැඳීම**

147. (1) මේ පනත යටතේ පරීක්ෂා කිරීම කොමිෂන් සභාවේ කාර්යය වන්නේ යම් කාරණයක් ද එවැනි යම් කාරණයක් සම්බන්ධයෙන් යම් ප්‍රකාශයක් හෝ වෙනත් යම් සාක්ෂියක් ලබා දෙන ලෙස කොමිෂන් සභාව විසින් නියම කර ඇත්තා වූ ද, තමාට එකී ප්‍රකාශය හෝ සාක්ෂිය ලබාදිය හැකි වන්නා වූ ද සෑම තැනැත්තකු ම අසත්‍ය කාරණා ප්‍රකාශ නොකිරීමට නීතියෙන් බැඳී සිටින්නේ ය:

එසේ වුව ද, මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් චූදිත යම් තැනැත්තකු ස්වයං-අපරාධාරෝපණ හෝ අපරාධෝච්චාරී ප්‍රකාශ හෝ සාක්ෂි ලබා දීමට බැඳී නොසිටින අතර, ඔහු විසින් එසේ ස්වයං-අපරාධාරෝපණ හෝ අපරාධෝච්චාරී ප්‍රකාශ හෝ සාක්ෂි ලබා දෙනු ලැබුවහොත්, එකී ප්‍රකාශ හෝ සාක්ෂි මේ පනත යටතේ වන යම් විමර්ශනයක දී හෝ නඩු කටයුත්තක දී ආවේශ්‍ය නොවිය යුතු ය.

(2) ඉහතින් වූ උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තකු මේ පනතේ 119 වන වගන්තියේ විධිවිධානවලට යටත් විය යුතු අතර, ඒ අනුව ඔහු සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ වන යම් වරදක් සම්බන්ධයෙන් වන නඩු විභාගයක දී යම් සාක්ෂිකරුවකු විසින් ප්‍රකාශිතව ම හෝ අවශ්‍ය වූ ව්‍යංග්‍යයෙන් හෝ යම් වැදගත් කාරණයක් සම්බන්ධයෙන්, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පවත්වන ලද යම් විමර්ශනයක දී ඔහු විසින් කලින් ලබා දුන් ප්‍රකාශයට හෝ (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමිෂන් සභාවක් විසින් පවත්වන ලද යම් විමර්ශනයක දී ඔහු විසින් කලින් ලබා දුන් ප්‍රකාශයට පරස්පර විරෝධී ප්‍රකාශයක් කරනු ලැබූ අවස්ථාවක, සියලු අවස්ථානුගත කාරණාවල දී එය ආරක්ෂිත බවට ද යුක්ති සහගත

බවට ද මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් සලකනු ලබන්නේ නම්, ස්වාධීන මූලාශ්‍රයකින් ලබාගත් සාක්ෂි මගින් එම ප්‍රකාශය වැදගත් කාරණා සම්බන්ධයෙන් තහවුරු කරනු ලැබූ අවස්ථාවක, මූලසනාරූඪ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් එම ප්‍රකාශය මත පදනම්ව ක්‍රියා කිරීම සහ නඩු කටයුත්තක අවස්ථාවක දී චේතාන්විතව ව්‍යාජ සාක්ෂි ලබාදීම සම්බන්ධයෙන් එම නඩු විභාගය අවසානයේ දී චෝදනා පත්‍රයක් මත එම අධිකරණය ඉදිරියෙහි එම සාක්ෂිකරු සම්බන්ධයෙන් නඩු විභාග කිරීම හෝ එම අධිකරණය මහාධිකරණය නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන අධිචෝදනා පත්‍රයක් මත එම සාක්ෂිකරු සම්බන්ධයෙන් නඩු විභාග කිරීම නීත්‍යනුකූල වන්නේ ය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ කටයුතු කිරීමට පෙර, මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් එම සාක්ෂිකරු සහමුලින්ම අවිශ්වාස කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වන නඩු විභාගයක දී, චූදිතයා විසින් අධිචෝදනා පත්‍රයේ හෝ චෝදනා පත්‍රයේ කර ඇතැයි කියනු ලබන ප්‍රකාශවලට පරස්පර විරෝධී ප්‍රකාශ සිදු කර ඇති බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු අතර, අසත්‍ය වනුයේ ඉන් කවර ප්‍රකාශය ද යන්න ඔප්පු කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(5) මූලසනාරූඪ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින්, එය යෝග්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන්නේ නම්, ඔහු විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා (3) වන උපවගන්තිය යටතේ වන යම් නඩු විභාගයක් කල් තබනු ලැබිය හැකි අතර, එවැනි යම් අවස්ථාවක දී, එම නඩු විභාගය අවසන් වන තෙක් චූදිතයා රිමාන්ඩ් බන්ධනාගාරගත කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, අභියාචනාධිකරණය විසින්, විශේෂ අවස්ථානුගත කාරණාවල දී, නඩු විභාගය අවසන් වන තෙක් එම තැනැත්තා ඇප මත මුදා හරිනු ලැබිය හැකි ය.

(6) යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද,-

(i) දිවුරුම් පත්‍රයක් හෝ දිවුරුම් දුන් ප්‍රකාශයක්; හෝ

(ii) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විමර්ශනයක් අතරතුර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන, භාර දෙනු ලබන හෝ සපයනු ලබන යම් පොතක්, ලේඛනයක්, චෙක්පතක්, වාර්තාවක් හෝ නාමලේඛනයක් හෝ එහි සහතික කළ පිටපතක් හෝ එවැනි යම් පොතක, ලේඛනයක, වාර්තාවක හෝ නාමලේඛනයක ඇති යම් සටහනක සහතික කළ පිටපතක්,

මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව පවත්වනු ලබන නඩු විභාගයක දී අදාළ සහ ආවේශ්‍ය විය යුතු අතර, එය ක්‍රියාවේ යෙදවීම සහ එහි අන්තර්ගත දෑ සම්බන්ධයෙන් එය බැලුබැල්මට පෙනෙන සාධකයක් විය යුතු ය.

නිලධරයන් සෑම විට ම රාජකාරියේ යෙදී සිටිය යුතු බව

**148.** මේ පනතේ කාර්ය සඳහා, කොමිෂන් සභාවේ සෑම නිලධරයකු ම ඔහුගේ කාර්ය සහ කර්තව්‍ය කිරීමට අවශ්‍ය විට දී, සෑම විට ම රාජකාරියේ යෙදී සිටින ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහු විසින්, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ඕනෑම ස්ථානයක දී මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ඔහු වෙත පවරා ඇති කාර්ය හෝ කර්තව්‍ය කරනු ලැබිය හැකි ය; එවැනි බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

ඇප

**149.** (1) මේ පනත යටතේ වරදක් සිදු කිරීම සම්බන්ධව සැලකිල්ලට භාජනය වන බවට හෝ වරදක් සිදු කොට ඇති බව සැකකරනු ලබන හෝ චෝදනා කරනු ලැබ සිටින යම් තැනැත්තකු ඒ සඳහා අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පෙනී සිටින ඉදිරියට ගෙන එනු ලබන, ඉදිරිපත් කරන හෝ භාරවන අවස්ථාවේ දී, නඩු විභාගය අවසන් වන තුරු මහෙස්ත්‍රාවරයා විසින් එකී තැනැත්තා රිමාන්ඩ් භාරයේ තබනු ලැබිය යුතු යː

එසේ වුව ද, මහෙස්ත්‍රාත්වරයා විසින්, විශේෂ අවස්ථාගත කාරණාවල දී සහ හේතු වාර්තා කර නඩු විභාගය අවසන් වීමට පෙරාතුව ඕනෑම වේලාවක දී එකී තැනැත්තා ඇප මත නිදහස් කරනු ලැබිය හැකිය.

(2) ඉහතින් වූ උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එකී උපවගන්තිය යටතේ වන යම් නඩු කටයුත්තක දී, අත් අඩංගුවේ සිටින තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමට කොමිෂන්

සභාව යෝජනා නොකරන බව කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත දන්වනු ලැබූ අවස්ථාවක, එකී තැනැත්තා වහාම නිදහස් කරනු ලැබිය යුතු ය.

**150.** (1) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ තැනැත්තකු වෙත නියම කරනු ලැබිය යුතු බන්ධනාගාරගත කිරීමේ කාලය නිශ්චය කිරීමේ දී, මේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන සාධක වැඩි කළ බන්ධනාගාරගත කිරීමේ කාලයක් නියම කිරීම සඳහා බලය දෙන දැඩි දඬුවම් පැමිණවීමේ සාධක ලෙස සැලකිල්ලට ගනු ලැබිය යුතු ය: -

දණ්ඩන නියම කිරීම සඳහා වන මාර්ගෝපදේශ

(අ) වරද සිදු කිරීම මගින් ප්‍රජාව කෙරෙහි අහිතකර බලපෑමක් සිදුව ඇත් ද යන්න;

(ආ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට සහ මහජනතාවට යම් මූල්‍යමය හෝ ද්‍රව්‍යමය පාඩුවක් සිදුවූයේ ද යන්න;

(ඇ) සිදු වූ හානිය හානිපූරණය කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා යම් මූල්‍යමය සම්පත් සහ වෙනත් සම්පත් අවශ්‍ය ද යන්න; සහ

(ඈ) වරද සිදු කිරීම අහිතකර ලෙස බලපා ඇත් ද යන්න.

(2) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ තැනැත්තකු වෙත නියම කරනු ලැබිය යුතු බන්ධනාගාරගත කිරීමේ කාලය නිශ්චය කිරීමේ දී, මේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන සාධක අඩු කළ බන්ධනාගාරගත කිරීමේ කාලයක් නියම කිරීම සඳහා බලය දෙන ලුහුයන සාධක ලෙස සැලකිල්ලට ගනු ලැබිය යුතු යː-

(අ) පසුතැවිල්ල ප්‍රකාශ කිරීම;

(ආ) රඳවා තබා ගැනීම හෝ රිමාන්ඩ් බන්ධනාගාරය තුළ ගත කළ කාලය;

(ඈ) ප්‍රරෝධනය හෝ සංත්‍රාසනය යටතේ වරද සිදු කර තිබීම;

(ඇ) චූදිතයා විසින් වරදේ වින්දිතයන්හට ස්වේච්ඡාවෙන් ම හානිපූරණය කිරීම; හෝ

(ඉ) චූදිතයා වරදකරු කරනු ලැබුවේ යම් වැරදි සම්බන්ධයෙන් ද, එම වැරදි ප්‍රසිද්ධියේ අභිශාප කිරීම.

**ඇතැම් වගන්ති කඩ කිරීම සම්බන්ධයෙන් වන සිවිල් වගකීම**

151. (1) මේ පනතේ විධිවිධාන කඩ කර ඇති වෙනත් යම් තැනැත්තකුගේ හැසිරීම හේතුවෙන් හෝ එම තැනැත්තාගේ හැසිරීම මත විශ්වාසය තබා කටයුතු කිරීම මගින් පාඩුවක් හෝ හානියක් විඳිනු ලබන තැනැත්තකු විසින්, එකී අනෙක් තැනැත්තා එම කඩ කිරීම සම්බන්ධයෙන් වන වරදකට චෝදනා ලැබ තිබුණ ද, නොතිබුණ ද නැතහොත් අපරාධ නඩු කටයුත්තක දී කඩ කිරීමක් සිදුව ඇති බව ඔප්පු වී තිබුණ ද, නොතිබුණ ද, එකී අනෙක් තැනැත්තාට විරුද්ධව සිවිල් නඩුවක් පැවරීම මගින් එකී පාඩුව හෝ හානියට අදාළ මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා එම තැනැත්තාට ඇති අයිතිවාසිකම්වලට මේ පනතේ සඳහන් කිසිවකින් බලපෑමක් වන බවට තේරුම් ගනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කිසිවක් මගින් කඩ කිරීමක් සංස්ථාපනය වන හැසිරීම සම්බන්ධයෙන් වෙනත් යම් නීතියක් යටතේ වන වගකීමට බලපෑමක් වන ලෙස තේරුම් ගනු නොලැබිය යුතු ය.

**නිදහස් කිරීම**

**152.** (1) කොමිෂන් සභාව යම් තීරු බද්දක්, අය බද්දක්, වරිපනම්, අය කිරීමක්, ගාස්තුවක් හෝ බද්දක් ගෙවීමෙන් නිදහස් විය යුතු ය.

(2) කොමිෂන් සභාව අර්ථලාභියකු වන්නේ කොමිෂන් සභාව විසින් අත්සන් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද යම් ලේඛනයක් යටතේ ද එවැනි යම් ලේඛනයක් සඳහා කිසිම ලියාපදිංචි ගාස්තුවක් ගෙවනු නොලැබිය යුතු ය.

(3) අධිකරණය විසින්, නඩු වාර්තා සහ ජර්නල් සටහන්වල සහතික කළ පිටපත් කොමිෂන් සභාව වෙත නොමිලේ නිකුත් කරනු ලැබිය යුතු ය.

අධිකරණ බලය

153. (1) මේ පනතේ විධිවිධාන-

(අ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත මේ පනත යටතේ වන වරදක් සිදු කරනු ලබන, ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකු;

(ආ) මේ පනත යටතේ වන වරදක්-

(i) සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් හෝ ශ්‍රී ලංකාව තුළ;

(ii) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය තුළ හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයෙන් එපිට;

(iii) ශ්‍රී ලංකාවේ ගුවන් අවකාශය තුළ;

(iv) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට අයත් නැතහොත් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් භාවිත කරනු ලබන ගුවන් යානයක හෝ යාත්‍රාවක නෞකාස්ථව හෝ එවැනි ගුවන් යානයක් හෝ යාත්‍රාවක් සම්බන්ධයෙන්;

(v) 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධානවලට යටත්ව සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් හෝ ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලයක කාර්යාල පරිශ්‍රය තුළ හෝ ශ්‍රී ලංකාවේ කොන්සල් ස්ථානයක් හෝ කාර්යාලයක් තුළ හෝ එම රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලයේ හෝ කොන්සල් ස්ථානයේ ප්‍රධානියාගේ නිවස තුළ හෝ යම් රාජ්‍ය තාන්ත්‍රික හෝ කොන්සල් නිලධරයකුගේ හෝ එම දූත මණ්ඩලයේ හෝ ස්ථානයේ වෙනත් යම් සේවානියුක්තයකුගේ නිවස තුළ; හෝ

(vi) සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක

ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි කාර්යාල පරිශ්‍රය තුළ හෝ එම ව්‍යවස්ථාපිත මණ්ඩලයේ සේවානියුක්තයකුගේ නිවස තුළ,

සිදු කරන යම් තැනැත්තකු; හෝ

(ඇ) මේ පනත යටතේ වන වරදක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත-

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු; හෝ

(ii) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් හිමිකාරත්වය දරනු ලබන යම් වත්කමක්,

සම්බන්ධයෙන් සිදු කරන යම් තැනැත්තකු,

සඳහා අදාළ විය යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකු විදේශීය රාජ්‍යයක ඔහුගේ රාජ්‍යතාන්ත්‍රික තත්ත්වය හේතුවෙන් එකී රාජ්‍යය විසින් ප්‍රදානය කරන ලද රාජ්‍ය තාන්ත්‍රික මුක්තියක් එම ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් භුක්ති විඳිනු ලැබුව ද නොලැබුව ද, එකී පුරවැසියා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද්දා වූ ද, ඔහු වරදකරු වන්නා වූ ද, මේ පනත යටතේ වන සෑම වරදක් සඳහා ම මේ පනත යටතේ දඬුවම් ලැබීමට යටත් විය යුතු ය; අන්‍යාකාරයෙන් නොවිය යුතු ය.

(3) යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් එම ක්‍රියාව කරනු ලැබූ හෝ නොකර හැරීම සිදු වූ රටේ නීති යටතේ ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියකුගේ වගකීමට බලපාන පරිදි මේ වගන්තියේ කිසිවක් අර්ථ විග්‍රහ නොකළ යුතු ය.

**154.** (1) 1977 අංක 8 දරන උද්ඝපන පනත, එහි උපලේඛනයෙහි (ආ) කොටසට පෙරාතුව ම දැක්වෙන අයිතමයන්ගෙන් .................. උද්ඝපනය

අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"( ) 2023 අංක ............ දරන දූෂණ විරෝධී පනතින් ආවරණය වන වරදක්;".

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් යම් රාජ්‍යයක් සමඟ සකස් කරන ලද උද්ර්පන වැඩපිළිවෙළක් බලාත්මකව පවතින අවස්ථාවක දී, 1977 අංක 8 දරන උද්ර්පන පනතේ කාර්ය සඳහා, එම වැඩපිළිවෙළ මගින් මේ පනතේ වන වැරදි සම්බන්ධයෙන් උද්ර්පනය පිළිබඳ විධිවිධාන ඇතුළත් වන බවට සලකනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් යම් රාජ්‍යයක් සමඟ සකස් කරන ලද කිසිදු උද්ර්පන වැඩපිළිවෙළක් නොමැති අවස්ථාවක දී 1977 අංක 8 දරන උද්ර්පන පනතේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයන් මගින්, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCAC), මේ පනතේ නිශ්චිතව දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් උද්ර්පනය පිළිබඳ විධිවිධාන සලසමින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් එම රාජ්‍යය සමඟ සකස් කරන ලද උද්ර්පන වැඩපිළිවෙළක් ලෙස සලකනු ලැබිය හැකි ය.

(4) මේ පනත යටතේ යම් වරදකට චෝදනා ලැබූ හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු උද්ර්පනය කිරීම සඳහා වෙනත් රාජ්‍යයක ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන්, එම තැනැත්තාට එරෙහිව නඩු පැවරීම හෝ උද්ර්පනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගෙන ඇති හෝ ගැනීමට යෝජනා කරන පියවර සම්බන්ධයෙන් එසේ ඉල්ලීමක් ඉදිරිපත් කරන රාජ්‍යයේ ආණ්ඩුවට වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

අන්‍යෝන්‍ය නෛතික සහයෝගීතාව

**155.** මේ පනත යටතේ යම් වරදක් පිළිබඳ විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට අවශ්‍ය ඕනෑම අවස්ථාවක සහ 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ වන කුමන හෝ පරමාර්ථයක් සඳහා, එම පනතේ

විධිවිධාන, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ ඉහත කී පනත යටතේ නම් කරන ලද වෙනත් රාජ්‍යයන් අතර ඇති පරිදි සහයෝගීතාව ලබාදීම සම්බන්ධයෙන් අදාළ වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

**නියෝග**

**156.** (1) මේ පනතින් නියම කරනු ලබන ලෙස නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය දෙන ලද කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය පළ කරනු ලබන දින සිට හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක් තුළ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ යටතේ කලින් සිදුකරන ලද කිසිවකට අගති විරහිතව එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**රීති සෑකසීම සඳහා කොමිෂන් සභාවට ඇති බලතල**

**157.** (1) කොමිෂන් සභාව විසින් රීති සෑදීම සඳහා මේ පනත මගින් බලය පවරන ලද හෝ අවශ්‍ය කරන සියලු ම හෝ යම් කාරණයක් සඳහා සම්බන්ධයෙන් නීති සම්පාදනය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු බලාත්මක විය යුතු ය.

**මුදල් වර්ෂය**

**158.** (1) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය, එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවැනි දිනෙන් ආරම්භ වන මාස දොළහක කාල සීමාවක් විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ කොමිෂන් සභාවේ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයෙහි සඳහන් කොමිෂන් සභාවල ගිණුම් විගණනයට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, කොමිෂන් සභාවේ ගිණුම් විගණනය සඳහා අදාළ විය යුතු ය.

වාර්තා

**159.** (1) කොමිෂන් සභාව විසින්, අවශ්‍ය යැයි සැලකෙන සෑම විටම එහි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තා පිළියෙල කළ යුතු අතර, සෑම ලිත් වර්ෂයක ම අවම වශයෙන් එක් වාර්තාවක්වත් පිළියෙල කළ යුතු ය.

(2) කොමිෂන් සභාව, සෑම ලිත් වර්ෂයක ම කාර්තුමය ලෙස සිය කාර්ය සාධන ඇගයීම් වාර්තා පිළියෙල කළ යුතු ය.

(3) කොමිෂන් සභාව විසින්, එසේ සකසන ලද සෑම වාර්තාවක් ම එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ඉඩ සලසනු ලැබිය යුතු ජනාධිපතිවරයා වෙත යැවීමට කටයුතු කළ යුතුය.

(4) පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද කොමිෂන් සභා වාර්තා, කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා ජනතාවට ලබා දිය යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව අදාළ වීම

**160.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාවෙන් අභියාචනාධිකරණය වෙත පැවරී ඇති අධිකරණ බලය, යම් සහනයක් අපේක්ෂාවෙන් කොමිෂන් සභාවට එරෙහිව යොමු කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් නොව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ යම් විමර්ශනයක් පැවැත්වීම ආරම්භ කිරීමෙන් හෝ පවත්වාගෙන යාමෙන් හෝ මේ පනතින් කොමිෂන් සභාව වෙත පවරන ලද බලතල අතුරින් කුමන හෝ බලතලයක් ක්‍රියාත්මක කිරීමෙන් හෝ මේ පනත යටතේ යම් විධානයක් දීමෙන් කොමිෂන් සභාව වළක්වන්නා වූ හෝ අත්හිටුවන්නා වූ, හෝ වැළැක්වීමේ හෝ අත්හිටුවීමේ බලපෑම ඇත්තා වූ කිසිදු ඉන්ජන්ෂන් තහනමක් හෝ වාරණ නියෝගයක් හෝ යම් අධිකරණයක් විසින් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

**මේ පනතේ විධිවිධාන අනෙක් නීති අභිබවා බලපැවැත්වීම**

**161.** මේ පනතේ විධිවිධාන වෙනත් යම් ලිඛිත නීතියක් සමඟ ඝට්ටනය වන හෝ අනනුකූලවන අවස්ථාවේ දී මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

**අර්ථ නිරූපණය**

**162.** (1) මේ පනතේ කාර්යය සඳහා,-

(අ) යම් තැනැත්තකු විසින් හෝ ඔහුගේ නමින් හෝ වෙනත් යම් තැනැත්තකුගේ භාරයක් ලෙස හෝ යහපත සඳහා හෝ දරනු ලබන දේපළ, එකී වෙනත් තැනැත්තාට වක්‍රකාරයෙන් අයිති වන බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) මේ පනතේ ආඥාවට සඳහා යෙදී ඇති සෑම සඳහනක් ම, පළාත් පාලන ආයතනයකට සහ සෑම උපලේඛනගත ආයතනයකට කරනු ලබන සඳහනක් ඇතුළත් වන පරිද්දෙන් තේරුම් ගනු ලැබිය යුතු ය.

(2) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"සේවානියුක්තියේ අහිතකර තත්ත්වයන්" යන්නට, එකට වැඩ කරන්නන් විසින් සිදු කරනු ලබන හිරිහැරකිරීම් ඇතුළත් වේ. එය සේවායෝජකයා විසින් කරන ලදැයි සලකනු ලැබේ. සේවායෝජකයාගේ අනුදැනුම හෝ අනුමතය ඇතිව එම ක්‍රියාව සිදු කරනු ලැබුවේ ද යන වග අදාළ නොවේ;

"අල්ලස" යන්නෙන්, මේ පනතේ III වන කොටසේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරමින් යම් තුටු පඬුරක් පිරිනැමීම, අයදීම හෝ භාරගැනීම අදහස් වේ;

"ළමයා" යන්නට, සුළු දරුවකු හෝ (61 වන අධිකාරය වූ) ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත යටතේ දරුකමට හදා ගැනීමට ගත් ළමයකු ඇතුළත් වේ;

"පළාත් පාලන කොමසාරිස්වරයා" යන්නට, යම් පළාත් පාලන නියෝජ්‍ය කොමසාරිස්වරයකු සහ යම් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයකු ඇතුළත් වේ;

"පැමිණිල්ල" යන්නෙන්, මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට අදාළව කොමිෂන් සභාව වෙත ඉලෙක්ට්‍රොනික මාධ්‍යය හරහා හෝ අන්‍යාකාරයකින් දැනුම් දෙන්නා විසින් සිය අනන්‍යතාව එහි හෙළිදරව් කරමින් ලබන්නා වූ ප්‍රකාශයක් ඇතුළත් යම් ලිඛිත හෝ වාචික දැනුම්දීමක් අදහස් වේ. 42 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ඇ) හෝ (ඈ) ඡේදවල සඳහන් මාධ්‍ය හරහා කොමිෂන් සභාවේ අවධානයට ලක් වන යම් කරුණක් ඊට ඇතුළත් නොවන්නේ ය;

"ලේඛන" යන්නට, ඕනෑම ආකාරයකින් වාර්තාගත කර ඇති තොරතුරු ඇතුළත් වන අතර කියවිය හැකි ආකාරයෙන් නොව වෙනත් ආකාරයකින් වාර්තා කර ඇති තොරතුරුවලට අදාළව ඒවා ඉදිරිපත් කිරීමට අදාළ සඳහන් කිරීම් යන්නට කියවිය හැකි ආකාරයෙන් තොරතුරුවල පිටපතක් ඉදිරිපත් කිරීම පිළිබඳ සඳහන් කිරීම් ඇතුළත් වේ;

"ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික, චුම්භක, දෘෂ්ටික හෝ ඒ හා සමාන වෙනත් ක්‍රමයක් මගින් උත්පාදනය කළ දත්ත පණිවිඩයක් මගින් ඉදිරිපත් කරන ලද යම් දැනුම්දීමක් අදහස් වේ;

"විධායක" යන වචනය වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් යොදාගනු ලබන විට, ඊට (138 වන අධිකාරය වූ) වෘත්තීය සමිති ආඥාපනතේ දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"විදේශ රජයේ සේවකයා" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත රටකට හෝ දේශයකට (හෝ එම රටේ හෝ දේශයේ යම් උපකොට්ඨාසයකට) පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ කවර හෝ වර්ගයක ව්‍යවස්ථාදායක, පරිපාලනමය හෝ අධිකරණමය තනතුරක් දරන පුද්ගලයකු;

(ආ) (i) ශ්‍රී ලංකාවෙන් පිටත රටක හෝ දේශයක හෝ එම රටේ හෝ දේශයේ යම් උපකොට්ඨාසයක හෝ ඒ වෙනුවෙන්; හෝ

(ii) එම රටේ හෝ දේශයේ හෝ උපකොට්ඨාසයේ යම් රජයේ නියෝජ්‍යායතනයක හෝ රාජ්‍ය ව්‍යවසායක, රජයේ කර්තව්‍යයක් ඉටුකරන තනි පුද්ගලයකු; හෝ

(ඇ) පොදු ජාත්‍යන්තර සංවිධානයක නිලධරයකු හෝ අනුයෝජිතයකු,

අදහස් වේ;

"ආණ්ඩුව" යන්නට, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය ඇතුළත් වේ;

"තුටු පඬුර" යන්නට-

(අ) මුදල් හෝ යම් තෑග්ගක්, ණයක්, ගාස්තුවක්, පාරිතෝෂිකයක්, කොමිස් මුදලක්, වටිනා ඇපයක් නැතහොත් කවර හෝ විස්තරයකට අයත් චංචල හෝ නිශ්චල වෙනත් දේපළක් හෝ දේපළක සම්බන්ධතාවක්;

(ආ) යම් ධුරයක්, රැකියාවක් හෝ කොන්ත්‍රාත්තුවක්;

(ඇ) යම් ණයක, බැඳීමක හෝ වෙනත් කවර හෝ බැරකමක සම්පූර්ණ හෝ කොටස් වශයෙන් වූ යම් ගෙවීමක්, මිදීමක්, නිදහස් කිරීමක් හෝ ඇවර කිරීමක්;

(ඈ) ලිංගික අනුග්‍රහයක්;

(ඉ) එවකටත් ආරම්භ කර තිබුණ ද, නොතිබුණ ද, විනය සම්බන්ධ හෝ දණ්ඩනමය ස්වභාවයකින් යුතු නඩුවකින් හෝ නඩු කටයුතුවලින් පමුණුවා ඇති හෝ පැමිණවිය හැකි යම් දණ්ඩනයකින් හෝ අශක්නුතාවකින් ආරක්ෂා වීම ද සහ යම් අයිතිවාසිකමක් හෝ යම් නිල බලයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීමෙන් වැළකී සිටීම ද ඇතුළුව, කවර හෝ විස්තරයකට අයත් වෙනත් යම් සේවයක්, උපකාරයක් හෝ වාසියක්; සහ

(ඊ) ඉහතින් වූ (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඉ) ඡේදයන්හි අර්ථානුකූල වූ යම් තුටු පඬුරක් පිරිනැමීම, දීමට බැඳීම හෝ පොරොන්දු වීම,

ඇතුළත් වේ;

"අධිඅවදානම් කාණ්ඩ" යන්නෙන්, නියෝග මගින් අධිඅවදානම් යැයි නියම කරනු ලබන කාණ්ඩ අදහස් වේ;

42 වන සහ 43 වන වගන්තිවල කාර්ය සඳහා "තොරතුරු" යන්නෙන්, 42 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) සහ (ඈ) ඡේදවල විධිවිධාන යටතේ ලබන්නා වූ පැමිණිල්ලක් සහ යම් දෙයක් හැර වෙනත් ඕනෑම දෙයක් අදහස් වන අතර අනෙකුත් සියලු ම අවස්ථාවන්හි දී " තොරතුරු" යන්න එහි සාමාන්‍ය අර්ථය දරයි;

"දැනුම් දෙන්නා" යන්නට, ආයතනික අකටයුතුකම් දැනුම් දෙන්නකු ඇතුළත් වේ;

"අධිකරණ නිලධරයා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ලැයිස්තුගත සමාගම" යන්නට, 2007 අංක 07 දරන සමාගම් පනතින් ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එකී යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන, කරන සහ ඉටුකරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන සහ 45 වන ව්‍යවස්ථා යටතේ අධිකරණ විෂයයභාර අමාත්‍යවරයා අදහස් වේ;

"පෞද්ගලික නොවන සාම්පලය" යන්නෙන්-

(අ) හිසකෙස්වල සාම්පලයක්;

(ආ) නියපොත්තකින් හෝ නියපොත්තක් යටින් ගනු ලබන සාම්පලයක්;

(ඇ) යම් තැනැත්තකුගේ රහස් ප්‍රදේශයෙන් හැර ශරීරයේ වෙනත් ඕනෑම ස්ථානයකින් හෝ මුඛයෙන් ගනු ලබන, එහෙත් වෙනත් යම් ශරීර විවරයකින් ගනු නොලබන සාම්පලයක්;

(ඈ) ඛේටය;

(ඉ) (i) රහස් ප්‍රදේශයේ සලකුණක්;

(ii) මුහුණේ සලකුණක්; හෝ

(iii) අනන්‍යතාව තහවුරු කරන තොරතුරු,

හැර යම් තැනැත්තකුගේ ශරීරයේ ඕනෑම කොටසක සලකුණක්;

යම් තැනැත්තකුගේ ශරීරයේ "රහස් ප්‍රදේශය" යන්නෙන්, ප්‍රජනක හෝ ගුද ප්‍රදේශය අදහස් වන අතර කාන්තාවකගේ නම් පියයුරු ද ඊට ඇතුළත් වේ;

"අනන්‍යතාව තහවුරු කරන තොරතුරු" යන්නට, යම් තැනැත්තකුගේ ඡායාරූප, ඇඟිලි සලකුණු, අත්ලෙහි සලකුණු, යටිපතුලෙහි සලකුණු, පාදයේ ඇඟිලි සලකුණු සහ උස හා බර පිළිබඳ මිනුම් ඇතුළත් වේ;

පිළිගත් දේශපාලන පක්ෂයකට අදාළව, "තනතුරු දරන්නන්" යන්නෙන්, එම පිළිගත් දේශපාලන පක්ෂයේ සභාපතිවරයා, උපසභාපතිවරයා, ලේකම්වරයා හෝ විධායක කමිටුවේ සාමාජිකයකු සහ එකී දේශපාලන පක්ෂයට අදාළව විධාන දීමට නිසි ලෙස බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු

අදහස් වන අතර, ඊට අනුශාසකයා, සභාපතිවරයා, උපදේශකයා වශයෙන් හෝ වෙනත් කුමන හෝ ආකාරයකින් නම් කරන ලද එම දේශපාලන පක්ෂයේ නායකයා ඇතුළත් වේ;

"තැනැත්තා" යන්නට, සාමාන්‍ය හා නෛතික තැනැත්තන් යන දෙවර්ගය ම ඇතුළත් වේ;

මේ පනතේ කාර්ය සඳහා, "කොමිෂන් සභාවට සහාය වන තැනැත්තා" යන්නෙන්, කුමන හෝ ආකාරයකින් කොමිෂන් සභාවට සහාය දක්වන යම් තැනැත්තකු අදහස් වේ;

"නියම කරන ලද" යන්නෙන්, නියෝග මගින් නියම කිරීම අදහස් වේ;

"පෞද්ගලික අංශයේ ආස්ථිත්‍යය" යන්නෙන්, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ 5 වන වගන්තියේ අර්ථ දක්වා ඇති පරිදි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායක් අදහස් වේ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ වන පරිච්ඡේදය මගින් පිහිටුවනු ලැබූ පළාත් සභාවක් අදහස් වේ;

"පොදු අධිකාරිය" යන්නට, රජයේ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු, පළාත් සභා හෝ පළාත් පාලන ආයතන ඇතුළත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 2007 අංක 07 දරන සමාගම් පනත හැර, වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවනු ලැබුවා වූ හෝ ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු ප්‍රාග්ධනය ම හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වන අතර, ඊට මේ පනත යටතේ වන සියලු උපලේඛනගත ආයතන ඇතුළත් වේ;

"පොදු ජාත්‍යන්තර සංවිධාන" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත රටවල හෝ දේශවල;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත රටවල හෝ දේශවල ආණ්ඩුවල; සහ

(ඇ) ඉහත කුමන හෝ ස්ථාන එකතුවක,

සාමාජිකයන් සිටින සංවිධානයක් අදහස් වේ;

"රජයේ නිලධරයා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"රජයේ සේවකයා" යන්නට, අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍යවරයකු, කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා, කාරක සභාවක සභාපතිවරයා, කාරක සභාවක නියෝජ්‍ය සභාපතිවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයකු, පළාතක ආණ්ඩුකාරවරයකු, පළාත් සභාවක අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු, මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු හෝ යුක්තිය පසිඳලීම සඳහා හෝ යම් කම්කරු හෝ වෙනත් ආරාවුලක් විනිශ්චය කිරීම සඳහා හෝ ඇතිකොට පිහිටුවන ලද වෙනත් යම් මුල් අවස්ථා අධිකරණයක, විනිශ්චය අධිකාරයක හෝ ආයතනයක විනිශ්චයකාරවරයකු, මූලසුන දරන නිලධරයා, හෝ සාමාජිකයකු, රජයේ සෑම නිලධරයකු ම, සේවකයකු ම හෝ සේවානියුක්තයකු ම හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවා ඇති යම් ස්වාධීන කොමිෂන් සභාවකට යම් සභාපතිවරයකු, සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ සේවානියුක්තකයකු හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පත් කරනු ලැබූ වෙනත් යම් තානාපති නියෝජිතයකු හෝ වෙනත් යම් නීතියක් යටතේ පිහිටුවනු ලැබූ කොමිෂන්

සභාවක යම් සභාපතිවරයකු, සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ සේවානියුක්තයකු හෝ පාරිශ්‍රමිකයන් ලැබුව ද නොලැබුව ද පළාත් සභාවක, පළාත් පාලන ආයතනයක හෝ උපලේඛනගත ආයතනයක හෝ එහි කොටස්වලින් සියයට විසිපහකට වැඩි ප්‍රමාණයක් ආණ්ඩුව විසින් දරනු ලබන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක යම් සභාපතිවරයකු, අධ්‍යක්ෂවරයකු, අධිපතිවරයකු, සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ සේවානියුක්තයකු හෝ පළාත් රාජ්‍ය සේවයේ සාමාජිකයකු, සෑම ජූරි සභියකු ම, සෑම බලයලත් මිනින්දෝරුවරයකු ම සහ යම් අධිකරණයක් විසින් හෝ රජයේ වෙනත් යම් නිසි බලධරයකු විසින් යම් කටයුත්තක් හෝ කාරණයක් තීරණය කිරීම හෝ වාර්තා කිරීම පිණිස යොමුකර ඇති සෑම බේරුම්කරුවකු ම හෝ වෙනත් තැනැත්තකු ද ඇතුළත් වේ:

එසේ වුව ද, යම් පළාත් පාලන ආයතනයක් විසුරුවා හැර ඇති හා ඒ ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම යම් තැනැත්තකු වෙත පැවරී ඇති අවස්ථාවක, ඒ ආයතනය විසුරුවා හැරීමට පෙරාතුව ම සේවයෙහි නියුක්තව සිටියා වූ සහ එය විසුරුවා හැරීමෙන් පසුව තවදුරටත් සේවයෙහි නියුක්තව සිටින්නා වූ ඒ පළාත් පාලන ආයතනයේ සෑම සේවානියුක්තයකු ම මේ පනතේ කාර්යය සඳහා රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය;

"ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නෙන්, (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා අදහස් වේ;

"හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නෙන්, 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා අදහස් වේ;

"උපලේඛනගත ආයතනය" යන්නෙන්, පොදු අධිකාරයක් හෝ රජයේ සංස්ථාවක් හෝ අදහස් වන අතර, ඊට-

(අ) එවැනි යම් රජයේ අධිකාරයක් හෝ පොදු සංස්ථාවක්; හෝ

(ආ) එවැනි එකකට වඩා වැඩි පොදු අධිකාර හෝ සංස්ථා හෝ

සමස්තයක් ලෙස සියයට විසි පහකට නොඅඩු කොටස් දරන්නා වූ, යම් පෞද්ගලික ආස්ථිත්වයක් හෝ මණ්ඩලයක් ද ඇතුළත් වේ;

"ලිංගික අනුග්‍රහය" යන්නෙන්,

(අ) ලිංගික සංසර්ගය; හෝ

(ආ) ලිංගික සංසර්ගය ලෙස සලකනු නොලබන එහෙත් ලිංගික ස්වභාවයක කායික, වාචික හෝ අවාචික හැසිරීමක් ලෙස සලකනු ලබන හෝ එවැනි හැසිරීමකින් යුක්ත වන යම් ක්‍රියාවක්,

අදහස් වේ;

"ක්‍රීඩා ඉසව්ව" යන්නෙන්, සාමාන්‍යයෙන් මහජනයා සහභාගී වන්නා වූ ද, යම් ක්‍රීඩා ඉසව්වක් පවත්වන ඕනෑම ක්‍රීඩා ආයතනයක පාලන ක්‍රමය, රීති හෝ චර්යා ධර්ම සංග්‍රහය ඇතුළත් වන රීති මගින් පාලනය වන්නා වූ ද හෝ යම් ක්‍රීඩා ඉසව්වක් පවත්වනු ලබනුයේ යම් නියාමන ආයතනයක පාලන ක්‍රමය, රීති හෝ චර්යා ධර්ම සංග්‍රහය යටතේ ද එකී පාලන ක්‍රමය, රීති හෝ චර්යා ධර්ම මගින් පාලනය වන්නා වූ ද, පුද්ගලයන් හෝ කණ්ඩායම් අතර සිදු කරන යම් ක්‍රීඩාවක යම් ඉසව්වක් හෝ තරඟයක් හෝ යම් සතකු තරඟ වදින ඉසව්වක් හෝ තරඟය අදහස් වේ;

"මාණ්ඩලික නිලධරයා" යන්නෙන්, 157 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු හැකි ආණ්ඩුවේ

හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක යම් සේවානියුක්තයකු හෝ රාජ්‍ය සංස්ථාවක යම් සේවානියුක්තයකු අදහස් වේ;

"වින්දිතයා" යන්නෙන්, මේ පනත යටතේ යම් වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් ලෙස කායික හෝ මානසික, චිත්තවේගී, ආර්ථික යන කුමන ආකාරයක හෝ පීඩාවකින්, හානියකින් හෝ වෙනත් පාඩුවකින් පීඩා විඳ ඇති තැනැත්තකු අදහස් වේ;

"ආයතනික අකටයුතුකම් දැනුම් දෙන්නා" යන්නට, යම් ආයතනික අකටයුතුකම් දැනුම් දෙන්නකුට සහාය දක්වන තැනැත්තන්, එම ආයතනික අකටයුතුකම් දැනුම් දෙන්නාට උපස්ථම්භක තොරතුරු සපයන තැනැත්තන්, එම ආයතනික අකටයුතුකම් දැනුම් දෙන්නාගේ පවුලේ සාමාජිකයකු හෝ යැපෙන්නකු හෝ එම ආයතනික අකටයුතුකම් දැනුම් දෙන්නාට සුවිශේෂී වැදගත්කමක් ඇති වෙනත් යම් තැනැත්තකු ඇතුළත් වේ;

75 වන වගන්තියේ කාර්ය සඳහා "සාක්ෂිකරු" යන්නෙන්-

(අ) යම් නීතිය බලාත්මක කිරීමේ නිලධරයකුට තොරතුරු සපයන ලද හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති යම් තැනැත්තකු හෝ එකී තොරතුරු හෝ පැමිණිල්ල මූලික කොටගෙන මේ පනත යටතේ කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් ආරම්භ කළ හැකි හෝ ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට ඉඩ ඇති යම් තැනැත්තකු;

(ආ) මේ පනත යටතේ කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් හෝ නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් විසින් හෝ විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පවත්වන අතරතුර, යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කරනු ලැබුවේ යම් කාරණා සම්බන්ධයෙන් ද එම කාරණා පිළිබඳ විස්තරයක් ඇතුළත් ප්‍රකාශයක් කර ඇති හෝ තොරතුරු සපයා ඇති යම් තැනැත්තකු;

(ඇ) කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් හෝ පවරන ලද යම් නඩු කටයුත්තක් සනාථ කිරීම සඳහා දිව්රුම් ප්‍රකාශයක් සපයන ලද හෝ ප්‍රකාශයක් කරන ලද යම් තැනැත්තකු;

(ඈ) කොමිෂන් සභාව වෙත තොරතුරු හෝ යම් දැනුම්දීමක් සපයන ලද යම් තැනැත්තකු;

(ඉ) යම් තැනැත්තකු විසින් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් හෝ කොමිෂන් සභාව වෙත සපයන ලද තොරතුරක් හෝ කරන ලද ප්‍රකාශයක් මූලික කොටගෙන, වෙනත් තැනැත්තකුට එරෙහිව අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුතුවල යම් ප්‍රකාශයක් කිරීමට හෝ වාචික සාක්ෂි දීමට අධිකරණයක් හෝ කොමිෂන් සභාව විසින් ඔහුව කැඳවිය යුතු යැයි විශ්වාස කිරීමට තරම් යුක්ති සහගත හේතු ඇති යම් තැනැත්තකු;

(ඊ) යම් අධිකරණයක් හෝ කොමිෂන් සභාව ඉදිරිපිට යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී ප්‍රකාශයක් කිරීමට, වාචික සාක්ෂි දීමට හෝ යම් ලේඛනයක්, වාර්තාවක් හෝ දෙයක් සැපයීමට එම අධිකරණ හෝ කොමිෂන් සභාව විසින් සිතාසි ලැබී ඇති යම් තැනැත්තකු; හෝ

(උ) කරන ලදැයි කියනු ලබන වරදක් හෝ මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක් හෝ මානව අයිතිවාසිකමක් කඩකිරීමක් පිළිබඳව රජයේ නිලධරයකු ලෙස විමර්ශනය කර ඇති යම් තැනැත්තකු,

ඇතුළත් වන අතර, ඊට අපරාධයක වින්දිතයකු, ළමා සාක්ෂිකරුවකු, ළමා සාක්ෂිකරුවකුගේ දෙමාපියකු හෝ භාරකරුවකු, එම සාක්ෂිකරුගේ පවුලේ සාමාජිකයකු හෝ යැපෙන්නකු හෝ එම තැනැත්තාට සුවිශේෂී වැදගත්කමක් ඇති වෙනත් යම් තැනැත්තකු, ප්‍රවීණ සාක්ෂිකරුවකු, මේ පනත යටතේ කරන ලදැයි කියනු ලබන යම් වරදකට සැක කරනු ලැබූ හෝ චෝදනා ලැබූ තැනැත්තකු වෙනුවෙන්

අධිකරණයක් හෝ කොමිෂන් සභාව ඉදිරිපිට වාචික සාක්ෂි දීමට කැඳවනු ලැබූ තැනැත්තකු ඇතුළත් වේ; සහ

"ලිඛිත" යන්නට, ඉලෙක්ට්‍රොනිකව ජනනය කරනු ලබන ලේඛන ඇතුළත් වේ.

## V වන කොටස

## අන්තර්කාලීන විධිවිධාන හා ඉතිරිකිරීම්

ඉවත්කිරීම්, ඉතිරිකිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන

**163.** (1) (මෙහි මින් මතු "ඉවත් කළ පනත්" යනුවෙන් සඳහන් කරනු ලබන)

(අ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත; සහ

(ඇ) (26 වන අධිකාරය වූ) අල්ලස් පනත,

මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත ඉවත් කිරීම නොතකා-

(අ) 1994 අංක 19 දරන පනත යටතේ පිහිටුවනු ලැබූ සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින ක්‍රියාත්මක වන්නා වූ කොමිෂන් සභාව, මේ පනතේ 1 වන කොටස යටතේ අලුත් කොමිෂන් සභාවක් පිහිටුවනු ලබන තෙක් මේ පනතේ කාර්ය සඳහා කොමිෂන් සභාව ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම ධුර දරන සාමාජිකයන්, මේ පනත යටතේ පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර නව සාමාජිකයන් පත් කරන තෙක් ධුර දැරීම අඛණ්ඩව සිදු කළ යුතු ය;

(ආ) ඉවත් කළ පනත් යටතේ සාදනු ලැබූ සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින සහ මේ පනතේ විධිවිධානවලට අනනුකූලතාවක් නොදක්වන සියලු නියෝග සහ රීති, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියෝග සහ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, වලංගු ලෙස අඛණ්ඩව පැවතිය යුතු ය;

(ඇ) ඉවත් කළ පනත් යටතේ සාදනු ලැබූ සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින සියලු කොන්ත්‍රාත්තු, ගිවිසුම් සහ වෙනත් සාධන පත්‍ර, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ කොන්ත්‍රාත්තු, ගිවිසුම් සහ වෙනත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) 1994 අංක 19 දරන පනත යටතේ පිහිටුවනු ලැබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබූ සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී අවසන් නොවී පවතින සියලු නඩු, නඩු පැවරීම්, විමර්ශන සහ වෙනත් නීති කෘත්‍ය, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබූ නඩු, නඩු පැවරීම් සහ වෙනත් නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ පවරනු ලැබ අඛණ්ඩව විනිශ්චයට ගනු ලැබූ නඩු, නඩු පැවරීම් සහ වෙනත් නීති කෘත්‍ය වූවාක් සේ නියමිත දිනට පසු අඛණ්ඩව විනිශ්චයට ගනු ලැබිය යුතු ය;

(ඉ) 1994 අංක 19 දරන පනත යටතේ පිහිටුවනු ලැබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැවරී ඇති සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පවතින සියලු චංචල හා නිශ්චල දේපළ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභාව සතු විය යුතු ය;

(ඊ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ඉවත් කළ පනත්වල විධිවිධාන යටතේ සහ ඒ යටතේ සාදනු ලැබූ නියෝග හෝ රීති යටතේ වන සියලු කඩකිරීම් හෝ ආරම්භ කරන ලද නීති කෘත්‍ය, ඉවත් කළ පනත් යටතේ සිදු කරනු ලැබූ වැරදි හෝ ආරම්භ කරන ලද නීති කෘත්‍ය විය යුතු අතර, ඒ අනුව විභාගයට ගත යුතු ය;

(උ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව 1994 අංක 19 දරන පනත යටතේ පිහිටුවනු ලැබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අයිතිවාසිකම්, හිමිකම්, වත්කම්, වගකීම්, ණය සහ බැරකම් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලාත්මක වන පරිදි කොමිෂන් සභාවේ අයිතිවාසිකම්, හිමිකම්, වත්කම්, වගකීම්, ණය සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ඌ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ධුර දරන්නා වූ 1994 අංක 19 දරන පනත යටතේ පිහිටුවනු ලැබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සියලු නිලධරයන් සහ සේවකයන්, අදාළ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව, 1994 අංක 19 පනත යටතේ ඔවුන්ට හිමිව තිබූ රැකියා නියම හා කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන නියම යටතේ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලාත්මක වන පරිදි කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව විසින් ආරම්භ කර නියමිත දිනට පෙරාතුව වූ දිනයේ දී අවසන් නොවී පවතින, ඉවත් කළ පනත් යටතේ වන සියලු විමර්ශන මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ආරම්භ කරනු ලැබූ විමර්ශන ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒවා කොමිෂන් සභාවේ විධානයට අනුව ආරම්භ

කර අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබූ විමර්ශන වූවාක් සේ එකී සියලු විමර්ශන නියමිත දිනට පසු අඛණ්ඩව පවත්වනු ලැබිය හැකි ය. තව ද, විමර්ශන පවත්වන අතරතුර කොමිෂන් සභාව වෙත සපයනු ලැබූ සියලු ප්‍රකාශ සහ ලේඛන හෝ ඒවායෙහි සහතික කළ පිටපත්, මේ පනත යටතේ එම විමර්ශන පවත්වනු ලැබුවාක් සේ සහ නීති කෘත්‍ය පවරනු ලැබුවාක් සේ 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පවරනු ලැබූ නීති කෘත්‍යවල දී ආවේශ්‍ය විය යුතු ය.

(4) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත, (26 වන අධිකාරය වූ) අල්ලස් පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශන පනත ඉවත් කිරීම නොතකා-

(අ) වෙනත් යම් ලිඛිත නීතියක 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සම්බන්ධයෙන් වන සෑම සඳහනක් ම මේ පනතට කරනු ලබන සඳහනක් ලෙස තේරුම් ගත යුතු ය;

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක (26 වන අධිකාරය වූ) අල්ලස් පනත සම්බන්ධයෙන් වන සෑම සඳහනක් ම, මේ පනතේ ඇතුළත් අනුරූප විධිවිධාන පිළිබඳව වන සඳහනක් ලෙස තේරුම් ගත යුතු ය; සහ

(ඇ) වෙනත් යම් ලිඛිත නීතියක ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සම්බන්ධයෙන් වන සෑම සඳහනක් ම, මේ පනතට කරනු ලබන සඳහනක් ලෙස තේරුම් ගත යුතු ය.

**164.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

අ උපලේඛනය

[41 වන වගන්තිය]

| | | |
|---|---|---|
| 1. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 372 වන සහ 378 වන වගන්ති | - ත්‍රාසද්ග්‍රහණය; |
| 2. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 386 වන වගන්තිය- | - දේපළ සාපරාධී ලෙස ව්‍යපහරණය කිරීම; |
| 3. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 388 වන වගන්තිය | - සාපරාධී විශ්වාස භාරය කඩකිරීම; |
| 4. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 389 වන වගන්තිය | - සාපරාධී විශ්වාස භාරය කඩකිරීමට දඬුවම; |
| 5. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 390 වන වගන්තිය | - වාහකයකු ආදීන් විසින් සාපරාධී විශ්වාස භාරය කඩකිරීම; |
| 6. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 391 වන වගන්තිය | - ලිපිකරුවකු හෝ සේවකයකු විසින් සාපරාධී විශ්වාස භාරය කඩකිරීම; |
| 7. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 392 වන වගන්තිය | - රජයේ සේවකයකු විසින් හෝ බැංකුකරුවකු, වෙළෙන්දකු හෝ නියෝජිතයකු විසින් කරනු ලබන සාපරාධී විශ්වාස භාරය කඩකිරීම; |
| 8. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 392අ වගන්තිය | - මුදලක් හෝ මුදල් ශේෂයක් හෝ සම්බන්ධයෙන් රජයේ සේවකයකු විසින් සාපරාධී විශ්වාස භාරය කඩකිරීම; |

| | |
|---|---|
| 9. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 398 වන වගන්තියේ සිට 403 වන වගන්තිය දක්වා වන වගන්ති | - වංචා කිරීම; |
| 10. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 406 වන වගන්තිය | - ප්‍රතිෂ්ඨාව පිළිබඳ අසත්‍ය ප්‍රකාශයක් ඇතුළත් පැවරුම් ඔප්පුවක් වංක ලෙස හෝ වංචනික ලෙස ලියා අත්සන් කිරීම; |
| 11 (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 452 වන වගන්තිය | - කූට ලේඛන සෑදීම; |
| 12. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 453 වන වගන්තිය | - අසත්‍ය ලේඛනයක් සෑදීම; |
| 13. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 454 වන වගන්තිය | - කූට ලේඛන සෑදීම සඳහා දඬුවම; |
| 14. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 455 වන වගන්තිය | - අධිකරණයක වාර්තාවක් හෝ ආණ්ඩුවේ උප්පැන්න නාමලේඛනයක් ආදිය කූට ලෙස සෑදීම; |
| 15. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 457 වන වගන්තිය | - රැවටීමේ කාර්යය සඳහා කූට ලේඛන සෑදීම; |
| 16. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 458 වන වගන්තිය | - කූට ලෙස සාදනු ලැබූ ලේඛනයක්; |

| | | |
|---|---|---|
| 17. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 459 වන වගන්තිය | - කූට ලෙස සාදනු ලැබූ ලේඛනයක් නිර්ව්‍යාජ ලේඛනයක් ලෙස පාවිච්චි කිරීම; |
| 18. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 462 වන වගන්තිය- | - කූට ලෙස සාදනු ලැබූ බව දන්නා වාර්තාවක් හෝ අගනා සුරැකුම් පතක් හෝ අන්තිම කැමති පත්‍රයක් නිර්ව්‍යාජ ලේඛනයක් ලෙස පාවිච්චි කිරීමේ චේතනාවෙන් එය තම සන්තකයෙහි තබා ගැනීම; සහ |
| 19. | (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 467 වන වගන්තිය | - ගිණුම් වරදවා දැක්වීම. |

ආ උපලේඛනය

[41 වන වගන්තිය]

1. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය යටතේ වන යම් වරදක්;

2. 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත යටතේ වන යම් වරදක්; සහ

3. 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත යටතේ වන යම් වරදක්.